

# ඔබේ අනාගතය

HDFC BANK

*The Housing Bank...*

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

**වාර්ෂික වාර්තාව - 2012**

සංවර්ධනය වෙමින් පවතින රටවල විධිමත් නිවාස අවශ්‍යතාවය සපුරාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරදීම, වේගවත් ආර්ථික සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීම සඳහා සුවිශේෂී උපායමාර්ගයක් වී ඇත. ශ්‍රී ලංකාවේ මෙම අවශ්‍යතාවය ඉටුකරගැනීම සඳහා ඇති වගකීමෙන් HDFC බැංකුවටද බැහැරවිය නොහැක. සමාජයේ සෑම ස්ථරයකම ජනයාට විධිමත් නිවහනක් සපයා දීම සඳහා මූල්‍ය පහසුකම් සැලසීමේ අංශයෙහිලා HDFC බැංකුව සුවිශේෂී මෙහෙවරක් කරන අතර සරල දිවියකට අවශ්‍ය නිවසේ සිට නාගරික නිවාස අවශ්‍යතාවය සපුරාගැනීම දක්වා වන, නිවාස මූල්‍යකරණය, ගුණාත්මක භාවයෙන් හා විශ්වාසයෙන් යුතුව ලබාදීමට කැපවී සිටිමු.

HDFC BANK

*The Housing Bank...*

# පටුන


වාර්තාකරණ පරාමිතිය 3
මූල්‍ය විශේෂතා 4
මෙහෙයුම් විශේෂතා 5
සභාපතිගේ ප්‍රකාශය 6
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය 10
අපේ දැක්ම සහ අපේ මෙහෙවර 15
සාංගමික තොරතුරු 16
අධ්‍යක්ෂ මණ්ඩලය 17
සාංගමික කළමනාකරණය 20
ජාතික ආර්ථික වගකීම 22
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 30
අධ්‍යක්ෂ මණ්ඩල උප කාරක සභා වාර්තාව 35
විගණකාධිපති වාර්තාව 42
ආදායම් ප්‍රකාශනය 44
විස්තීරණ ආදායම් ප්‍රකාශනය 45
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 46
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 47
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 48
ගිණුම්කරණ ප්‍රතිපත්ති 49
මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධ සටහන් 53
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව 64
කොටස් පිළිබඳ තොරතුරු 66
වටිනාකම් එකතුව පිළිබඳ ප්‍රකාශනය 69
දස වසරක සංඛ්‍යාත්මක සාරාංශය 70

# වාර්තාකරණ පරාමිතිය

## වාර්තාකරන කරුණුවල ප්‍රමාණාත්මක භාවය

මෙම වාර්තාව පිළියෙල කිරීමේ දී සියලුම ප්‍රමාණාත්මක තොරතුරු විශ්ලේෂණය කොට එළිදරව් කොට ඇත. ප්‍රමාණාත්මක භාවය යන්න නිර්වචනය කොට ඇත්තේ මූල්‍ය කාර්ය සාධනය, ශේෂ පත්‍රය, වටිනාකම් සහ පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභ සඳහා වන බලපෑම් අදාළ කර ගනිමිනි. ඒ අනුව මෙම වාර්තාව අපගේ පාර්ශවකරුවන්ගේ ඇගයුම් සහ තීරණ කෙරේ නිරතුරුව බලපෑම් ඇති කරන ආර්ථික, පාරිසරික සහ සමාජීය කාර්ය සාධනය පිළිබඳ මූලික කරුණු ගෙන හැර පායි.

## පාර්ෂවකරුවන් සමඟ කටයුතු කරන ආකාරය

පාර්ෂවකරුවන් සමඟ කටයුතු කිරීම හා වාර්තාකරණයේ වැදගත්කම සහතික කරනු වස් උපාය මාර්ගික සහ ප්‍රමුඛ පාර්ෂව කණ්ඩායම් නිර්වචනය කර ගැනීම අනිවාර්ය බව බැංකුව අවබෝධ කරගෙන ඇත. ඒ අනුව 2010 වසරේ ප්‍රධාන පාර්ෂවකරුවන් ලෙස හඳුනාගත්, කොටස්කරුවන්, රජය, ගණුදෙනුකරුවන්, සැපයුම්කරුවන් කාර්ය මණ්ඩලය පරිසරය හා ප්‍රජාව සමඟ තව දුරටත් සම්බන්ධ වී කටයුතු කරයි.

## තිරසාර සංවර්ධනයට කයුතු කිරීම

කොටස්කරුවන්ගේ සිට සේවක මණ්ඩලය දක්වාත්, ගණුදෙනුකරුවන්ගේ සිට වටිනා ව්‍යාපාරික පාර්ශවකාර කොටස්කරුවන් දක්වාත් පොදුවේ සමස්ත ජාතියටම මූල්‍ය, ආර්ථික, සමාජීය හා පාරිසරික අංශයන් තුළ සමාගමේ කාර්ය සාධනය පිළිබිඹු කරන ඒකාබද්ධ චිත්‍රයක් මෙම වාර්තාව හරහා ගෙන හැර පෑමට උත්සාහ කොට ඇත. අපගේ මූලික ව්‍යාපාරික අරමුණ නිවාස හා නිවාස ආශ්‍රිත මූල්‍ය සේවා වන අතර, අපගේ උපරිම ධාරිතාව තුළ එම ව්‍යාපාරික ඉලක්ක ඔස්සේ එක්සත් ජාතීන්ගේ සහස්‍ර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම වාර්තාව මගින් බැංකුවේ ධනාත්මක මෙන්ම ඍණාත්මක කාර්ය සාධනය පිළිබඳ ඒකාබද්ධ විශ්ලේෂණයක් ඉදිරිපත් කරනු ලබන අතර, එමගින් අපගේ ප්‍රතිපත්ති අන්තර් සබඳතා හා ක්‍රියාවලි පිළිබඳව විස්තීරණ දැක්මක් ලබා ගැනීමට අපගේ කොටස්කරුවන්ට සහ අනෙකුත් වැදගත් පාර්ෂවකරුවන්ට හැකියාව ලබා දෙයි. තවද මෙම වාර්තාව ස්වයං විවේචනාත්මකව අඩුපාඩු විශ්ලේෂණය කර ගනිමින් තිරසාර ව්‍යාපාරික ප්‍රවේශයක් සඳහා එම අඩුපාඩු මඟ හරවා ගැනීමට උපකාරී වේ.

## වාර්තාවට ඇති විශේෂිත සීමාවන්

HDFC සේවා සපයන ආයතනයක් වන බැවින් සමහර ගෝලීය වාර්තාකරණ ප්‍රයත්න (GRI) මාර්ගෝපදේශ අදාළ නොවේ.

## දත්ත ගණනය සහ ප්‍රමිතිය පිළිබඳ අනාවරණය

ආර්ථික, සමාජීය හා පාරිසරික කාර්ය සාධනයට අදාළ මූල්‍ය තොරතුරු විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගෙන ඇති අතර, සෙසු අභ්‍යන්තර තොරතුරු බැංකුවේ අභ්‍යන්තර වාර්තා හරහා ලබා ගෙන ඇත.

## අපගේ ත්‍රිත්ත්ව පාදක රේඛීය ප්‍රවේශය



# මූල්‍ය විශේෂතා

| | 2012 ශ්‍රී.ල.රු.මි. | 2011 ශ්‍රී.ල.රු.මි. | වෙනස % |
|---|---|---|---|
| **වර්ෂය තුළ ප්‍රතිඵල** | | | |
| ආදායම | 2,691 | 2,386 | 13 |
| බද්දට පෙර ලාභය | 123 | 402 | (69) |
| බදු ප්‍රතිපාදන | 120 | 186 | (35) |
| බද්දට පසු ලාභය | 2 | 216 | (99) |
| රජයේ ආදායම | 123 | 189 | (35) |
| කොටස්කරුවන්ගේ අරමුදල | 2,391 | 2,337 | 2 |
| ගණුදෙනුකරුවන්ගේ තැන්පතු | 12,923 | 12,336 | 5 |
| දළ ණය සහ ගණුදෙනුකරුවන් සඳහා අත්තිකාරම් | 16,290 | 15,210 | 7 |
| මුළු වත්කම | 20,801 | 19,927 | 4 |
| **මූල්‍ය අනුපාත** | | | |
| කොටස්කාර අරමුදල මත ප්‍රතිලාභ (%) | 0.10 | 10.32 | (99) |
| වත්කම් මත ප්‍රතිලාභ (%) | 0.01 | 1.22 | (99) |
| මුළු වත්කම් කොටස්කරුවන්ගේ අරමුදල්වලට | 11.50 | 11.73 | (2) |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | |
| ද්‍රවශීල වත්කම් (%) | 22.65 | 21.15 | 7 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව | | | |
| කුළුණ I (%) අවම අවශ්‍යතාවය 5% | 20.79% | 21.34% | (3) |
| කුළුණ II (%) අවම අවශ්‍යතාවය 10% | 21.46% | 21.95% | (2) |
| **අනෙකුත් තොරතුරු** | | | |
| ශාඛා | 32 | 31 | 3 |
| කාර්ය මණ්ඩලය | 488 | 505 | 6 |
| ණය ශ්‍රේණිගත කිරීම - ෆිච් ශ්‍රේණිගත කිරීම | BBB ස්ථාවර | BBB+ ස්ථාවර | |




ණය අත්තිකාරම් හා තැන්පතු




ලාභ වර්ධනය




මුළු වත්කම




සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ සහ (ROA) සාමාන්‍ය හිමිකම් මත ප්‍රතිලාභ (ROE)




ආදායම

## මෙහෙයුම් විශේෂතා

2011 වසරේ දී අප ලබා දුන් ශ්‍රී.ල.රු.මිලියන 4,700 වටිනාකමකින් යුත් නිවාස ණය පහසුකම් 14,224 සාපේක්ෂව මෙම වසර තුළ ශ්‍රී.ල.රු.මි. 3,599 වටිනාකමකින් යුතු නිවාස ණය 12,400 ලබා දී ඇත. අපගේ තැන්පතු ගණුදෙනුකාර පදනම 261.000 සිට 330,000 දක්වා ඉහළ යමින් 5% වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

ගණුදෙනුකරුවන් සඳහා වන අපගේ ශාඛා ජාලය 31 සිට 32 දක්වාත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සංඛ්‍යාව 310 සිට 360 දක්වාත් ජංගම බැංකු පද්ධතිය 100 සිට 120 දක්වාත් දීප ව්‍යාප්තව ප්‍රසාරණය විය.

ජංගම බැංකුකරණය හරහා 33,000 වැඩි පිරිසක් මූල්‍ය ගණුදෙනුවලට ඇතුළත් වී සිටී.

පරිසරයට කාබනික අපද්‍රව්‍ය නිකුත් කිරීම අවම කර ගැනීම පිළිබඳ වාර්ෂික ඉලක්ක සපුරාගෙන ඇත.

ප්‍රජා පැවැත්ම සඳහා අප ශ්‍රී.ල.රු.මි. 1.8 ආයෝජනය කොට ඇත.

*ඉදිරි ඉලක්ක - මධ්‍ය කාලීන*

| | 2011 - තත්ත්ව | 2012 - තත්ත්ව | 2013 - අයවැය | 2013 - ඉලක්ක |
|---|---|---|---|---|
| කොටස් මත ප්‍රතිලාභ | 10.32% | 0.10% | 4.12% | 18.5% |
| වත්කම් මත ප්‍රතිලාභ | 1.22% | 0.01% | 0.41% | 2% |
| ආදායම් අනුපාතයට පිරිවැය | 82.74% | 95.39% | 93.91% | 43% |
| ගණුදෙනුකාර තැන්පතු (ශ්‍රී.ල.රු.මි.) | 12,336 | 12,923 | 17,980 | 17,500 |
| මුළු වත්කම් (ශ්‍රී.ල.රු.මි.) | 19,927 | 20,801 | 25,336 | 30,000 |
| කොටස්කරුවන්ගේ අරමුදල් (ශ්‍රී.ල.රු.මි.) | 2,337 | 2,391 | 2,508 | 2,700 |
| ශාඛා සංඛ්‍යාව | 31 | 32 | 32 | 50 |
| කාර්ය මණ්ඩලය | 505 | 488 | 500 | 500 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 310 | 360 | 400 | 500 |

**ශ්‍රී.ල.රු. මිලියන 3,599** නිවාස ණය

**12,400** වන කුටුම්භයක් සඳහා

# HDFC නාමය පිළිබඳ ජනතා විශ්වාසය අප සැලසුම් කොට ඇති නව වෙළෙඳපොළ ගවේෂණය සඳහා විශාල රුකුලක් වන අතර ඒ තුළින් වේගවත් ව්‍යාපාරික වර්ධනයක් ජනනය කර ගත හැකි බව මාගේ විශ්වාසයයි.

ශ්‍රී ලංකාව 2016 වසරේ දී ඇ.ඩො. 4,000 දක්වා ඒක පුද්ගල ආදායම දෙගුණ කිරීමේ මාවතට පිවිස ඇති අතර, රජය මධ්‍ය ආදායම් උගුලෙන් ගැලවීම සඳහා දෙවන වර්ධන රැල්ලක් සැලසුම් කොට ඇත. මෙම දීර්ඝකාලීන දැක්ම යටතේ සියලු ආර්ථික ක්ෂේත්‍රයන් තුළ පෙර නොවූ විරූ සංවර්ධන ක්‍රියාකාරකම් අත්දකිමින් සිටී. 2012 වසර තුළ දී මෙම සංවර්ධන ව්‍යාපෘති බොහොමයක ප්‍රතිඵල නෙළා ගැනීමට සමත් විය. 2012 වසර කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වූ සුවිශාල යටිතල පහසුකම් සංවර්ධනයට ඉදිකිරීම්, වරාය හා ගුවන් තොටුපළ නවීකරණය, මහා මාර්ග, දුම්රිය මාර්ග, වාරි මාර්ග, ජල සම්පාදනය, නිවාස ඇතුලු නාගරික සංවර්ධනය ඇතුළත් විය. වසර තුළ දී ඉහළ කොත්මලේ ජල විදුලි බල ව්‍යාපෘතිය ප්‍රධාන විදුලි පද්ධතියට එක්වුණු අතර මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ 2013 මාර්තු මාසයේ දී ගුවන් ගමන් සඳහා නිම විය. කොළඹ දකුණ වරාය ව්‍යාපෘතිය, කොළඹ පිට රවුම් මහා මාර්ගය, මාගම් රුහුණු පත්තු මහින්ද රාජපක්ෂ වරායේ II අදියරය, දකුණු අධිවේගී මාර්ගයේ II අදියරය එනම්, කොලඹ, කටුනායක අධිවේගී මාර්ගය, උතුරු දුම්රිය මාර්ගය යාපනය දක්වා දීර්ඝ කිරීම වසර තුළ සිදු වූ සුවිශේෂී කඩඉම්වලින් කිහිපයකි. මෙම විශාල යටිතල ව්‍යාපෘතිවලට අමතරව ග්‍රාමීය ජන ජීවිතය ඉහළ නංවමින් දිවයින පුරා කුඩා පරිමාණ ව්‍යාපෘති සමූහයක් ක්‍රියාත්මක කරන ලදී. රජයේ නාගරික සංවර්ධන සැලැස්ම යටතේ පදික මං තීරු ඉදි කිරීම, මාර්ග, උද්‍යාන, භෝජනාග ාර, වාණිජ මධ්‍යස්ථාන, විනෝදාස්වාද පහසුකම් ප්‍රතිසංස්කරණය සහ ජල කළමනාකරණය ඇතුලු මහා පරිමාණ කොළඹ නගරය ආකර්ශනීය කිරීමේ වැඩ සටහනක් දියත් කරන ලදී. මෙම වසර තුළදී ම දේපළ සංවර්ධනය විශේෂ කොට පෞද්ගලික අංශයේ ආයෝජන ගණනාවක්ම දක්නට විය. මෙම බහුවිධ සංවර්ධන ආයෝජනයන් ගමනාගමන, ප්‍රවාහන වාණිජ ව්‍යවසායකයන් සහ සංචාරක ව්‍යාපාරයට සහය වෙමින් නුදුරු අනාගතයේදී ම සමස්ත ආර්ථික වර්ධනයකට දායක වනු ඇති අතර ග්‍රාමීය හා නාගරික ජනයාගේ ජීවන මට්ටම ඉහළ නංවයි.

නිවාස අවශ්‍යතාවයේ ප්‍රමුඛතාවය මත පිහිටා නව නිවාස ඉදිකරමින්, දැනට ඇති නිවාස ප්‍රතිසංස්කරණය කරමින්, මුඩුක්කු නිවාස වෙනුවට නව නිවාස ස්ථානගත කරමින්, පහළ හා මධ්‍යම පාංතික ජනතාවට නිවාස ඉදි කරගැනීමට පහසුකම් සලසමින් සහ දේපළ අයිතිය තහවුරු කර දෙමින් රජය නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා බහුවිධ මානයන් යොදා ගැනේ. HDFC වශයෙන් අප “සැමට නිවසක අයිතිය” යන ජාතික නිවාස දැක්ම යටතේ 2016 වසර වන විට නිවාස 100,000 ඉලක්කය සඳහා පූර්ණ සහය ලබා දෙමින් වසර තුළ දී නව නිවාස 12,400 සඳහා නිවාස ණය පහසුකම් ලබා දී ඇත.

සියලුම ප්‍රමුඛ ක්ෂේත්‍රයන් 2012 වසරේ දී 6.4% වර්ධන වේගයක් ලඟා කර ගැනීමට ඵලදායී ලෙස දායක වූ අතර, ඉදිකිරීම් අංශයෙන් බලගැන්වුණු කර්මාන්ත ක්ෂේත්‍රය මෙම වර්ධනයේ ප්‍රමුඛයා විය. සුවිශාල රාජ්‍ය ආයෝජන වැඩ සටහන් සහ සමහර පෞද්ගලික අංශයේ නිශ්චල දේපළ ව්‍යාපෘති, ඉදිකිරීම් උප ක්ෂේත්‍රය තුළ සුවිශේෂී දායකත්වයක් පිළිබිඹු කරන ලදී.

කෙසේ වුව ද වසර තුළ වූ ඉහළ ගිය පොළී අනුපාත හේතු කොට ගෙන අපගේ මූල්‍ය හා පොළී වියදම් පිරිවැය දැඩි ලෙස ඉහළ යන ලදී. අපගේ ගණුදෙනුකාර පදනම සීමිත ආදායම් සහිත මධ්‍යම හා පහළ පංතිවලින් සැකසී ඇති බැවින් ඉහළ ගිය අනුපාතයන්ට අනුරූපීව ණය දීමේ අනුපාත දැඩි ලෙස ඉහළ නැංවීමට අපට මූල්‍ය හෝ සමාජීය වශයෙන් හැකියාවක් නොතිබුණු අතර, HDFC සුළු වශයෙන් ණය දීමේ අනුපාත ඉහළ නංවමින් ප්‍රතිචාර දක්වන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් අනෙකුත් ප්‍රභවයන්ගෙන් උත්පාදනය වන සීමිත ආදායම් මාර්ග අබියස HDFC බැංකුවට පොළී අනුපාතයන්ගේ දැඩි ඉහළ යෑමේ කම්පනය මුළුමනින්ම වාගේ දැරීමට සිදු විය.



**අප දැනටමත් වර්ධන ප්‍රවේශයන් අවස්ථාවන් නිර්මාණය කිරීමට පියවර ගෙන ඇති බැවින්, පසුබෑම් පැවතිය ද ඔබගේ බැංකුව දීප්තිමත් අනාගතයක ලකුණු පෙන්නුම් කරන බව මම සතුටින් ප්‍රකාශ කර සිටිමි.**

### දීප්තිමත් අනාගතය

අප දැනටමත් වර්ධන අවස්ථාවන් නිර්මාණය කිරීමට පියවර ගෙන ඇති බැවින් පසුබෑම් පැවතිය ද ඔබගේ බැංකුව දීප්තිමත් අනාගතයක ලකුණු පෙන්නුම් කරන බව මම සතුටින් ප්‍රකාශ කර සිටිමි. 2011 වසරේ දී බැංකුවේ මෙහෙයුම් පරාසයට අදාළව HDFC පනත සංශෝධනය කිරීමට අප ගත් උත්සාහයේ ඵලයක් ලෙස ධනාත්මක ප්‍රතිඵල අත් දුටු අතර, එමගින් මෙතෙක් අත්හදා බැලීම් නොකළ ක්ෂේත්‍ර තුළ සිය ව්‍යාපාරික කටයුතු ප්‍රසාරණය කිරීමට හැකි වී ඇත. මෙම තත්ත්වය බැංකුවේ වර්ධනය සඳහා නව අවස්ථා රැසක් විවර කර දී ඇති අතර, HDFC නාමය පිළිබඳ ජනතා විශ්වාසය නව මූල්‍ය වර්ෂය සඳහා අප සැලසුම් කොට ඇති නව වෙළෙඳපොළ ගවේෂණය තුළින් වේගවත් වර්ධනයක් ජනනය කර දෙන බව මාගේ විශ්වාසයයි. මෙම ඉදිරි වර්ධන අරමුණු කොට අභ්‍යන්තර ධාරිතාව ගොඩනැඟීමේ ක්‍රියාවලියක් දැනටමත් ආරම්භ කොට ඇත.

### නව ආදායම් ධාරා

ශ්‍රී ලංකා ජන සමාජයේ පුළුල් අවශ්‍යතාවයන් සමඟ අපගේ වර්ධන උපාය මාර්ග බද්ධ කරමින් බැංකුවට නව ආදායම් ධාරා නිර්මාණය කිරීම සඳහා අපගේ මෙහෙයුම් ප්‍රසාරණය කොට ඇත. “HDFC සමූහයේ නිවාස අරමුදල” හඳුන්වා දෙන ලද්දේ බැංකුවට දිගුකාලීන අඩු පිරිවැය අරමුදල් සැපයීමේ මූලයක් ලෙසින් වන අතරම ශ්‍රී ලංකාවේ දැවෙන ප්‍රශ්නයක් වන වියපත් ජනතාවට සුරක්ෂිත අනාගතයක් සහතික කිරීම සඳහා ඵලදායී විශ්‍රාම ක්‍රමයක් හඳුන්වාදීම මගින් පිළියම් යෙදීම වේ. මෙම සුවිශේෂී ඉතිරි කිරීමේ ක්‍රමය ජනතාවට ඒ හා සහභාගී වී අනාගතයේ දී අඛණ්ඩව පවතින රටේ නිවාස ඉල්ලුම් වර්ධනයෙන් සෘජු ප්‍රතිලාභ ලැබීමට අවකාශ සලසා දෙයි. කවර හෝ ප්‍රමාණයේ තැන්පතු සඳහා ඉහළම වෙළෙඳපොළ පොළී අනුපාතයක් නිරතුරුවම ගිණුම් හිමියන්ට ලබා දෙන බැවින් මෙම නිෂ්පාදිතය ඉහළ අනාගත මූල්‍ය ප්‍රතිලාභ සහතික කෙරේ. තැන්පතු හිමියාගේ වයස අවුරුදු 55 පිරීමත් සමඟ ගිණුම කල් පිරෙන අතර, මේ වන විට ඉතිරි කිරීමේ ගිණුම සැලකිය යුතු විශ්‍රාම අරමුදලකට වර්ධනය වේ. මෙම නිෂ්පාදිතයට ලැබී ඇති ප්‍රතිචාර දිරිගන්වන සුලු වන අතර, ශ්‍රී ලංකාවේ වියපත් වන ජනගහන සාධකය අභියස ඉදිරි වසරවල මෙය තව දුරටත් අඛණ්ඩව ජනප්‍රිය වනු ඇතැයි මම විශ්වාස කරමි.

අඩු ආදායම් ලාභීන්ගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අප නවතම ක්‍රම සැලසුම් කරමින් සිටී. ශ්‍රී ලංකාවේ ජාතික නිවාස පරතරය සාර්ථකව කළමනාකරණය කර ගෙන ඇති අතර අඩු හා මධ්‍යම ආදායම් කණ්ඩායම්වල විශේෂයෙන් ඔවුන්ගේ ජනගහන වර්ධනය සහ උතුරු නැගෙනහිර යළි පදිංචි කිරීමේ අවශ්‍යතාවයන් හේතු කොට ගෙන සැලකිය යුතු පරතරයක් තව දුරටත් පවතී. මේ අතර වේගවත් නාගරීකරණය වෙත රට යොමුව ඇති බැවින් නාගරික නිවාස සඳහා වන ඉල්ලුම කිහිප ගුණයකින් වැඩි වී ඇත. මධ්‍යම හා ඉහළ ආර්ථික කණ්ඩායම් විධිමත් මූල්‍ය ක්‍රම හරහා මෙම පහසුකම් භුක්ති වින්ද ද රටේ නිවාස වෙළෙඳපොළෙන් 30% නියෝජනය කරන අඩු ආදායම්ලාභී අවිධිමත් කාණ්ඩය තවමත් විශාල වශයෙන් මෙම පහසුකම් ලබා ගත නොහැකිව ඇත. මෙම සාම්ප්‍රදායික ස්වර්ණමය සම්පතින් පූර්ණ ඵල නෙළා ගැනීම සඳහා අප සුවිශේෂී සහ තිරසාර විසඳුමක් ලබා දෙමින් මෙම සමාජ අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වා ඇත. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ඉතිරි කිරීම් පහළ මට්ටමක් පෙන්නුම් කළ ද අඩු ආදායම්ලාභී ජනතාව ද ඉතිරි කිරීම්වල ආයෝජනය

කරන බව අප විශ්වාස කරයි. කෙසේ වුවද සාම්ප්‍රදායිකව එම ඉතිරි කිරීම් රන් වශයෙන් සිදු කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම ජනතාවට ඉහළ ණය අවදානම හේතු කොට ගෙන විධිමත් මූල්‍ය ක්‍රමවලට යොමුවීමට නොහැකි වී ඇත. කෙසේ වුව ද අඩු ආදායම්ලාභී කණ්ඩායම්වලට සිය රන් ඉතිරි කිරීම නිවාස ණය කොටසක් බවට පරිවර්තනය කර ගැනීමේ අඛණ්ඩ ජයග්‍රාහී විසඳුමක් අප හඳුන්වා දී ඇත. ණය ක්‍රමය අඩු අවදානමෙන් යුත් බැංකුවට ආදායම් උපයා දෙන මාර්ගයක් වන අතර, ඉක්මනින් පීඩාවට ගොදුරු වන කණ්ඩායම්වලට සහය වෙමින් බැංකුවේ සමාජ සහ ආර්ථික තිරසාර වැඩ සටහනට සෘජුවම දායක වේ. සාම්ප්‍රදායිකව, එවැනි සමාජ කණ්ඩායම්වලට ඉහළ පොළී අනුපාත යටතේ සහ නිසි නීති රෙගුලාසිවලින් තොර යන දෙආකාරයෙන් ම අනාරක්ෂිත අවිධිමත් මූල්‍ය ගණුදෙනුවලට යොමුවීම හැර කළ හැකි අන් විකල්පයක් නොවුණි. HDFC රන් ණය ක්‍රමය තුළින් මෙම ජනතාවට නිවසක් හිමි කර ගැනීමේ සිහිනය සැබෑ කර ගැනීමට අවස්ථාවක් උදා කර දී ඇත.

## ධාරිතා වර්ධනය

බාහිර අවිනිශ්චිතතා අභියස දිගුකාලීන ස්ථාවරත්වය තහවුරු කිරීම බැංකුවේ තිරසාර අවධානයයි. ඒ අනුව අභ්‍යන්තර ධාරිතාව ගොඩනැගීම සඳහා වන අපගේ ඉදිරි උත්සාහය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් අනාගත තිරසාර වර්ධනය උදෙසා දායක වන ස්ථිර විසඳුම් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. කාර්ය මණ්ඩල කුසලතා වර්ධනය, අභ්‍යන්තර ක්‍රියාවලිය යළි සැකසීම සහ අපගේ තාක්ෂණය වැඩි දියුණු කිරීම මෙයට ඇතුළත් වේ.

ජංගම හා පාම් ටොප් (PALM TOP) බැංකු ක්‍රමවේදයන් සහ අපගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ආවරණය ප්‍රසාරණය කිරීම සඳහා උපාය මාර්ගීය වෙනස්කම් ඇති කිරීම මගින් අපගේ වෙළෙඳපොළ පුළුල් කරගෙන ඇත. මෙම විසඳුම් හරහා අඩු පිරිවැයක් යටතේ ඵලදායී වෙළෙඳපොළ ප්‍රසාරණයක් සිදුව ඇත. උතුරේ යළි ඉදිකිරීම් සහ පුනරුත්ථාපන අවශ්‍යතා වෙනුවෙන් 2012 ජනවාරි මස යාපනය නගරයේ ප්‍රථම HDFC බැංකුව විවෘත කරන ලදී. මෙමගින් යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවල වර්ධනය වන නිවාස ඉල්ලුම සපුරාලීමටත්, රජයේ සංවර්ධන සැලසුම්වලට සහය වීමටත් අවස්ථාව උදා කර දී ඇත.

මහ බැංකු නියමයන් ප්‍රකාරව 2011 වසරේ දී අපගේ ප්‍රාග්ධන පදනම රුපියල් බිලියන 2 දක්වා වැඩි කර ගෙන ඇති අතර, 2013 දී මෙය රුපියල් බිලියන 2.5 දක්වා වැඩි කර ගැනීමට දැනට සූදානම් කර ඇත.

## ඉදිරි දැක්ම

පසුගිය වසර පුරාවට HDFC බැංකුව රටේ ප්‍රමුඛ විශ්වාසදායී නිවාස මූල්‍ය ආයතනය ලෙස නම් දරා ඇත. අද දිනයේ අදාළ නියාමන බලතල මගින් ඉදිරියේ දී අපට මුහුණ දීමට සිදුවන අභියෝගයන්ට සවිමත්ව පිළිතුරු සැපයීමට හැකියාව ලබා දී ඇත. ඒ අනුව වර්ධනය තිරසාරව පවත්වාගෙන යෑම සඳහා සාම්ප්‍රදායික නොවන ඵලදායී උපාය මාර්ග වර්ධනය කිරීමට අපගේ දේශීය නිවාස වෙළෙඳපොළ විශේෂඥතා දැනුම උපරිම ලෙස යොදා ගැනීමටත් අපගේ කොටස්කරුවන්ට දිගුකාලීන වටිනාකම් නිර්මාණය කර දීමටත් අඛණ්ඩව ක්‍රියා කරනු ඇත.

HDFC බැංකු පනතේ සංශෝධන හරහා බලාත්මක වී ඇති අප දැනට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට නැඹුරුවීමට සූදානම් වෙමින් සිටී. ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුළ සේවා සැපයීමට අප අද්විතීය ආදර්ශකයක් හඳුන්වා දෙනු ලබන අතර, එමගින් නිවාස සංවර්ධනය සමඟ ආර්ථික ක්‍රියාකාරකම් සම්බන්ධ කෙරේ. අපගේ නිර්මාණශීලී නිවාස මූල්‍ය සැලැස්ම නිවාස සංවර්ධනයට මෙන්ම ආර්ථික ක්‍රියාකාරකම්වලට ඉඩකඩ සලසා දෙන අතර, එමගින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ගේ නිවාස අවශ්‍යතාවයන් මෙන්ම ව්‍යාපාරික අවශ්‍යතාවයන් ද සපුරාලයි. තවද අපගේ නව ව්‍යවස්ථාපිත බලතල උපයෝගී කර ගනිමින් කල්බදු වෙළෙඳපොළට ප්‍රවේශවීමට ද බලාපොරොත්තු වන අතර, එමගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ ක්ෂුද්‍ර ව්‍යාපාරයන්ට විස්තීරණ සේවා ගොමුවක් ලබාදීමට අපට හැකියාව ලැබේ.

නව මූල්‍ය වසර තුළ ජංගම බැංකුකරණය, පාම්ටොප් බැංකුකරණය හා නව සේවා කවුළු හරහා තැන්පතු සහ අත්තිකාරම් ගණුදෙනු සිදු කිරීම තුළින් අපගේ වෙළෙඳපොළ භූගෝලීයව පුළුල් කිරීමට අඛණ්ඩව ක්‍රියා කරනු ලැබේ. උතුරු නැගෙනහිර යළි පදිංචි කිරීම් හා කඩිනමින් යථා තත්ත්වයට පත්වීම හේතු කොට ගෙන එම ප්‍රදේශවල අපගේ මෙහෙයුම් සීඝ්‍ර ව්‍යාප්තියක් ලඟා කර ගනු ඇති බව මාගේ විශ්වාසයයි. තිරසාර නාගරික නිවාස ක්ෂේත්‍රය ප්‍රමුඛ රටේ වැඩිවන නිවාස ඉල්ලුම සපුරාලීම සඳහා නිවාස විසඳුම් හඳුනා ගැනීම අඛණ්ඩව සිදු කෙරේ.

## ප්‍රණාමය

අප රටට තිරසාර සාමයක් හා සංවර්ධනයක් ලඟා කර දීමට සමත් වූ දැක්මකින් යුත් ගරු ජනාධිපති සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට මාගේ හෘදයාංගම ප්‍රණාමය පුද කරනු කැමැත්තෙමි. භාණ්ඩාගාර ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතාටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත්

නිවාඩ් කබ්රාල් මහතාට ඔවුන් අපට ලබා දුන් නියාමන, අධීක්ෂණ සහ මාර්ගෝපදේශ සේවාව වෙනුවෙන් ස්තුතිය පළ කර සිටිමි. අභියෝගාත්මක වසර තුළ HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් දායකත්වය සහ නිරන්තර සහයෝගය අගයනු කැමැත්තෙමි. 2012 වසරේ දී හිටපු වැඩ බලන සාමාන්‍යාධිකාරී එස්. දිසානායක මහතා ඉටු කළ අමිල සේවය වෙනුවෙනුත් HDFC බැංකුවේ නව සාමාන්‍යාධිකාරී නිමල් මාමඩුව මහතා ලබා දෙන සේවය වෙනුවෙනුත් මාගේ ස්තුතිය පළ කර සිටිමි.

මාගේ සාංගමික, විධායක හා අනෙකුත් කාර්ය මණ්ඩලය කැපවීමෙන් යුතුව ලබා දෙන සේවා දායකත්වය සහ HDFC බැංකුවේ වෘත්තීය සමිතිය සිය සේවක පිරිස මෙන්ම බැංකුවේ සුබසිද්ධිය තහවුරු කරමින් ඉටු කරන සේවාව අගයමි. බැංකුවට ප්‍රබල සවියක් වන ස්වකීය ගණුදෙනුකරුවන් බැංකුව කෙරෙහි තබා ඇති අචල විශ්වාසය වෙනුවෙන් මා කෘතඥ වෙමි. අපගේ කොටස්කරුවන් බැංකුවට ලබා දෙන නිරන්තර සහය මා අගයන අතර, ඔබගේ බැංකුව සවිමත් පදනමක් මත නව බලය පැවරීම යටතේ නව මං සොයා යන සාංක්‍රමික යුගයක පසුවන බව දන්වනු කැමැත්තෙමි. එසේ හෙයින් ඔබගේ ඉවසීම හා ගෞරවනීය සැලකිල්ල තුළින් නුදුරු අනාගතයේදී ම ඉහළ ප්‍රතිලාභ අත් කර දෙන අතර, දීර්ඝකාලීනව ද අඛණ්ඩව වැඩි ප්‍රතිලාභ උරුම කර දෙනු ඇත.

ඔබට ස්තුතියි,



**ශිරෝමිණී වික්‍රමසිංහ**
*සභාපති.*
HDFC බැංකුව, ශ්‍රී ලංකාව.

# ඉදිරි වර්ධනය සඳහා මාවත් විවර කර ගන්නා අතර, මෙහෙයුම් ආදායම අඩු කර ගැනීම සඳහා ස්ථිර හා කල් පවතින විසඳුම, සේවා විවිධාංගීකරණය බව අප පිළිගනී. ඒ අනුව අපගේ ව්‍යාපාරික මෙහෙයුම් යළි තුලනය කරමින් අපගේ ව්‍යාපාර ප්‍රවේශය වෙනස් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

2012 වසර සඳහා HDFC කාර්ය සාධනය ඉදිරිපත් කිරීමට ලැබීම ගෞරවයක් කොට සලකමි.

බාහිර ගෝලීය තත්ත්වයන් සහ දේශීය සාධක හේතු කොට ගෙන සමාලෝචනයට භාජනය වූ වසර සමස්ත රටම වෙනස්කම්වලට බඳුන් කළ කාල පරිච්ඡේදයක් විය. යුරෝපා රන් ණය අර්බුදය, ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය කඩා වැටීම, ඉරානයට පනවන ලද සම්බාධක සහ රටවල් අතර දේශපාලන සැක සංකා උග්‍ර කල නිරන්තරයෙන්ම ඉහළ යන ඛනිජ තෙල් මිල ලෝක ආර්ථිකය දැඩි පීඩාවට ලක් කරන ලදී.

දේශීය සන්දර්භය තුළ ඉහළ ගිය ආනයනයන්, අධික ණය ඉල්ලුම සහ වසරේ අග කාර්තුවේ ඇති වූ නියං, අධික වැසි සහ ජල ගැලීම්, රටේ විදුලි නිෂ්පාදනය, කෘෂි නිමැවුම් හා ආහාර සැපයුම අස්ථායිකරණය හේතු කොට ගෙන දේශීය ආර්ථිකය අඩපණ කරන ලදී. මෙම තත්ත්වයට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2012 මුල් භාගයේ දී මූල්‍ය ප්‍රතිපත්ති, විනිමය අනුපාත ප්‍රතිපත්ති යන අංශයන්හි දැඩි ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. බැංකු ණය දීම් සම්බන්ධයෙන් ණය සීමාවන් පනවමින් අධික ණය සහ ආනයන වැඩිවීම් පාලනය කිරීම සඳහා පොළී අනුපාතයන් ඉහළ නංවමින් සංශෝධනය කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අඩු ද්‍රවශීලතාවයක් සහ ඉහළ වෙළෙඳපොළ පොලී අනුපාතයක් ඇති විය. කෙසේ වුවද ආර්ථිකය කෙරේ අහිතකර බලපෑම් පැවතිය ද දළ දේශීය නිෂ්පාදිතය 6.4% වර්ධනයක් ලඟා කර ගනිමින් සවිමත් ආර්ථික වර්ධනයක් දිගටම පෙන්නුම් කරන ලදී. මූල්‍ය ඒකාබද්ධතාවයක් පවත්වාගෙන යෑම සඳහා රජය දැඩි කැපවීමකින් ක්‍රියාකරමින් ආර්ථික මූල ධර්ම තව දුරටත් සවිමත් කරන ලදී.

මාර්ග සංවර්ධනය, විදුලි බල ව්‍යාපෘති, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධනය වැනි සුවිශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සහ ගම නැගුම, මග නැගුම, උතුරු වසන්තය සහ නැගෙනහිර උදානය වැනි ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලිය අඛණ්ඩව ඉදිරියට ගෙන යෑම තුළින් මෙම වසරේ ප්‍රගතියක් සහ සංවර්ධනයක් පෙන්නුම් කරන ලදී. හෝටල් සහාධිපත්‍ය ඉදිකිරීම් සහ රට වේගවත් පරිවර්තනයකට ලක් කරන සුවිශාල සාප්පු සංකීර්ණ සඳහා සෘජු විදේශ ආයෝජන රට තුළට ගලා එමින් පවතී. ඉතිහාසයේ ප්‍රථම වතාවට සංචාරක පැමිණීම දස ලක්ෂය ඉක්මවමින් සංචාරක ක්ෂේත්‍රයේ මෙතෙක් නොවූ විරූ වර්ධනයක් පෙන්නුම් කොට ඇති අතර, විදේශ ආයෝජකයින් විසින් මෙරට ආයෝජන සඳහා තබා ඇති විශ්වාසය වර්ධනය වෙමින් පවතී.

සවිමත් ආර්ථික වර්ධනය ඉදිරියට රැගෙන යෑම සඳහා දායක වෙමින් ආර්ථිකයේ අවශ්‍යතාවයන්ට රටේ බැංකු පද්ධතිය ප්‍රතිචාර දක්වා ඇත. ශ්‍රී ලංකාව සහස්‍ර සංවර්ධන ඉලක්ක ආසන්නට ලඟා වෙමින් සිටින අතර, රජය ඇ.ඩො. බිලියන 1000 ආර්ථිකයක් සහ 2016 වන විට ඇ.ඩො. 4000 + ඒක පුද්ගල ආදායමක් කරා ලඟා වීමට අවශ්‍ය පසුබිම සකසමින් සිටී. සමාජ සංවර්ධනයේ සහ සවිබල ගැන්වීමේ ප්‍රධාන සාධකයක් වන නිවාස මූල්‍යකරණයේ විශේෂඥයන් වශයෙන් HDFC බැංකුව සිය ශක්‍යතාවය තුළ මෙම ජාතික ඉලක්ක සඳහා සිය දායකත්වය ලබා දෙමින් සිටී.



## අපගේ කාර්ය සාධනය

පුළුල් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතු කොට ගෙන බැංකුව මුහුණ දුන් අනපේක්ෂිත බාධාවන් හමුවේ වුව ද සමාලෝචිත වසර තුළ ඔබගේ බැංකුව ලබා ඇති සම්මානනීය ප්‍රගතිය ප්‍රකාශ කර සිටිනුයේ ඉමහත් සතුටිනි. අපගේ මුඛ්‍ය ව්‍යාපාරික ගණුදෙනු තුළින් වසර තුළ 13.4% වර්ධනයක් ඔබ බැංකුව පවත්වාගෙන ගොස් ඇත. කෙසේ වුව ද ඉහළ ගිය පොළී අනුපාත හේතුවෙන් අපගේ පොළී වියදම් 33% ඉහළ ගිය අතර, එමගින් ඍණ පොළී ආදායම් තත්ත්වයකට මග පෑදුණි. ලංකා බැංකු සේවක සංගමයේ HDFC ශාඛාව සමඟ ඇති කර ගත් නව සමූහ ගිවිසුම යටතේ සේවක වැටුප් 33% ඉහළ නංවමින් සංශෝධනය කිරීම හේතු කොට ගෙන බැංකුව මෙහෙයුම් පිරිවැයවල වැඩිවීමක් අත් විඳින ලදී.

ඉහළ ගිය පොළී අනුපාත නිවාස වෙළඳපොළ හදිසි පහළ වැටීමකට ලක් කළ ද අපගේ ආදායම වැඩි කරමින් ඉහළ ගිය පිරිවැය ආවරණය කර ගැනීමට අපට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපගේ ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ අතර, 2011 වර්ෂය හා සැසඳීමේ දී අපගේ ලාභයේ පහළ වැටීමක් අත් විඳින ලදී. එසේ වුව ද සිය වර්ධනය සඳහා බැංකුවේ දැඩි අවධානය හේතුවෙන් තැන්පතු සහ අත්තිකාරම්වල වර්ධනයක් අඛණ්ඩව පවත්වාගෙන යෑමට හැකි විය.

## තැන්පතු

වසර තුළ බැංකුවේ සමස්ත තැන්පතු පදනම 5% වර්ධනය වූ අතර, HDFC බැංකුව නව නිෂ්පාදන සංවර්ධනයේ නිරත වෙමින් අඩු පිරිවැය හා දිගුකාලීන අරමුදල් සැපයීම සවිමත් කිරීම සඳහා ඉතිරි කිරීම් තැන්පතු පදනම පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. දැනට බැංකුවේ කාල තැන්පතු ගිණුම්, තැන්පතු පදනමින් 87% අගයක් ගන්නා අතර, ඉතිරි කිරීම් ගිණුම් 13% වේ. කෙසේ වුව ද අපගේ ඉතිරි කිරීම් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා වන නව සැලැස්ම හරහා ඉදිරි වසර තුන තුළ අපගේ ඉතිරි කිරීම් පදනම සමස්ත ණය කළඹෙන් 20% දක්වා ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ. ණය සීමා කිරීම සහ වෙළෙඳපොළ පහත වැටීමට උපාය මාර්ගික ප්‍රතිචාරයක් ලෙසින් රන් ණය නැමති නව නිෂ්පාදනයක් හඳුන්වා දුන් අතර, සේවක අර්ථ සාධක අරමුදල මත නිවාස ණය ලබාදීම ප්‍රවර්ධනය සිදු කරන ලදී.

රන් ණය සඳහා දිරිගන්වන සුළු වෙළෙඳපොළ ප්‍රතිචාරයක් ලැබී ඇති අතර, මෙම නිෂ්පාදන ජනප්‍රියවීමත් සමඟ එම අංශයේ ඉහළ වර්ධනයක් පෙන්නුම් කරනු ඇතැයි අප විශ්වාස කරයි. තවද නිවාස ඉදි කිරීම සඳහා ඉඩමක් මිළ දී ගැනීම සහ නිවාස කටයුතු සඳහා වන සේ.අ.අ. පාදක ණය වැඩි කිරීමට ද බලාපොරොත්තු වේ.

## ණය සම්බන්ධයෙන් වූ වර්ධනීය ලක්ෂණ

දැඩි ණය ඇගයීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සහ ආපසු ණය අය කර ගන්නා ආකාරය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම හේතු කොට ගෙන අක්‍රීය ණය අනුපාතය 2011 වසරේ පැවති 22.11% සාපේක්ෂව මෙම වසර තුළ 20.52% ලෙසින් වර්ධනීය තත්ත්වයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුව ද ශ්‍රී ලංකා මහ බැංකුව ඇප වූ සේවා අර්ථ සාධක අරමුදල් ශේෂය පාදක අක්‍රීය ණය මෙයට ඇතුළත් වන බව සඳහන් කිරීම වැදගත් වේ. සේ.අ.අ. කාණ්ඩය හැරුණු විට 2011 වසරේ අනුපාතය 11.37% වූ අතර, එය 2012.12.31 දිනට 7.8% විය.

### තාක්ෂණය

තොරතුරු තාක්ෂණය සහ අනෙකුත් තාක්ෂණ ක්‍රම නිර්මාණශීලී භාවිතය තුළින් ලැබෙන සහය උපයෝගී කර ගනිමින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කර ගැනීම උදෙසා වසර තුළ දී තාක්ෂණ දියුණුව ප්‍රමුඛතාවය ලබා දුනි. මෙම වසර තුළ දී අවම පිරිවැයකින් රටේ වඩාත් ග්‍රාමීය ප්‍රදේශවලට අපගේ පාම්ටොප් මෙහෙයුම් ප්‍රසාරණය කරන ලදී. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ගණුදෙනුකරුවන් බැංකුවට ආකර්ශනය කර ගැනීම සඳහා සම්පත් බැංකුවේ පුළුල් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ජාලය භාවිතා කිරීමට HDFC බැංකුවේ ගණුදෙනුකරුවන්ට පහසුකම් සැලසෙන පරිදි අප සම්පත් බැංකුව සමඟ ගිවිසුමක් ක්‍රියාත්මක කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දීප ව්‍යාප්ත අපගේ ශාඛා 32 සමන්විත ජාලයට සහ පාම්ටොප් තාක්ෂණය භාවිතා කරන ජංගම බැංකුකරුවන් 120 අමතරව HDFC ගණුදෙනුකරුවන්ට දැන් දීප ව්‍යාප්ත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ATM 360 ක් හරහා සිය සේවාවන් ලබා ගත හැක.

### ගාස්තු පාදක ආදායම

අපගේ ආදායම් ධාරාවන් විවිධාංගීකරණය කිරීමේ ව්‍යායාමයේ දී 2011 වසරේ සිට වෙස්ටර්න් යුනියන් බැංකුව හරහා ප්‍රේෂණ වෙළෙඳපොළ තුළ අපගේ සේවාවන් ප්‍රසාරණය කිරීමට අවධානය යොමු කොට ඇත. 2012 වසරේ දී අප මෙම සේවාවන් සියලුම HDFC බැංකු දක්වා පුළුල් කරන ලදී. තවද අප ගාස්තු පාදක ආදායම් මාර්ගයක් ලෙස හා පාරිභෝගික පහසුව සලසා දීම බිල්පත් නිරවුල් කිරීමේ පහසුකම් සලසා දී ඇති අතර, අපගේ ජංගම බැංකු සේවක කණ්ඩායම හරහා නිවසටම මෙම සුවිශේෂී සේවාව සපයා දෙනු ලබයි.

### සේවක සමූහය

අන් කවර හෝ සේවා සංවිධානයක මෙන්ම අපගේ කාර්ය මණ්ඩලය අපගේ ඉහළම සම්පත වන අතර, කාර්ය මණ්ඩලයට අඛණ්ඩව පුහුණු කිරීම් හා දැනුම දියුණු කර ගැනීමේ අවස්ථාව සලසා දී ඇත. 2003 වසරේ විශේෂිත බැංකුවක් ලෙසට පරිවර්තනය වීමත් සමඟ නව බැංකු බලසීමාව යටතේ බැංකු නීති රීති, අවදානම් කළමනාකරණය සහ ගණුදෙනුකාර සේවා යන ක්ෂේත්‍ර යටතේ අපගේ කාර්ය මණ්ඩලයට නව හැඩග ැස්වීමක් හා යළි පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් මතු කොට දී ඇත. බැංකුවේ තරඟකාරීත්වය වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කුසලතා හා පුහුණුව හඳුනා ගැනීමේ ඇගයීමක් පවත්වන ලද අතර, අපගේ කාර්ය මණ්ඩලයට නිරතුරුව මහ බැංකුව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය වැනි විශේෂඥ ආයතන යටතේ පුහුණුව ලබා දෙයි. අවශ්‍යතාවයන් මත අපගේ කාර්ය මණ්ඩලය විදේශ පුහුණුවීම්වලට ද යොමු කොට ඇත.

ඉදිරි අභියෝග වශයෙන් මුහුණ දීමට සිදුවන තරඟකාරීත්වයට ප්‍රතිචාර දැක්වීමට අපගේ කුසලතා පදනම සවිමත් කිරීමක් ලෙසින් වෘත්තීය සුදුසුකම් ලබාගැනීමට අපගේ සේවක මණ්ඩලය දිරිමත් කරනු ලැබේ.

### ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය

HDFC බැංකුව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 20.8% වශයෙන් 2012 වසරේ දී සිය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය ලඟා කර ගෙන ඇති අතර, පිළිවෙලින් නියාමන අවශ්‍යතාවය වන 5% සහ 10% මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 21.5% ලෙසත් සපුරාගෙන ඇත.

නියාමන අවශ්‍යතාවය වන 20% හා සැසඳීමේ දී බැංකුව 25.2% ද්‍රවශීලතා අනුපාතයක් සාර්ථකව පවත්වාගෙන ඇත.

අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රුපියල් බිලියන 2.5 වර්ෂ 2013 දී සපුරා ගැනීමට අවශ්‍ය උපාය මාර්ග සංවර්ධනය කොට ඇත.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම. (IFRS)

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුගාමීව ත්‍රෛමාසික ප්‍රකාශන ප්‍රකාශයට පත් කළ ප්‍රථම බැංකුව HDFC බැංකුව වන අතර, 2012 බැංකුවේ අවසන් ගිණුම් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුගතව පිළියෙල කොට ඇත.

### තිළිණ / ඇගයීම්

HDFC බැංකුවේ සන්නිවේදන විනිවිදභාවය පිළිගැනීමට ලක්වෙමින් පවතින බව සතුටින් සඳහන් කර සිටිමි. HDFC බැංකුව අනුපිළිවෙලින් තෙවන වතාවටත් කුඩා පරිමාණ කාණ්ඩය යටතේ තිරසාර වාර්තාකරණය පිළිබඳ ˊකක් සම්මානය දිනාගෙන ඇත. 2011 වාර්ෂික වාර්තාව ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ ප්‍රමිතියට අනුගතව පිළියෙල කළ HDFC බැංකුවේ ප්‍රථම ඒකාබද්ධ වාර්තාව වන අතර, එය දේශීය බැංකු කර්මාන්තයේ ප්‍රථම වාර්තාව ද වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් සංවිධානය කරන ලද වාර්ෂික වාර්තා තරඟයේ දී මූල්‍ය ආයතන අංශයේ ලෝකඩ පදක්කම HDFC බැංකුව දිනා ගන්නා ලදී. තවද ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද "ව්‍යාපාර විශිෂ්ඨතා තිළිණ" (B.E.A.) තරඟයේ දී දෙවන ස්ථානය හිමි කර ගන්නා ලදී.

අපගේ කොටස්කරුවන් සඳහා වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් තහවුරු කරනු පිණිස ජාත්‍යන්තරව පිළිගත් තිරසාර මාර්ගෝපදේශවලට අනුගතව අපගේ සාංගමික සන්නිවේදන ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.




**පොළී ආදායම**




**ශුද්ධ පොළී ආදායම**

## ඉදිරි මග

මෙහෙයුම් අවදානම අඩු කර ගැනීම සඳහා තිරසාර විසඳුම විවිධාංගීකරණය බව අප විශ්වාස කරන අතර, ඉදිරි වර්ධනය සඳහා මං විවර කර ගනිමින් සිටී. ඒ අනුව අපගේ ව්‍යාපාර මෙහෙයුම් ප්‍රතිතුලනය කිරීම මගින් අපගේ ව්‍යාපාරික මොඩලය වෙනස් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. නිවාස මූල්‍යකරණය අපගේ ප්‍රධාන ව්‍යාපාරය ලෙස තව දුරටත් පවත්වාගෙන යන අතර, නව නිපැයුම් සහ සේවා හරහා බැංකුවේ කෙටිකාලීන වත්කම් පුළුල් කරමින් සිටින අතර, එමඟින් වැඩි මෙහෙයුම් නම්‍යතාවයක් වර්ධනය කර මෙහෙයුම් අවදානම විසිරීමට උපකාරී වේ.

2011 වසරේ HDFC පනත සංශෝධනය කිරීමත් සමඟ අපගේ ව්‍යාපාර මෙහෙයුම් විවිධාංගීකරණය කිරීමට හැකි වී ඇත. අපගේ නව පුළුල් මෙහෙයුම් බලතල මත අප රටේ බදුකර, ක්ෂුද්‍ර මූල්‍යකරණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා කෘෂිකාර්මික වෙළෙඳපොළට ඇතුල්වීමට සැලසුම් කොට ඇත. මේ කාර්යය සඳහා අප දැනටමත් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ අරමුදල් වැඩපිළිවෙලක් ආරම්භ කොට ඇති අතර, වැඩිදුර අරමුදල් සපයා ගැනීම සඳහා විශේෂඥ ආයතන සමඟ ගණුදෙනු කරමින් සිටී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය වැඩසටහන හරහා HDFC බැංකුව ක්ෂුද්‍ර මූල්‍යකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණය දීම සහ කෘෂිකාර්මික මූල්‍යකරණය සඳහා සවිමත් අඩිතාලමක් දමා ඇත.

ඉදිරි මූල්‍ය වසර තුළ අපගේ ඉහළ සාර්ථකත්වයක් ලබා ඇති රන් ණය වැඩ සටහන ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ඇත. අඩු පිරිවැය අරමුදල් සපයා ගැනීමේ අඛණ්ඩ ධාරාවක් ආරම්භ කර ක්‍රියාවට නැංවීමේ අරමුණ ඇතිව අපගේ ඉතිරි කිරීම් පදනම පුළුල් කිරීමට බැංකුවේ ප්‍රමුඛතාවය ලබා දෙයි. ඉදිරි වර්ධනයන් අවස්ථාවට ගැලපෙන ලෙස කටයුතු කිරීමට සහ දිනෙන් දින ඉහළ යන තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදීමට අපගේ පද්ධති, ක්‍රියාවලි සහ කුසලතා පදනම වැඩි දියුණු කරමින් 2013 වසරේ දී අපගේ මෙහෙයුම් ඒකාබද්ධ කිරීම කරගෙන යනු ඇත. මෙම ක්‍රියාවලියේ එක් කොටසක් වශයෙන් ප්‍රාදේශීය කළමනාකරුවන්ට ස්වයංතීරණ ගැනීමට වැඩි අවකාශ ලබාදෙමින් අපගේ ප්‍රාදේශීය කළමනාකාරීත්වය දැනටමත් සවිමත් කොට ඇත.

## ඇගයුම

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ ඇතුලු කාර්ය මණ්ඩලය විසින් වසර තුළ දී ලබා දුන් ඔවුනගේ වෘත්තීය මඟ පෙන්වීම වෙනුවෙන් මාගේ කෘතඥතාවය පිරිනමනු කැමැත්තෙමි. තවද මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්, විගණකාධිපතිතුමා හා ඔහුගේ කාර්ය මණ්ඩලය, නිවාස අමාත්‍යාංශය සහ ජාතික නිවාස

සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ලබා දුන් සහය අගේ කොට සලකමි. බැංකුව ඉහළ තලයකට රැගෙන ඒමේ කාර්යයේ දී මා කෙරේ තබන ලද විශ්වාස වෙනුවෙන් සහ ලබා දුන් අමිල උපදෙස් වෙනුවෙන් සභාපති ශිරෝමිණී වික්‍රමසිංහ මහත්මියටත්, බැංකුවේ අධ්‍යක්ෂවරුන්ටත් මාගේ උත්තම කෘතවේදීත්වය පළ කර සිටිමි.

තවද වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. තනතුරේ 2012 වසර කාල පරිච්ඡේදය තුළ සේවය කළ එස්. දිසානායක මහතාගේ කැපවීම හා දායකත්වය වෙනුවෙන් මාගේ ස්තුතිය පළ කර සිටිමි. වත්මන් තත්ත්වයට බැංකුව රැගෙන ඒමට දායක වූ අපගේ සාංගමික කළමනාකාරීත්වයටත් සියලු මට්ටම්වල සේවක සාමාජිකයින්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

සමාලෝචනයට භාජනය වූ වසර තුළ අපගේ කොටස්කරුවන් ඇතුලු අනෙකුත් කොටස්කරුවන් ලබා දුන් අනගි සහය අගයමි.

**නිමල් ජේ.බී. මාමඩුව**
සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි.

HDFC බැංකුව,
ශ්‍රී ලංකාව.






## අපේ දැක්ම සහ අපේ මෙහෙවර

### අපේ දැක්ම
ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන රටාව වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමේ පුරෝගාමී මූල්‍ය සේවා ආයතනය වීම අපේ දැක්මයි.

### අපේ මෙහෙවර
නිවාස සහ ඉදිකිරීම් කාර්යභාරය තුළ පවත්නා ගැටලු නිරාකරණය කර දෙමින් ඒ තුළ දීර්ඝකාලීන කොටස්කරුවකු වෙමින් ශ්‍රී ලාංකීය ආර්ථික සංවර්ධනයට විශ්වාසනීය ප්‍රමුඛත්වයකින් උර දීම.

### අපේ අරමුණු
**ගණුදෙනුකරුවා:**
ගණුදෙනුකරුවාට අවශ්‍ය සේවාවන් සැලකිලිමත්ව සලසා දීමත්, ඔවුන්ගේ අවශ්‍යතාවන් නිර්මාණාත්මකව විසඳා දීමත් බලාපොරොත්තු වූවාටත් වැඩි තෘප්තිමත් බවක් එමගින් ලබා දීම.

**කොටස්කරුවෝ:**
කොටස්කරුවන්ගේ අරමුදලට ප්‍රශස්ත ප්‍රාග්ධන ප්‍රතිලාභ ලබාදීම.

**සංවිධානය:**
සාංගමික සහ ව්‍යාපාරික ආචාර ධර්මයන්ගේ ඉහළම ප්‍රමිතීන්ට පිවිසෙමින් මූල්‍ය ස්ථාවරත්වය හා වර්ධනය පවත්වාගෙන යාම.

**රැකියා නියුක්තිකයින්:**
රැකියාවේ නියුතුව සිටින සේවක මණ්ඩලය දිරිමත් කිරීම හා ඔවුන් රැකියාවේ නිරතව සිටීමට දිරි ගැන්වීම.

**ජන සමූහය:**
ශ්‍රී ලාංකික ජන සමූහය වෙනුවෙන් සැමට නිවහනක් සැපයීමේ ජාතික ඉලක්කය තුළ කැපවීමෙන් ක්‍රියාත්මක වීම.

**කර්මාන්ත ව්‍යුහය:**
ජාත්‍යන්තර මට්ටමින් කර්මාන්ත ක්‍රියාවලිය පවත්වාගෙන යෑම සමඟම ගණුදෙනුකරුවාට අවශ්‍ය සේවාවන් මනා අවබෝධයකින් යුතුව මුළු කර්මාන්ත ක්‍රියාවලිය පුරාවට පවත්වාගෙන යාම.

**චර්යා ධර්ම:**
ප්‍රමුඛ සාංගමික පුරවැසියකු ලෙස උසස් චර්යා ධර්ම ප්‍රමිතීන් පවත්වා ගැනීම.

### සාර ධර්ම
සාර්ථකත්වයේ පදනම

**පාරදෘශ්‍යභාවය:**
වගකීම සහිත බව හා නොනැමෙන සුළු අවංක භාවය

**සාධාරණත්වය:**
ජයග්‍රාහකයන් ලෙස පාර්ශවකරුවන් දැකීම.

**විවෘතභාවය:**
එකිනෙකාට ගරුසරු දැක්වීම හා නිර්ව්‍යාජ ඕනෑකමක් පෙන්වීම.

# සාංගමික තොරතුරු

**නම සහ ලිපිනය :**
HDFC බැංකුව, (ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව)

**ලියාපදිංචිය හා ප්‍රධාන කාර්යාලය :**
ලිපිනය : තැ.පෙ. 2085, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන : 2356800, 2446241, 2446239, 2447354
ෆැක්ස් : 2446392, 2356829, 2356827
වෙබ් අඩවිය : www.hdfc.lk
ඊ මේල් : hdfc@sltnet.lk

**නෛතික තත්ත්වය :**
2003 අංක 15 දරණ පනතින් සහ 2011 අංක 45 දරණ පනතින් සංශෝධිත 1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව සංස්ථාපිත බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.

**කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීම :**
මෙම බැංකුවේ සාමාන්‍ය කොටස් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වී ඇත.

**අධ්‍යක්ෂ මණ්ඩලය :**
එස්.එන්. වික්‍රමසිංහ මිය (සභාපති)
ඩබ්.ජේ.එල්.යූ. විජේවීර මයා (අධ්‍යක්ෂ)
සී. විජේවර්ධන මිය (අධ්‍යක්ෂ)
ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මයා (අධ්‍යක්ෂ)
එස්.ඒ.ජේ. සමරවීර මයා (අධ්‍යක්ෂ)
ඒ.ජේ. ඇලෝසියස් මයා (අධ්‍යක්ෂ)
එල්.ඊ. සුසන්ත සිල්වා මයා (අධ්‍යක්ෂ)
ජී.එල්.එස්. සේනාධීර මයා (අධ්‍යක්ෂ)

**සමාගම් ලේකම් :**
දර්ශනී ද සිල්වා මිය
නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්, සමාගම් ලේකම්, දිවුරුම් කොමසාරිස්
දුරකථන : 2423362
ඊ මේල් : sectary@hdfc.lk

**සමාගම් ලේඛකාධිකාරී :**
එස්.එස්.පී. කෝපරේට් සර්විසස් (පුද්ගලික)
ලිපිනය : 101, ඇතුල්මල් පාර, කොළඹ 03.
දුරකථන : 2573894
ඊ මේල් : sspsec@sltnet.lk

**ඉදිකිරීම් සමාගමක් ලෙස සංස්ථාපිත වසර :**
1984

**බලයලත් විශේෂිත බැංකුවක් ලෙස :**
2003

**විගණක :**
විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.

**ණය ශ්‍රේණිගත කිරීම :**
සී / ස ෆිච් රේටින්ග්ස් ලංකා ආයතනය විසින් BBB + (lka) ලබා දී ඇත.

**බැංකුකරුවන් :**
ලංකා බැංකුව
ආයතන ශාඛාව, ඇච්ලන් චතුරශ්‍රය, කොළඹ 01.

සම්පත් බැංකුව
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

මහජන බැංකුව
කමර්ෂල් හවුස්, යුනියන් පෙදෙස ශාඛාව, කොළඹ 02.

සී/ස ලංකා කොමර්ෂල් බැංකුව
කමර්ෂල් හවුස්, යුනියන් පෙදෙස ශාඛාව, කොළඹ 02.

**සාංගමික කළමනාකාරීත්වය**
නිමල් ජේ.බී. මාමඩුව මයා - ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී
එස්. දිසානායක මයා - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
ඩී.වී. පතිරණ මයා - ප්‍රධාන මූල්‍ය නිලධාරී
ඩබ්.එම්.ඒ. බණ්ඩාර මයා - ප්‍රධාන තොරතුරු නිලධාරී
ඒ.ජේ. අතුකෝරාළ මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක
එල්. එදිරිසිංහ මයා - ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පාලන)
ඩබ්.ඩබ්.ඩී.එස්.සී. පෙරේරා මිය - ප්‍රධාන කළමනාකරු (නීති)
එච්.එස්. ගුණතිලක මිය - ප්‍රධාන කළමනාකරු (ව්‍යාපාර සංවර්ධන සහ අලෙවි)
සී.ආර්.පී. බාලසූරිය මයා - ප්‍රධාන කළමනාකරු (භාණ්ඩාගාර)
ඩී.එම්.ඩී.එම්.කේ. දිසානායක මයා - ප්‍රධාන කළමනාකරු (ණය)

**ආයෝජන තොරතුරු**
ඩී. විදානපතිරණ මයා - ප්‍රධාන මූල්‍ය නිලධාරී
දුරකථන : 2356800, 2446241, 2446239, 4717864
ෆැක්ස් : 2356829
ඊ මේල් : cfo@hdfc.lk

## අධ්‍යක්ෂ මණ්ඩලය




1. ඒ.ජේ. ඇලෝසියස් මහතා
(විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

2. ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මහතා
(විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

3. ජී.එල්.එස්. සේනාධීර මහතා
(විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)

4. එස්.එන්. වික්‍රමසිංහ මිය
සභාපති (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)

5. එල්.ර්. සුසන්ත සිල්වා මහතා
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

6. එස්.ඒ.ජේ. සමරවීර මහතා
(විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

7. සී. විජේවර්ධන මිය
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

8. ඩබ්.ජේ.එල්.යූ. විජයවීර මහතා
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

### එස්.එන්. වික්‍රමසිංහ මහත්මිය
(සභාපති (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)

සිරෝමී වික්‍රමසිංහ මහත්මිය HDFC බැංකුවේ සභාපති වශයෙන් 2010 මැයි මාසයේ පත් කරන ලදී.

මෙතුමිය හැටන් නැෂනල් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි. කමර්ෂල් බැංකුවේ අධ්‍යක්ෂ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ අධ්‍යක්ෂ ආදී වශයෙන් මූල්‍ය ආයතන රැසක ජ්‍යේෂ්ඨ තනතුරු හොබවා ඇත.

තවද ඇය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ද සී/ස සී බෑන්ක් ඇසට් මැනේජ්මන්ට් (පුද්ගලික) ආයතනයේ (ලංකා බැංකුවේ අනුබද්ධ සමාගමක්) සභාපති වශයෙන් ද සේවය කොට ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක සහ දිවුරුම් කොමසාරිස්වරියක වන ඇය වරලත් කළමනාකරණ ආයතනයේ සාමාජිකාවක් ද වෙයි.

### ඩබ්.ජේ.එල්.යූ. විජේවීර මහතා
(විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)

උපාලි විජේවීර මහතා HDFC බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස 2006 ජූනි මස පත් වූ අතර, කම්කරු හා කම්කරු සම්බන්ධතා අමාත්‍යාංශයේ ලේකම් ලෙස ද කටයුතු කරයි. බහු ජාතික රැකී රක්ෂා සුරැකුම් හා සෞඛ්‍ය ආයතනයේ, ශ්‍රම වාසනා අරමුදලේ සහ ජාතික කම්කරු අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂක ධුර හොබවයි. 1984 ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වූ මෙතුමා 1985 කම්කරු දෙපාර්තමේන්තුවට පත්වීම් ලැබ සහකාර කම්කරු කොමසාරිස්, ජ්‍යේෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස් සහ කම්කරු කොමසාරිස් ජනරාල් වශයෙන් වැදගත් තනතුරු ගණනාවක්ම හොබවන ලදී. 1997 වසරේ කුවේට් රාජ්‍යයේ ශ්‍රී ලංකා කොන්සල්වරයා වශයෙන් ද 1990 වසරේ දී සෞදි අරාබියේ කොන්සල්වරයා ලෙස ද සේවය කොට ඇත. 2000 වසරේ දී කම්කරු ප්‍රමිති කොමසාරිස්වරයා ලෙස පත් කරන ලදී. 2009 සිට 2010 දක්වා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ලෙස සේවය කළ මෙතුමා කම්කරු හා කම්කරු සම්බන්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස ද සේවය කරයි. ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු ද වන මෙතුමා කැලණිය විශ්ව විද්‍යාලයේ විශේෂ වාණිජවේදී උපාධිධාරියකු මෙන්ම රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකි.

### සී. විජේවර්ධන මහත්මිය
(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)

චාන්දනී විජේවර්ධන මහත්මිය රුහුණු විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිධාරිනියක් (1992) වන අතර, නෙදර්ලන්තයේ සමාජ අධ්‍යයන ආයතනයේ, සංවර්ධන අධ්‍යාපනය පිළිබඳ (2000) ශාස්ත්‍රපති උපාධිලාභියෙකි. 2010 වසරේ ජූනි මස මෙතුමිය HDFC බැංකුවේ අධ්‍යක්ෂ ධුරයට පත් විය. දැනට ඇය මුදල් අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක ලෙස සේවය කරයි. 1994 සහකාර අධ්‍යක්ෂවරියක ලෙස ශ්‍රී ලංකා සැලසුම් සේවයට ඇතුළත් වූ අතර, ඊට පෙර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ වසර 10 ක් ද, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වසර 6 ක් ද සේවය කොට ඇත. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ඇයගේ රාජකාරිවලට අමතර වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ භාණ්ඩාග ාර නියෝජිත ලෙස සේවය කරයි. ඇය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කරයි.

### ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මහතා
(විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

2010 ජූනි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වූ රාජා ගුණරත්න මහතා බැංකුවේ ප්‍රධානතම කොටස්කරුවකු වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියෝජනය කරනු ලබන HDFC බැංකුවේ ඡන්දයෙන් පත් වූ අධ්‍යක්ෂවරයෙකි. ඔහු විවෘත විශ්ව විද්‍යාලයේ මානව හා සමාජ විද්‍යා පීඨයේ නීතිය පිළිබඳ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙකි. දැනට ඔහු ජාතික නිවාස කොමසාරිස්වරයා ලෙස සේවය කරයි. කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී ගෞරව උපාධිධාරියකු, ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයේ නීතිපති උපාධිධාරියකු මෙන්ම අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි. තවද ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස ද වෘත්තීය සුදුසුකම් ලබා ඇති අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

### එස්.ඒ.ජේ. සමරවීර මහතා
(විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

ජයන්ත සමරවීර මහතා 2010 ජූනි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් වූ අතර, දැනට ඔහු ජාතික නිවාස සංවර්ධන මණ්ඩලයේ සභාපති ලෙස ද, තේ, රබර් සහ පොල් වතු පාලන හා කැබලි කිරීමේ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස ද, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවරයකු ලෙස ද සේවය කරයි. 2004 සිට 2010 දක්වා කාලය තුළ ඔහු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ද සේවය කොට ඇත. 1999 වසරේ දී බස්නාහිර පළාත් සභාවේ සාමාජිකයකු ලෙස ඡන්දයෙන් පත් විය.

### ඒ.ජේ. ඇලෝසියස් මහතා

(විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

අර්ජුන් ඇලෝසියස් මහතා HDFC බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වූයේ 2011 මැයි මාසයේ දී ය. දැනට ඔහු සී/ස ඩබ්.එම්. මෙන්ඩිස් සමාගමේ සභාපති වශයෙන් ද, සී/ස පර්පැචුවල් කැපිටල් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද, සී/ස පර්පැචුවල් ඇසට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ද කටයුතු කරයි. ඔහු ෆිරී ලංකා ගෲප් ආයෝජන අංශයේ ප්‍රධානියා ලෙස සේවය කරයි. අර්ජුන් ඇලෝසියස් මහතා ඔස්ට්‍රේලියාවේ බොන්ඩ් විශ්ව විද්‍යාලයේ මූල්‍ය විෂය පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයෙකි. ෆිරී ලංකා සමූහ ව්‍යාපාරයේ ජ්‍යේෂ්ඨ උපදේශකයකු වශයෙන් ඔහු සිය වෘත්තීය දිවිය ආරම්භ කරන ලදී.

### එල්.ඊ. සුසන්ත සිල්වා මහතා

(විධායක නොවන - ස්වාධීන අධ්‍යක්ෂ)

සුසන්ත සිල්වා මහතා HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූයේ 2012 මැයි මාසයේ දී ය.

සිල්වා මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ දෙවන පංතියේ (ඉහළ පෙළ) වාණිජවේදී උපාධිධරයකු වන අතර, වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ද, සහතික ලත් කළමනාකාර ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ද, සහතික ලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ ද සාමාජිකත්වය උසුලයි.

දැනට ඔහු ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ ධූරය හොබවන අතර, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දේශීය මෙන්ම විදේශීය පුළුල් අත්දැකීම් ඇත්තෙකි.

### ජී.එල්.එස්. සේනාධීර මහතා

(විධායක නොවන - ස්වාධීන අධ්‍යක්ෂ)

සුනිල් සේනාධීර මහතා 2013 ජනවාරි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස පත් විය. ඔහු දැනට (නිවාස හා සංවර්ධන) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස සේවය කරයි. ශ්‍රී.ල.ස.සේ. I - ශ්‍රේණියේ නිලධාරියකු වන ඔහු ජා ඇල නගර සභාවේ ලේකම්වරයා ලෙස 1985 දී සිය වෘත්තීය දිවිය අරඹන ලදී. ඔහු නාරම්මල ප්‍රාදේශීය ලේකම්වරයා වශයෙන්, රාජාංගනය ප්‍රාදේශීය ලේකම්වරයා ලෙස ද සේවය කොට ඇත. සබරගමුව පළාත් සභාවේ සමූපකාර කොමසාරිස්වරයා ලෙස ද, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්වරයා ලෙස ද, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා ලෙස ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලක ලෙස ද තනතුරු රාශියක්ම උසුලා ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී (දෙවන පෙළ) උපාධිධාරියකු වන අතර, කැලණිය විශ්ව විද්‍යාලයේ (සමාජ විද්‍යා) ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ඇත.

# සාංගමික කළමනාකරණය














### 1. නිමල් මාමඩුව

ප්‍ර.වි.නි. / සාමාන්‍යාධිකාරී

වාණිජ හා සංවර්ධන බැංකුකරණය පිළිබඳ 38 වසරක අත්දැකීම් සතු ජ්‍යෙෂ්ඨ වෘත්තීය බැංකුකරුවෙකි. හැටන් නැෂනල් බැංකුවෙන් සිය වෘත්තීය දිවිය ඇරඹූ ඔහු 29 වසරක හැටන් නැෂනල් බැංකු සේවා කාලය තුළ ණය, සංවර්ධන බැංකුකරණය සහ මෙහෙයුම් යන ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ තනතුරු ගණනාවක්ම හොබවා ඇත. 2003 වසරේ දී හැටන් නැෂනල් බැංකුවෙන් ඉවත් වී සණස සංවර්ධන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (ණය) ලෙස පත්වුණු අතර, 2005 වසරේ දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට 2006 ජුනි මස ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී තනතුරට ද උසස්වීම් ලැබ 2012 ඔක්තෝම්බර් මස දක්වා එම තනතුරේ සේවයේ නිරත විය. මෙම 06 වසරක කාලය තුළ වැඩි පිළිගැනීමක් නොතිබුණු සණස බැංකුව ශාඛා 25 සිට ශාඛා 85 දක්වා ශාඛා ජාලය ප්‍රසාරණය කරමින් ප්‍රබල සංවර්ධන බැංකුවක් බවට පරිවර්තනය කරන ලදී. ඔහු විශාල වශයෙන් විදේශ සංචාරවල නිරතව ඇති අතර, ක්ෂුද්‍ර මූල්‍ය අංශයට අදාළව කැනඩාව, නෙදර්ලන්තය, වියට්නාමය සහ චීනය යන රටවල පැවති විවිධ වැඩමුළුවලට සහභාගී වෙමින් සණස සංවර්ධන බැංකුව නියෝජනය කොට ඇත. ඔහු 2013 ජනවාරි 1 දින HDFC බැංකුවේ ප්‍ර.වි.නි. / සාමාන්‍යාධිකාරී වශයෙන් වැඩ බාර ගන්නා ලදී. ඔහු ණය කළමනාකරණ ආයතනයේ සාමාජිකයකු වන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු මෙන්ම එක්සත් රාජධානියේ වරලත් කළමනාකාරවරුන්ගේ ආයතනයේ ද සාමාජිකයෙකි.

### 2. එස්. දිසානායක මහතා

ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

දිසානායක මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධරයෙකි. ඔහු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රවල 25 වසරකට වඩා වැඩි අත්දැකීම් ලැබුවෙකි. ඔහු රාජ්‍ය අංශයේ ආයතනවල මූල්‍ය අංශයේ ප්‍රධානියා ලෙස වසර ගණනක සේවා පළපුරුද්දක් ලබා ඇත. ඔහු 1995 වසරේ දී සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) වශයෙන් HDFC බැංකුවට එක් වූ අතර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ වැඩ බාරගත් දින සිට මුදල් අංශයේ ප්‍රධානියා ලෙස වසර 11 කට වැඩි කාලයක සිට සේවය කරයි. මෙම තනතුරට අමතරව ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තනතුරේ ද වසර දෙකක කාලයක් වැඩ බැලීම සිදු කොට ඇත. වසර ගණනක සිට ණය අංශය, ආපසු අය කර ගැනීමේ අංශය, පාලන අංශය, ශාඛා මෙහෙයුම් අංශය ඔහුගේ අධීක්ෂණය යටතේ පැවතුණි. දැනට ඔහු බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා ලෙස සේවය කරයි.

### 3. ඩී. විදාන පතිරණ මහතා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

විදාන පතිරණ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ද (FCA) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකාර ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ද (FCMA) ශ්‍රී ලංකා වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ ද සාමාජිකත්වයන් උසුලයි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයකු වන අතර, තිරසාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිධරයෙකි. දේශීය හා විදේශීය වශයෙන් විගණනය, ගිණුම්කරණය, බැංකුකරණය, ව්‍යාපෘති සහ ආයෝජන ප්‍රවර්ධන ක්ෂේත්‍රයන්හි 27 වසරක පළපුරුද්දක් සතු වේ. ඔහු දැනට බැංකුවේ මූල්‍ය හා සැලසුම් දෙපාර්තමේන්තුවේ වගකීම් භාරය උසුලයි.

### 4. ඩබ්.එම්.ජ්. බණ්ඩාර

ප්‍රධාන තොරතුරු නිලධාරී

ඩබ්.එම්.ජී. බණ්ඩාර මහතා HDFC බැංකුවේ තොරතුරු තාක්ෂණය පිළිබඳ සහකාර සාමාන්‍යාධිකාරීවරයා වේ. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලැබ ස්කොට්ලන්ත ස්ටර්ලින් විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත. ඔහුට තොරතුරු තාක්ෂණ වෘත්තිකයකු ලෙසින් වසර 20 කට අධික පළපුරුද්දක් ඇති අතර, ඉන් වසර 05 ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වේ. ඔහුට ඔහඝඩ ක්‍රමයේ පුළුල් පරාසයක් තුළ සවි කිරීමේ අනුපිළිවෙල සැකසීම සහ නඩත්තුව දත්ත ගබඩා ජාල පරිපාලන ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීමක් සතු වේ. ඔහු ක්‍ෂකක ජපානය සහ ෂර්ච මැලේසියාව වැනි ජාත්‍යන්තර සංවිධාන විසින් මෙහෙයවන තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රමුඛ පුහුණු පාඨමාලාවන්ට සහභාගී වී ඇත. තවද ඔහු වසරක කාලයක් ජපානයේ භෑඝ ආයතනයේ සේවය කොට ඇත.


6


7


8


9


10

### 5. ඒ.ජේ. අතුකෝරාල මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

2009 වසරේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත්වීම් ලද අතුකෝරාල මහතාට බැංකු ක්ෂේත්‍රය තුළ වසර 25 කට අධික පළපුරුද්දක් ඇත. විගණන අංශයෙන් විශේෂඥතා දැනුමක් හිමි කර ගෙන ඇති ඔහු රාජ්‍ය හා පෞද්ගලික බැංකු ගණනාවක සේවය කොට ඇත. කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යා උපාධිධරයකු වන ඔහු වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. (CIMA UK) ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයෙන් ප්‍රදානය කරන ලද පරිගණක පද්ධති සැලසුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා ලාභියෙකි. තවද තොරතුරු පද්ධති විගණන හා පාලන ආයතනයෙන් "සහතිකලාභී තොරතුරු පද්ධති පිළිබඳ විගණක" සහ " සහතිකලාභී තොරතුරු සුරැකුම් කළමනාකරු" යන නාමයන් ප්‍රදානය කොට ඇත.

### 6. එල්. එදිරිසිංහ මහතා

ප්‍රධාන කළමනාකරු - මානව සම්පත් හා පාලන

ලෙස්ලි එදිරිසිංහ මයා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියෙකි. පසුව ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනයේ සාමාජිකත්වය උසුලන අතර, ඔහුගේ විශේෂ සාමාර්ථය රැඳී පවතිනුයේ මානව සම්පත් කළමනාකරණය, පුහුණුව හා සංවර්ධනය යන අංශවලය. ඔහුට දේශීය මෙන්ම විදේශීය වශයෙන් පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකෙහිම මානව සම්පත් කළමනාකරණය පුහුණුව සහ සංවර්ධනය පිළිබඳ හසල අත්දැකීම් ඇත්තෙකි.

### 7. ඩබ්.ඩබ්.ඩී.එස්. පෙරේරා මහත්මිය

ප්‍රධාන කළමනාකරු - නීති

සුදර්ශිනී පෙරේරා මහත්මිය වෘත්තියෙන් නීතීඥවරියකි. 1992 නීති නිලධාරියකු ලෙස HDFC බැංකුවට බැඳුණු ඇය, 2001 වර්ෂයේ දී නීති කළමනාකරණ තනතුරට උසස්වීමක් ලැබුණි. නිවාස මූල්‍යකරණය, බැංකුකරණය සහ නඩු කටයුතු යන ක්ෂේත්‍ර විශේෂ කොට විසි වසරකට අධික වෘත්තීය පළපුරුද්දක් ඇය සතු වේ. ඇය දේශීය මෙන්ම විදේශීයවත් නායකත්වය, බැංකුකරණය, බැංකු නීතිය පිළිබඳ විවිධ සම්මන්ත්‍රණ සහ වැඩමුළු රැසකට සහභාගී වී ඇත. ඇය දැනට නීති අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතර, බැංකුවේ සියලුම නෛතික කටයුතු පිළිබඳව වගකීමට බැඳී සිටී.

### 8. එච්.එස්. ගුණතිලක මහත්මිය

ප්‍රධාන කළමනාකරු - ව්‍යාපාර සංවර්ධන හා අලෙවි

හිමාලි ගුණතිලක මහත්මිය HDFC බැංකුවේ ව්‍යාපාර සංවර්ධන හා අලෙවි අංශයේ ප්‍රධාන කළමනාකාරිනිය ලෙස සේවය කරයි. ඇය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලැබ නිවාස අධ්‍යාපනය (දැනට නෙදර්ලන්තයේ ඉරස්මුස් විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධ කොට ඇත) ආයතනයේ නාගරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත. තවද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත. ඇය පෞද්ගලික මෙන්ම රාජ්‍ය අංශයේ නිවාස විෂය පිළිබඳව වසර 30 කට අධික පළපුරුද්දක් ලබා ඇති අතර, දේශීය මෙන්ම විදේශීය වශයෙන් පුහුණු වැඩසටහන් ගණනාවකටම සහභාගී වී ඇත. ඇය 1991 වසරේ දී HDFC බැංකුවට එක් වූ අතර, දැනට බැංකුවේ ව්‍යාපාර සංවර්ධනය හා අලෙවිය සම්බන්ධයෙන් වගකීම් භාරය දරයි.

### 9. සී.ආර්.පී. බාලසූරිය මහතා

ප්‍රධාන කළමනාකරු - භාණ්ඩාගාර

බාලසූරිය මහතා ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණවේදීන්ගේ ආයතනයේ ඒඕ සාමාජිකත්වය උසුලන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් පවත්වනු ලබන අවසන් පළමු කොටස විභාගය සම්පූර්ණ කොට ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිය ලබා ඇති අතර, වෙළඳ හා විශේෂිත බැංකු ක්ෂේත්‍රයේ දශක දෙකකට අධික වෘත්තීය පළපුරුද්දක් ඇත. දැනට ඔහු බැංකුවේ භාණ්ඩාගාර කළමනාකරණ කටයුතු පිළිබඳ වගකීම දරයි.

### 10. මංජුල කිත්සිරි දිසානායක මහතා

ප්‍රධාන කළමනාකරු - ණය

දිසානායක මහතා ණය සහ මූල්‍යකරණ ක්ෂේත්‍රයේ වසර 15 ක හසල අත්දැකීම් ඇත්තෙකි. HDFC බැංකුවට සම්බන්ධවීමට ප්‍රථම ඔහු ණය විෂය භාර නිලධාරී, ගිණුම් කළමනාකරු, ජ්‍යෙෂ්ඨ ගිණුම් හා මෙහෙයුම් කළමනාකරු වශයෙන් විවිධ පෞද්ගලික අංශයේ ආයතනවල සේවය කොට ඇත. ඔහුට විගණනය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, මෙහෙයුම් හා ණය කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ඇත. දැනට ඔහු බැංකුවේ ණය කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

මංජුල දිසානායක මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.

# ජාතික ආර්ථික වගකීම

## අපගේ ප්‍රවේශය

HDFC බැංකුවේ ආර්ථික වගකීම අපගේ ප්‍රධානම පාර්ශවකරුවා වන රජය විසින් ඉදිරිපත් කොට ඇති පුළුල් පදනමක පිහිටි සාංගමික අරමුණු පදනම් කර ගනී. බැංකුව සංස්ථාපිත කිරීම සඳහා වූ පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත කොට ඇති පරිදි HDFC බැංකුවේ මූලික අරමුණ වනුයේ නිවාස ඉදිකිරීම, මිලට ගැනීම්, නිවාස සංවර්ධනය කර ගැනීම් සහ ඒ හා සම්බන්ධිත අවශ්‍යතාවයන් සඳහා මූල්‍ය පහසුකම් සැලසීම වේ. ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න නිවසකට උරුමකම් කීම පුද්ගලයකුගේ කායික, මානසික මෙන්ම HDFC බැංකුව හරහා දැරිය හැකි නිවාස මූල්‍ය පහසුකම් සැලසීම පිළිබඳ රජයේ අපේක්ෂාවන් එලගැන්වීම හේතු සාධක වන බැවින් රටේආර්ථික සුබසිද්ධිය සඳහා ද උපකාරී වේ.

## සහස්‍ර සංවර්ධන ඉලක්ක (MDGS)

සහස්‍ර සංවර්ධන ඉලක්ක මගින් ගණනය කොට සන්නිවේදනය කොට ඇති පරිදි ආර්ථික, පාරිසරික හා සමාජීය වශයෙන් දැරිය හැකි යෝග්‍ය නිවාසකරණය, මාන කිහිපයක් ඔස්සේ ජීවිතයේ භෞතික ගුණාත්මකභාවය මෙන්ම රටක ආර්ථික වර්ධනය උදෙසා උපකාරී වේ. රජයේ ප්‍රමුඛ සංවර්ධන හවුල්කරුවකුවන HDFC බැංකුව මෙම ඉලක්ක ලඟා කර ගැනීම සඳහා සහය වීමේ කාර්යයේ නියැලී සිටී. නිවසේ බඩු භාණ්ඩවල සිට විදුලිය, ජලය, සනීපාරක්ෂාව, ගුවන් විදුලි රූපවාහිනී යන්ත්‍ර සතුවීම ආදී විශේෂයෙන්ම 1980 සිට වර්ධනය වූ නිවාසවල ගුණාත්මකභාවයේ ඇති වූ තිරසාර වර්ධනය මෙම ඉලක්ක ලඟා කර ගැනීමට සැලකිය යුතු අයුරින් දායක වී ඇත.

පූර්ණ කේන්ද්‍රගත නිවාස මූල්‍ය ආයතනයක් ලෙසින් HDFC බැංකුව දැරිය හැකි නිවාස මූල්‍ය පහසුකම් ලබාදීම මගින් නිවාසවල ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ ක්‍රියාවලියේ අඛණ්ඩව කැප වී සිටින අතර, සියලුම ආගමික හා ආර්ථික අංශයන්ට එක සමානව සලකමින් ජාතියේ සහස්‍ර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමේ ව්‍යායාමයේ ලා දායක වේ. මෙම සන්දර්භය තුළ ආර්ථික කාර්ය සාධනය පිළිබඳ අපගේ උපාය මාර්ගික ප්‍රවේශය පහත දිශාන්තයන් තුළ ප්‍රදර්ශනය කොට ඇත.

- නිර්මිත සෘජු ආර්ථික වටිනාකම
- ජාතික නිවාස ස්කන්ධය වර්ධනය කිරීම සහ අඩු වරප්‍රසාදලාභී කණ්ඩායම් සඳහා නිවාස හිමිකම උරුම කරදීම හරහා මානව ජනාවාස සමානව ලඟා කර දීම ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රාදේශීය මට්ටමින් සේවා හා සම්පත් එක හා සමාන අයුරින් බෙදා හැරීම මගින් සංවර්ධන විෂමතාවයන් අවම කර ගැනීමට සහාය වීම.
- බැංකු ගණුදෙනු පිළිබඳ පුරුදු හා මූල්‍ය කරුණු පිළිබඳ අවබෝධය ක්‍රමිකව වර්ධනය කිරීම ඔස්සේ ආර්ථික සවිබල ගැන්වීම සඳහා දායක වීම.
- ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වන රජයේ විශේෂ සංවර්ධන මූලාරම්භයන්ට දායකවීම.
- අපගේ ආර්ථික වගකීම ඉහත සඳහන් ප්‍රතිපත්ති සහ රටේ නිවාස මූල්‍ය වෙළෙඳපොළේ ප්‍රමුඛයා ලෙසින් පසුගිය වසර 26 කට අධික කාලයක් තුළ අපගේ සමාජ බලපත්‍රයේ ව්‍යවස්ථාපිත නියමයන් මුල් කොට ගෙන ඇත.

## ප්‍රතිපත්ති හා පාලනය

2003 අංක 15 දරණ පනතින් සංශෝධිත 1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් ව්‍යවස්ථාපිත කොට ඇති පරිදි සාංගමික අරමුණු යටතේ නිර්වචනය මගින් අපගේ මූඛ්‍ය ආර්ථික වගකීම පැහැදිලි කෙරේ. රජයේ නිවාස ප්‍රතිපත්තිය හා ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන මූලාරම්භයන්ට සමගාමීව මහා භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ආර්ථික නියමයන්ට HDFC බැංකුවේ ක්‍රියාකාරකම් යටත් වේ. මෙහෙයුම් අවදානම සහ කර්මාන්තයේ ප්‍රමිතිය පවත්වා ගෙන යෑමට සමගාමීව ඉහත සඳහන් පුළුල් පදනමක් යටතේ වන අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී අභ්‍යන්තර ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ පිළියෙල කොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. මෙම ප්‍රතිපත්ති කළමනාකරණ කාරක සභා ගණනාවක් විසින් ක්‍රියාවට නංවනු ලබයි. HDFC බැංකුවේ පනත සහ ප්‍රතිපත්ති නියමයන් www.gosl.lk , www.cbsl.lk සහ බැංකුවේ සාංගමික වෙබ් අඩවිය වන www.hdfc.lk දැක ගත හැක.

*ප්‍රමුඛ කාර්ය සාධන දර්ශකයන් - ජාතික ආර්ථික වගකීම*

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| ආර්ථික වටිනාකම් එකතු කිරීම | ශ්‍රී.ල.රු.මි. | % | ශ්‍රී.ල.රු.මි. | % |
| පොළී ආදායම | 2,635 | 98 | 2,260 | 94 |
| අනෙකුත් ආදායම් | 57 | 2 | 125 | 6 |
| එකතුකළ මුළු ආර්තික වටිනාකම | **2,692** | **100** | **2,385** | **100** |
| එකතුකළ ආර්ථික වටිනාකම් බෙදී යාම | | | | |
| භාණ්ඩ හා සේවා සපයන්නන්ට | 2,051 | 76 | 1,564 | 66 |
| සේවකයින්ට | 458 | 17 | 345 | 15 |
| රජයට | 123 | 5 | 189 | 8 |
| කොටස්කරුවන්ට (ලාභාංශ) | 0 | 0 | 0 | 0 |
| රඳවා ගැනීම් (ක්ෂය, ණය පාඩු ප්‍රතිපාදන, රඳවා ගත් ලාභය) | 60 | 2 | 244 | 10 |
| එකතුකළ මුළු වටිනාකම් බෙදී යාම | **2,692** | **100** | **2,374** | **100** |

| | 2012 | | 2011 | |
|---|---|---|---|---|
| රජයේ ආයෝජන මත මූල්‍ය ලැබීම් ශ්‍රී.ල.රු.මි. | | | | |
| බදු | 123 | | 189 | |
| ලාභාංශවලින් 5% | 0 | | 0 | |
| රජයට මුළු මූල්‍ය ලැබීම් | 123 | | 189 | |
| රජයේ ආයෝජන (කොටස්කරුවන්ගේ අරමුදලින් 51%) | 1,219 | | 1,084 | |
| රජයේ ආයෝජනයට ප්‍රතිශතයක් ලෙස ලැබීම් | 10% | | 19% | |
| මානව නිවාස ප්‍රවර්ධනය | | | | |
| ජාතික නිවාස ස්කන්ධය සහ කුටුම්භ හිමිකම පිළිබඳ ඒකරාශී සේවා ප්‍රවර්ධනය | | | | |
| 2011.12.31 දින තෙක් දෙන ලද මුළු ණය සංඛ්‍යාව | 156,563 | | 144,159 | |
| 2011.12.31 දිනතෙක් දෙන ලද මුළු ණය වටිනාකම ශ්‍රී.ල.රු.මි. | 31.83 | | 28.23 | |
| නව නිවාස ඉදි කර ගැනීමට සහය වූ පවුල් සංඛ්‍යාව | 10,024 | | 12,142 | |
| අනෙකුත් නිවාස කාර්යයන්හි දී සහය වූ පවුල් සංඛ්‍යාව | 2,380 | | 2,082 | |
| නිවාස කාර්යයන්හි දී සහය වූ මුළු පවුල් ගණන | 12,404 | | 14,224 | |
| වසර තුළ දී අනුමත කළ ණය වටිනාකම ශ්‍රී.ල.රු.මි. | 3,599 | | 4,659 | |
| වසර තුළ දී අනුමත කළ සාමාන්‍ය ප්‍රමාණයේ ණය ශ්‍රී.ල.රු.මි. | 0.29 | | 0.33 | |
| | | | | |
| දෙන ලද ණය සේවා කාර්ය අනුව බෙදීයාම | ශ්‍රී.ල.රු.මි | % | ශ්‍රී.ල.රු.මි | % |
| ඉදි කිරීම් | 2,833 | 79 | 3,594 | 75 |
| මිළ දී ගැනීම් | 323 | 9 | 573 | 12 |
| නිදහස් කර ගැනීම් | 112 | 3 | 64 | 1 |
| අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් | 71 | 2 | 290 | 6 |
| ජීවන රටා අවශ්‍යතාවයන් | 260 | 7 | 240 | 5 |
| මුළු වටිනාකම | 3,599 | 100 | 4,762 | 100 |
| සංවර්ධන අසමානතාවයන් අවම කර ගැනීමට සහය වීම | | | | |
| අවශ්‍ය කාණ්ඩ සඳහා සේවා - ණය සංඛ්‍යාව | ණය | % | ණය | % |
| අඩු ආදායම්ලාභී කාණ්ඩය (LIG) | 7,091 | 57 | 4,823 | 34 |
| මධ්‍යම ආදායම්ලාභී කාණ්ඩය (MIG) | 2,831 | 23 | 4,894 | 34 |
| පුළුල් ආදායම්ලාභී කාණ්ඩය (WIG) | 2,482 | 20 | 4,507 | 32 |
| මුළු ණය ප්‍රමාණය | 12,404 | 1.00 | 14,224 | 100% |

| | ණය | | ණය | |
|---|---|---|---|---|
| විවිධ අංශ අනුව සේවා බෙදී යෑම | ශ්‍රී.ල.රු.මි | % | ශ්‍රී.ල.රු.මි | % |
| සේවා | 2,781 | 77% | 3,560 | 75 |
| කර්මාන්ත | 545 | 15% | 824 | 17 |
| කෘෂිකර්මාන්ත | 269 | 7% | 371 | 8 |
| අනෙකුත් | 4 | 0% | 7 | 0 |
| මුළු | 3,599 | 100 | 4,762 | 100 |
| පළාත් අනුව සේවා බෙදී යෑම - ණය සංඛ්‍යාව | ණය | % | ණය | % |
| බස්නාහිර | 5,058 | 41 | 5,740 | 40 |
| මධ්‍යම | 2,243 | 18 | 2,775 | 20 |
| දකුණු | 1,085 | 9 | 1,188 | 8 |
| නැගෙනහිර | 1,199 | 10 | 809 | 6 |
| ඌව | 766 | 6 | 819 | 6 |
| උතුරු මැද | 317 | 3 | 475 | 3 |
| සබරගමුව | 903 | 7 | 1,369 | 10 |
| වයඹ | 791 | 6 | 880 | 6 |
| උතුරු | 42 | 0 | 169 | 1 |
| මුළු ණය | **12,404** | **100** | **14,224** | **100** |
| කොළඹින් බැහැර සේවා සැපයුම | ණය | % | ණය | % |
| කොළඹ දිස්ත්‍රික්කයෙන් පිට අනුමත ණය සංඛ්‍යාව | 9,989 | 81 | 11,279 | 79 |
| බස්නාහිර පළාතෙන් බැහැරව අනුමත ණය සංඛ්‍යාව | 7,346 | 59 | 6,239 | 60 |
| කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් බැහැර අනුමත ණය සංඛ්‍යාව | 8,344 | 67 | 9,770 | 69 |
| උතුරු හා නැගෙනහිර පළාත්වලට අනුමත කළ ණය සංඛ්‍යාව | 2,349 | 19 | 1,850 | 13 |
| රැකියා උත්පාදනය සහ දිළිඳුකම පිටු දැකීම | | | | |
| සපයා ඇති සෘජු රැකියා සංඛ්‍යාව | 488 | | 505 | |
| ආර්ථිකය තුළ ජනිත කළ වක්‍ර රැකියා සංඛ්‍යාව | 9,969 | | 13,180 | |
| මූල්‍ය දැනුවත්භාවය ලබාදීම සහ සම්බන්ධ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම | | | | |
| ජංගම බැංකු ගණුදෙනුකරුවන්ගේ මුළු සංඛ්‍යාව (MBC) | 98,971 | | 65,743 | |
| වසර තුළ අලුතින් වර්ධනය කළ ජංගම බැංකු ගණන | 33,228 | | 20,177 | |
| නිර්වචනය කොට ඇති දායක සහ සුබසාධන සැලසුම්වල දායකත්වය | ශ්‍රී.ල.රු.මි | | ශ්‍රී.ල.රු.මි | |
| නිර්වචනය කොට ඇති දායක සැලසුම සඳහා දායකත්වය | 42.74 | | 32.71 | |
| නිර්වචනය කොට ඇති සුබසාධන සැලැස්ම සඳහා දායකත්වය | 41.18 | | 9.44 | |
| මුළු | 83.92 | | 42.15 | |

## සෘජු ආර්ථික වටිනාකම් නිර්මාණය සහ බෙදී යෑම

වසර තුළ දී HDFC බැංකුව 2011 වසරේ දී ලඟා කර ගත් ශ්‍රී.ල.රු.මි. 2,385 හා සැසඳීමේදී ශ්‍රී.ල.රු.මි. 2,691 ක වටිනාකම ආර්ථිකයට එකතු කොට ඇත. මෙම වටිනාකමින් ශ්‍රී.ල.රු.මි. 60 බැංකුවේ රඳවා ගත් අතර සෙසු මුදල සැපයුම්කරුවන්, සේවකයින්, රජය සහ කොටස්කරුවන් අතර බෙදී යන ලදී. 2012 වසර තුළ දී සෘජු හා වක්‍ර බදු වශයෙන් ශ්‍රී.ල.රු.මි. 123 රජයට දායක කොට ඇත.




**නිර්මිත ආර්ථික වටිනාකම**
**2006 - 2012 ශ්‍රී.ල.රු.මි.**

## රජයේ ආයෝජනයට ප්‍රතිලාභ

ශ්‍රී ලංකා රජය එක් කොටසක වටිනාකම රු. 100/= වන ශ්‍රී.ල.රු. 327,800,000/= වටිනාකමින් යුත් සාමාන්‍ය කොටස් 3,278.00 ආයෝජනය කොට ඇති අතර, එය කොටස් හිමිකමින් 51% කි. දැනට බැංකුව වෙළෙඳපොළ සහ කොටස්කරුවන්ගේ අරමුදල් යොදවා පොළී දරණ අරමුදල් මගින් බැංකුවේ මෙහෙයුම් පූර්ණ ලෙස මූල්‍යකරණය කොට ඇත.

HDFC බැංකුවේ ඇති රජයේ ඒකරාශී අරමුදල් ශ්‍රී.ල.රු.මි. 490.62 මූලික ප්‍රාග්ධනයකින් සහ 51% ඒකරාශී සංචිත ප්‍රාග්ධනයක් වන ශ්‍රී.ල.රු.මි. 728 වශයෙන් එකතුව ශ්‍රී.ල.රු.මි. 1,219 ක් වේ. වසර තුළ HDFC බැංකුව, ශ්‍රී.ල.රු.මි. 1,219 ආයෝජනය මත 10% මූල්‍ය ලැබීමක් පෙන්නුම් කරමින් රජයට බදු සහ ලාභාංශ වශයෙන් ශ්‍රී.ල.රු.මි. 123 ගෙවා ඇත.




**රජයට ලැබීම් 2009 - 2012**

## මානව ජනාවාස ප්‍රවර්ධනය

ප්‍රමුඛ ව්‍යාපාරික මෙහෙයුම් මගින් නිර්මිත සෘජු ආර්ථික වටිනාකම්වලට අමතර පසුගිය වසර 27 පුරා HDFC බැංකුවේ ප්‍රමුඛ ව්‍යාපාරයෙන් ලද වක්‍ර ප්‍රතිලාභ මගින් රටේ සමාජ ආර්ථික සංවර්ධනයෙහිලා ලබා දී ඇති දායකත්වය සුවිශේෂී බව අපගේ ඇගයුමට ලක් වී ඇත.

## රට තුළ සිදු කරන ලද මුළු සේවාවන්

HDFC බැංකුව පවුල් 157.000 වඩා වැඩි සංඛ්‍යාවකට නිවාස අයිතිය ලබා ගැනීමටත්, ඔවුන් සතු නිවාස වැඩි දියුණු කර ගැනීමටත්, ගෘහ උපකරණ හා උපාංග මිල දී ගැනීමටත් සහය වී ඇත. 2000 වසරේ සිට අනුමත කොට ඇති පහසුකම්වල වටිනාකම ශ්‍රී.ල.රු.බිලියන 32 වන අතර, මෙයින් 75% ලබා දී ඇත්තේ පහළ හා මධ්‍යම පාංතික කණ්ඩායම්වලට ය.




**අනුමත ඒකරාශී ණය වටිනාකම**

### නිවාස අයිතිය වර්ධනය කිරීමට කැපවීම

වසර තුළ දී HDFC බැංකුව ශ්‍රී.ල.රු.මි. 3,600 මුළු වටිනාකමකින් යුතු ණය පහසුකම් 12404 ලබා දී ඇත. මෙම ණය පහසුකම් ලබා දී ඇත්තේ නිවාස ඉදිකිරීම, මිල දී ගැනීම, ඉහළ පොළී අනුපාත යටතේ ලබා ගත් නිවාස ණය බේරුම් කිරීම, අලුත්වැඩියා හා නවීකරණය සහ දැනට සතුව ඇති නිවාස පුළුල් කර ගැනීමේ කාර්යයන් සඳහා වේ. නිවසට අවශ්‍ය අයිතම, ගෘහ භාණ්ඩ හා අනෙකුත් ජීවන රටා අවශ්‍යතාවයන් මිල දී ගැනීම සඳහා ශ්‍රී.ල.රු.මි. 260 ක වටිනාකමින් යුත් පහසුකම් 1,536 ක් ලබා දී ඇත. මෙම පහසුකම් ඔස්සේ 12,000 වඩා වැඩි පවුල් සංඛ්‍යාවකට සහ 55,000 ට වඩා වැඩි පිරිසකට සිය දැවෙන නිවාස ප්‍රශ්නය විසඳා ගැනීමට උපකාරී වී ඇති බවට අප තක්සේරු කොට ඇත.




**ඉදිකිරීම් ණය අනුමත කිරීම 2012**




**කාර්යය පාදක සේවා බෙදී යෑම 2012**

### ජාතික නිවාස ස්කන්ධයට දායකවීම

2012 වසර තුළ දී HDFC බැංකුව ජාතික නිවාස ස්කන්ධයට ආසන්න වශයෙන් නව නිවාස 10,024 ක් කරමින් දායක වී ඇත. බැංකුව මෙම නිවාසවල ඉදිකිරීම් වටිනාකම වශයෙන් ශ්‍රී.ල.රු.මි. 3,599 ක මූල්‍ය පහසුකම් සලසා දී ඇත. 2011 වසරේ නිකුත් කළ ඉදිකිරීම් ණය 12,142 හා සැසඳීමේදී මෙම වසර තුළ 17 ක වැඩිවීමක් පෙන්නුම් කොට ඇත. තවද බැංකුව පවත්නා නිවාස අලුත්වැඩියාව හා නවීකරණය සඳහා ශ්‍රී.ල.රු.මි. 71 ණය අනුමත කොට ඇත.

### සංවර්ධන විෂමතාවයන් අවම කර ගැනීමට සහය වීම. පහළ හා මධ්‍යම කාණ්ඩ සඳහා සේවා ප්‍රමුඛතාවයන්

ගත වූ වසර තුළ අනුමත ණය සංඛ්‍යාවෙන් සියයට 80 වැඩි සංඛ්‍යාවක් ලබා දී ඇත්තේ පහළ හා මධ්‍යම ආදායම්ලාභී කණ්ඩායම්වලට වන අතර, එය සමස්ත අනුමත ණය වටිනාකමින් සියයට 60 ක් නියෝජනය කරයි. අනුමත ණය පහසුකම්වලින් සියයට 57 ක් ම ශ්‍රී.ල.රු. 200,000 වඩා අඩු ණය වේ. රු. 200,000 සහ රු. 500,000 අතර ණය සංඛ්‍යාව සියයට 23 වේ. බැංකුව විසින් අනුමත කළ සාමාන්‍ය ප්‍රවාහයේ ණය 2011 වසරේ පැවති ශ්‍රී.ල.රු. 290,000 සිට 2012 වසරේ දී ශ්‍රී.ල.රු. 327,000 දක්වා ඉහළ යන ලද අතර, එමගින් රටේ අවශ්‍යම කොටස්වලට සේවා සැපයීමේ අපගේ සමාජ වගකීම පුළුල් වීම පෙන්නුම් කරයි. අපගේ ණය බහුතරයක් විධිමත් මූල්‍ය පහසුකම් ලබාග ැනීමට අවස්ථාව නොලද පහළ ආදායම් පවුල් වෙත යොමු වී ඇත. මෙම පවුල්වලට සිය නිවාස සිහිනය සැබෑ කර ගැනීමත් සමඟ ඔවුනගේ ජීවන මට්ටම හා ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීමට අනිවාර්යයෙන්ම පිටිවහලක් වේ.

### විවිධ අංශ යටතේ සේවා බෙදී යෑම

ගත වූ වසර තුළ විවිධ සේවා අංශවල ගණුදෙනුකරුවන් සඳහා ශ්‍රී.ල.රු.බි. 2.8 ක මුදලක් බෙදී ගොස් ඇති අතර, එය සමස්ත ණය වටිනාකමින් 77% ක් වේ. තවත් 15% කර්මාන්ත ක්ෂේත්‍රයේ ආදායම් ලබන ගණුදෙනුකරුවන්ට ද 7% කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ ගණුදෙනුකරුවන් අතර ද බෙදී ගොස් ඇත.




**විවිධ අංශ යටතේ බෙදී යෑම 2012**




**පළාත් අනුව ණය බෙදී යෑම 2012**

## පළාත් අනුව සේවා බෙදී යෑම

ඉහළ යන නාගරීකරණයත් සමඟ නාගරික පදිංචිකරුවන්ගේ වැඩිවීම වසරකට 3% වශයෙන් සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මෙම ප්‍රවණතාවය විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ දක්නට තිබූ අතර, බැහැර ප්‍රදේශවලින් සංක්‍රමණය වීම හේතු කොට ගෙන ඉඩම්වල සහ ශ්‍රමයේ මිල දැරිය නොහැකි මට්ටමකට ඉහළ යන ලදී. මෙම මතු වූ ප්‍රවණතාවයන් අභියස HDFC බැංකුව බස්නාහිර පළාතට ණය 3,058 ක් ලබා දුන් අතර, එය සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 41 ක් සහ 2012 වසරේ අනුමත කළ ණය වටිනාකමින් සියයට 69 ක් විය. මෙම ණය අතරින් 66% මධ්‍ය ආදායම්ලාභීන්ට ද, නව නිවාස ඉදි කර ගැනීම සඳහා 73% ක් ද, නිවාස මිල දී ගැනීම සඳහා 6% ක් ද අනෙකුත් නිවාස ආශ්‍රිත ණය සඳහා 11% ක් ද විය.

## කොළඹින් බැහැර සේවා සැපයුම

අනුමත කළ සමස්ත ණය අතරින් 81% කොළඹින් බැහැර දිස්ත්‍රික්ක සඳහා වන අතර, 67% කොළඹ හා ගම්පහ යන දිස්ත්‍රික්කවලින් බැහැර දිස්ත්‍රික්ක සඳහා වේ. 59% පමණ ණය අනුමත කොට ඇත්තේ බස්නාහිර පළාතෙන් බැහැර ගණුදෙනුකරුවන් සඳහා වේ.

## ප්‍රාදේශීයව සම්පත් යොදා ගැනීම

බස්නාහිර පළාත හැර ප්‍රාදේශීය නිවාස මූල්‍ය අවශ්‍යතා සඳහා විශාල මුදල් ප්‍රමාණයක මූල්‍ය සම්පත් භාවිතා කරන අතර, එමගින් ප්‍රාදේශීය සමාජ ආර්ථික සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙයි. HDFC බැංකුව දකුණු පළාතට ශ්‍රී.ල.රු.මි. 1,602 ද, වයඹ පළාතට ශ්‍රී.ල.රු.මි. 1,121 ක් ද, ඌව පළාතට ශ්‍රී.ල.රු.මි. 1, 140 ක් ද වශයෙන් 2012 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කොට ඇති අතර, පළාත් සංවර්ධන විෂමතාවයන් අවම කර ගැනීමට සැලකිය යුතු දායකත්වයක් සපයන බැංකුවේ කැපවීම පහත වගුවෙන් දැක්වේ.

*ප්‍රාදේශීය වශයෙන් මූල්‍ය සම්පත් යොදා ගැනීම*

| | ණය ශ්‍රී.ල.රු.මි. | තැන්පතු ශ්‍රී.ල.රු.මි. | ප්‍රාදේශීය වශයෙන් මූල්‍ය සම්පත් යොදා ගැනීම ශ්‍රී.ල.රු.මි. |
|---|---|---|---|
| බස්නාහිර | 7,256 | 3,168 | 4,088 |
| දකුණ | 2,369 | 767 | 1,602 |
| මධ්‍යම | 2,408 | 1,183 | 1,225 |
| වයඹ | 1,786 | 665 | 1,121 |
| ඌව | 1,513 | 373 | 1,140 |
| | 15,332 | 6,156 | 9,176 |

## නිවාස මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති ඉඩකඩ වැඩි කිරීම

නිවාස මූල්‍ය පහසුකම් සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැතිකම හේතුවෙන් නිවාස මූල්‍ය පහසුකම් සඳහා ශ්‍රී ලංකාවේ සඵල ඉල්ලුම, ජාතික නිවාස අවශ්‍යතාවයට වඩා සැලකිය යුතු පහළ මට්ටමක පවතී. සඵල ඉල්ලුම හා සත්‍ය නිවාස අවශ්‍යතාවය සමගාමීවීම සඳහා පහළ ආදායම්ලාභී ජනතාව අතර, නිවාස මූල්‍යකරණය රැගෙන ඒම අත්‍යවශ්‍ය වේ. මෙම කණ්ඩායමෙන් බහුතරය දැරිය හැකි උකස්කර ණයක් සඳහා සුදුසුකම් සහිත පහළ ආදායම්ලාභී නාගරික පවුල්වලින් සමන්විත වන අතර, ඔවුනට ඇති එකම බාධාව ණය පහසුකම් සඳහා ප්‍රවේශවීමට ඉඩකඩ නොමැතිකම වේ.

මෙම කණ්ඩායමට විධිමත් බැංකු පහසුකම් සැපයීමේ ලා ඇති බාධාව වනුයේ මූල්‍ය ගණුදෙනු පිළිබඳ ඔවුනගේ නොදැනීම, දුර්වල බැංකු ගණුදෙනු පුරුදු, ඇප හෝ ආදායම සනාථ කිරීමේ ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම යන කරුණු වේ. මූල්‍ය සේවා ලබා ගැනීමට ඇති ඉඩකඩ අහුරා තැබීමේ අවදානමකට වඩාත්ම ගොදුරු වී ඇති අප සමාජයේ ජන කණ්ඩායම මොවුන් වේ. මෙම ජන කණ්ඩායමෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් තම නිවාස අවශ්‍යතාවයන් සහ දෛනික මූල්‍ය අවශ්‍යතාවන් සඳහා අවිධිමත් මූල්‍ය පහසුකම් සපයන්නන් හා ගණුදෙනු කිරීම මගින් සිය මිල මුදල් ඔවුනට සූරා ගැනීමට ඉඩ ලබා දෙයි.

HDFC බැංකුව ඉතිරි කිරීම් ප්‍රවර්ධනය මගින් නිවාස මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශවීමේ අවස්ථා හා ඉඩකඩ වැඩි කර දීමට උත්සාහ කරයි. බැංකුව සිය සම්පත් හා විශේෂඥතා දැනුම උපයෝගී කර ගනිමින් විධිමත් නිවාස මූල්‍යකරණයට යොමු කරනු වස් මෙම ජන කොටස අතර, බැංකු ගණුදෙනු පුරුදු, හැකියාවන් හා විශ්වාසය දැනුවත් කොට තහවුරු කර දෙයි. අපගේ ගණුදෙනුකරුවන්ගෙන් වැඩි පිරිස මෙම කණ්ඩායමට අයත් වන බව සතුටින් දන්වා සිටිමු.

## ජංගම බැංකු මෙහෙයුම් සහ මූල්‍ය සේවා සඳහා ඇතුළත් කර ගැනීම්

උපාය මාර්ගික ප්‍රවේශයක් ලෙසින් HDFC බැංකුව විධිමත් බැංකු ක්‍රම භාවිතා නොකරන අඩු ආදායම්ලාභී කණ්ඩායම දිනා ගැනීමේ අරමුණ ඇතිව ජංගම බැංකු මෙහෙයුම් (පාම් ටොප්) ආරම්භ කොට ඇති අතර, එමගින් ඔවුන් තුළ බැංකු ගණුදෙනු සහ ඉතිරි කිරීමේ පුරුදු වර්ධනය කිරීමට අපේක්ෂා කරයි. මෙය 2007 වසර තුළ ආරම්භ කරන ලද අතර, දැනට පාම් ටොප් මෙහෙයුම්කරුවන් ඇතුලු 115 කට වඩා වැඩි දෙනකේ ශාඛා ජාලයක් ඔස්සේ රට පුරා නගර 146 කට වැඩි සංඛ්‍යාවක සාර්ථකව ක්‍රියාත්මක වේ. අපගේ ප්‍රවර්ධන සහකරුවන් දෛනික පදනම යටතේ දිවයින පුරා පැතිර සිටින 15,000 ආසන්න ගණුදෙනුකරුවන් හමු වී සේවා සපයන අතර, ඔවුනගෙන් බහුතරය පදික වෙළෙඳුන්, පදික කඩපිල්, දෛනික වැටුප් ලබන කම්කරුවන් සහ ධීවරයන් වැනි ස්ථිර ආදායමක් නොලබන පිරිස්වලින් සමන්විත වේ. මෙම ගණුදෙනුකරුවන්ගෙන් 35% කට වැඩි පිරිසකගේ දෛනික තැන්පතුව රු. 250% වඩා අඩු වේ. අපගේ ජංගම බැංකුකරුවන් හරහා විධිමත් බැංකු ක්‍රමයට මෙම ගණුදෙනුකරුවන් බොහොමයක් ආකර්ශනය කර ගත්තේ ප්‍රථම වතාවටයි.

## මූල්‍ය ගණුදෙනු පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම.

2012 වසර තුළ දී රට පුරා විසිර සිටින පහළ ආදායම්ලාභී කණ්ඩායම අතරින් HDFC බැංකුවේ තැන්පත්කරුවන් ලෙසින් නව ජංගම බැංකු ගණුදෙනුකරුවන් 33,228 එක් කර ගන්නා ලදී. තවද ජංගම බැංකු ජාලය හරහා කණ්ඩායම් ඇපකර ක්‍රමය යටතේ ජීවන රටා සංවර්ධනය සඳහා විශේෂ ණය ක්‍රමයක් ද ජංගම බැංකු ගණුදෙනුකරුවන්ගේ රන් ඉතුරුම් ඇප මත ක්ෂුද්‍ර ණය ක්‍රමයක් ද අප දියත් කොට ඇත. පහළ හා මධ්‍යම ආදායම්ලාභී කණ්ඩායම්වලට බැංකුකරණයේ සහ ඉතිරි කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමටත් ගිණුම් ආරම්භ කිරීමේ දී අවශ්‍ය ලේඛන පිරවීමට ඔවුනට සහයවීමෙනුත් අපගේ කැප වූ කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා ඇත. තවද අප ඔවුනට තම දෛනික ඉපැයීම්වලින් කොටසක් විශ්‍රාමය සඳහා මෙන්ම තම දරුවන්ගේ අනාගතය සඳහා ඉතිරි කිරීමටත් දිරිමත් කරයි. මෙම කාර්යය උදෙසා විශේෂයෙන්ම ඔවුනගේ විශ්‍රාමය වෙනුවෙන් මුදලක් ඉතිරි කර දීමේ අරමුණින් ඔවුන් වෙනුවෙන්ම ආරම්භ කොට ඇති ආකර්ශනීය කණ්ඩායම් ආයෝජන අරමුදල් ක්‍රමය තුළ නම්‍යශීලී කාල පරාසයන් තුළ රු. 100/= වැඩි මුදලක් ආයෝජනය කිරීමට ඔවුන් දැනුවත් කරනු ලබයි.




**ජංගම බැංකු ගණුදෙනුකරුවන්ගේ වර්ධනය**

# මූල්‍ය වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 30
අධ්‍යක්ෂ මණ්ඩල උප කාරක සභා වාර්තාව 35
විගණකාධිපති වාර්තාව 42
ආදායම් ප්‍රකාශනය 44
විස්තීරණ ආදායම් ප්‍රකාශනය 45
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 46
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 47
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 48
ගිණුම්කරණ ප්‍රතිපත්ති 49
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සටහන් 53

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

## 1. සාමාන්‍ය

HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් 2012 මුදල් වර්ෂය සඳහා වන බැංකුවේ වාර්ෂික වාර්තාවක් විගණනය කළ මූල්‍ය ප්‍රකාශනත්, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ විගණක වාර්තාවත් ඉදිරිපත් කර සිටිනුයේ මහත් වූ සාඩම්බර හැඟීමෙනි.

HDFC බැංකුව 1997 අංක 07 දරණ (2003 අංක 15 දරණ පනතින් සහ 2011 අංක 45 දරණ පනතින් සංශෝධිත) නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංස්ථාපිත රජයේ ලැයිස්තුගත බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.

## 2. ප්‍රධාන ක්‍රියාකාරකම්

නිවාස සහ නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් සැපයීම බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම ලෙස අඛණ්ඩව පැවතුන අතර, සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ HDFC බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල යම් සැලකිය යුතු වෙනසක් සිදු නොවුණි.

## 3. ව්‍යාපාර පිරික්සුම

අනුරූපී කාල පරිච්ඡේදය තුළ බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය, ක්‍රියාකාරකම් හා සුවිශේෂී සිද්ධීන් පිටු 12 සිට 16 දක්වා වන සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනයේ දැක්වෙන අතර, කළමනාකරණ සාකච්ඡා පිටු 47 දැක්වේ. මෙම වාර්තා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ ආංශික කොටසක් බවට පත් වේ.

## 4. අපගේ දැක්ම, මෙහෙවර සහ සාංගමික පිළිවෙත

බැංකුවේ දැක්ම සහ මෙහෙවර නිරතුරුව සාංගමික සැලැස්ම හා අනුගාමීව පවතින අතර, සිය දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී ඉහළම තලයක සදාචාරාත්මක ප්‍රමිතීන් තහවුරු කරමින් බැංකුව සිය මෙහෙයුම් ඵලදායී ලෙස පවත්වාගෙන යයි.

## 5. අනාගත සංවර්ධනයන්

බැංකුවේ අනාගත උපාය මාර්ග එහි සංස්ථාපිත පනත හා සමගාමී වනු ඇත. වාර්ෂික වාර්තාවේ සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි. වරයාගේ සමාලෝචනයේ පිටු 12 සිට 16 දක්වා විස්තරාත්මකව දැක්වෙන පරිදි බැංකුවේ ප්‍රධාන උපාය මාර්ගය වනුයේ ශාඛා ජාලය පුළුල් කිරීම සහ නිමැවුම් කළඹ විවිධාංගීකරණය කිරීම වේ.

## 6. මූල්‍ය ප්‍රකාශන

සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා වන HDFC බැංකුවේ විධිමත්ව අත්සන් කොට සහතික කොට අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ පිටු 140 සිට 144 දැක්වේ.

## 7. විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගත් විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවේ පිටු 145 සිට 148 දැක්වේ. හිමිකම් වෙනස්වීමේ බලපෑම වාර්ෂික වාර්තාවේ පිටු අංක 144 දක්වා ඇත.

## 8. විගණක වාර්තාව

HDFC බැංකුවේ විගණක නිලධාරියා වන, ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා විසින් අදාළ මූල්‍ය වර්ෂය සඳහා වන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනයට බඳුන් කළ අතර, එම විගණන වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු 138 සිට 139 දක්වා ඇත.

## 9. අඛණ්ඩ පැවැත්ම

දීප්තිමත් අනාගතයකට හිමිකම් කියමින් සිය මෙහෙයුම් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය සම්පත ප්‍රමාණවත් පරිදි බැංකුව සතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ අඛණ්ඩ පැවැත්මේ සංකල්පය පාදක කොටගෙන ය.

## 10. ආදායම

2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වසරේ බැංකුවේ ආදායම ශ්‍රී.ල.රු.මිලියන 2,691 ක් විය. ආදායම් පිළිබඳ විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශන සටහන් 01 සහ 02 දැක්වේ.

## 11. පොළිය හා බෙදා හැරීම

2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වසරේ බැංකුවේ ආදායම් බද්දට පෙර ලාභය ශ්‍රී.ල.රු.මිලියන 73 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසරේ බද්දට පසු ලාභය ශ්‍රී.ල.රු.මිලියන 2.5 ක් විය.

*HDFC බැංකුවේ ලාභය පිළිබඳ විස්තරයක් පහත සඳහන් වගුවේ දැක්වේ.*

| 2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වසර | 2012 රු.මි. | 2011 රු.මි. |
|---|---|---|
| වි.අ.බ. පෙර සාමාන්‍ය ක්‍රියාකාරකම් මත මෙහෙයුම් ලාභය | 123 | 402 |
| මූල්‍ය සේවා මත වි.අ.බ. | 50 | 81.00 |
| බදු සඳහා ප්‍රතිපාදන | 70 | 104.64 |
| බද්දට පසු සාමාන්‍ය ක්‍රියාකාරකම් මත ලාභය | 2.5 | 216 |
| රඳවා ගත් ලාභය / (ඒකරාශී පාඩු) ඉ/ගෙ | 1,170 | 1,086 |
| බෙදා හැරීමට ඇති ලාභය | 1,172 | 1,302 |
| යෝජිත මුල් සහ අවසන් ලාභාංශ බෙදා හැරීම | - | 32 |
| සංචිත සඳහා මාරු කිරීම | 34 | 100 |
| රඳවා ගත් ලාභය ඉදිරියට ගෙන යෑම | 1,138 | 1,170 |

### 12. සංචිත

2012 දෙසැම්බර් 31 දින බැංකුවේ මුළු සංචිත ප්‍රමාණය ශ්‍රී.ල.රු.මිලියන 2,391 ක් විය. මූල්‍ය ප්‍රකාශනවල 144 පිටුවේ දැක්වෙන හිමිකම් වෙනස්වීමේ වාර්තාවේ ඒ පිළිබඳ විස්තරයක් දැක්වේ.

### 13. ප්‍රදාන

වර්ෂය තුළ බැංකුව විසින් ශ්‍රී.ල.රු. 1,225,822 වටිනා ප්‍රදානයන් සිදු කොට ඇත.

### 14. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට, අනෙකුත් නියාමන ආයතනවලට සහ සේවකයින්ට අදාළ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා සම්පූර්ණයෙන්ම ගෙවා ඇති බවට සිය දැනුමේ හා විශ්වාසය මත අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

### 15. බදු සඳහා ප්‍රතිපාදන

බැංකුවේ මෙහෙයුම්වල බද්දට යටත් ආදායම් මත ගෙවිය යුතු ආදායම් බද්ද 28% ක් වූ අතර, වාර්ෂික වාර්තාවේ, පිටු 151 සහ 152 මූල්‍ය ප්‍රකාශනවල සටහන් 09 එළිදරව් කොට ඇත.

### 16. ලාභාංශ

අනිවාර්ය ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රුපියල් බිලියන 2.5 සම්පූර්ණ කිරීම සලකා බලා 2013 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කිසිදු ලාභාංශයක් (අවසන්) නිර්දේශ නොකරයි.

### 17. දේපළ, පිරියත සහ උපකරණ, බදුකර දේපළ

දේපළ පිරිමිත සහ උපකරණ සඳහා වන ප්‍රාග්ධන වියදම ශ්‍රී.ල.රු.මිලියන 94 ක් වූ අතර, ඒ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සටහන 16 දැක්වේ.

බදුකර දේපළ පිළිබඳ විස්තර 154 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 16 යටතේ දැක්වේ.

### 18. සින්නක්කර දේපළවල වෙළෙඳපොළ වටිනාකම

සින්නක්කර දේපළවල වෙළෙඳපොළ වටිනාකම පිළිබඳ විස්තරයක් පිටු 155 මූල්‍ය ප්‍රකාශනවල සටහන 17 දැක්වේ.

### 19. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන මගින් එළිදරව් කිරීමට හෝ ගැලපීම් කිරීමට තරම් වැදගත් සිද්ධීන් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව හටගෙන නැත.

### 20. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2012 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග ්ධනය ශ්‍රී.ල.රු.මිලියන 962 ක් වූ අතර, එය සාමාන්‍ය කොටස් 64,710,520 සමන්විත විය. විස්තර 157 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල 24 සටහනේ දැක්වේ.

### 21. කොටස් පිළිබඳ තොරතුරු

කොටස්වල අදාළ තොරතුරු පිළිබඳ විස්තර (ඉපැයීම්, ශුද්ධ වත්කම් සහ කොටසක් සඳහා වෙළෙඳපොළ වටිනාකම) මෙම වාර්ෂික වාර්තාවේ පිටු 162 සිට 164 හි ඉදිරිපත් කොට ඇත.

කොටස්කරුවන් සමඟ ඇති කර ගත් ගිවිසුම් ප්‍රකාරව සෑම කොටස්කරුවකුටම සාධාරණව සලකා ඇත.

## 22. කොටස් හා ණයකර නිකුත් කිරීම

සමාලෝචනයට භාජනය වූ වසර තුළ බැංකුව කවර හෝ කොටස් හෝ ණයකර නිකුතුවක් සිදු කොට නැත.

## 23. සියලුම කොටස්කරුවන්ට සර්ව සාධාරණව සැලකීම

HDFC බැංකුවේ ප්‍රගතිය උදෙසා සියලුම කොටස්කරුවන්ගේ දායකත්වය අගයන අතර, බැංකුව කොටස්කරුවන්ට සර්ව සාධාරණ අයුරින් සැලකීමට සියලු උත්සාහයන් ගෙන ඇත. 2012 වසරේ දී කොටස්කරුවන්ගේ සබඳතා මෙම වාර්තාවේ 47 සිට 82 දක්වා වන පිටුවල විස්තර වේ.

## 24. අධ්‍යක්ෂ මණ්ඩලය

HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රවීණ සුදුසුකම් ලත් පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත වේ. බැංකුවට නායකත්වය දීමට අවශ්‍ය නිසි කුසලතාවයන් හා අත්දැකීම් ඔවුන් සතු වේ.

සමාලෝචනයට භාජනය වූ වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ.

01. එස්.එන්. වික්‍රමසිංහ මිය (සභාපති) 2010 මැයි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන)
02. ඩබ්.ජේ.එල්.යූ. විජයවීර මයා 2010 ජුනි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන)
03. සී. විජයවර්ධන මිය 2010 ජුනි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන)
04. එස්.ඒ.ජේ. සමරවීර මයා 2010 ජුනි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන නොවන)
05. ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මයා 2010 ජුනි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන නොවන)
06. ඒ.ජේ. ඇලෝසියස් මයා 2011 මැයි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන නොවන)
07. එල්.ඊ. සුසන්ත සිල්වා මයා 2012 මැයි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන)
08. කේ.ඩබ්.පී. දයාරත්න මිය 2010 ජුනි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන)
09. ඩබ්.ඩී.කේ. ජයවර්ධන මයා 2011 මැයි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන නොවන)
10. ඒ.එම්. චන්ද්‍රසාගර මයා 2010 ජුනි මස පත් කරන ලදි. (විධායක නොවන / ස්වාධීන)

### සමාලෝචිත වසර තුළ HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා අස්වීම

01. කේ.ඩබ්.පී. දයාරත්න මිය 2012 ඔක්තෝම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි
02. ඒ.එම්. චන්ද්‍රසාගර මයා 2012 ඔක්තෝම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි
03. ඩබ්.ඩී.කේ. ජයවර්ධන මයා 2012 ඔක්තෝම්බර් සිට ක්‍රියාත්මක වන පරිදි

### මණ්ඩලයට පත් කිරීම්

01. එල්.ඊ. සුසන්ත සිල්වා මයා 2012.05.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි
02. ජී.එල්.එස්. සේනාධීර මයා 2013.01.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ වරුන්ගේ සුදුසුකම් සහ අත්දැකීම්

වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මෙම වාර්ෂික වාර්තාවේ 22 සිට 23 දක්වා පිටුවල දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තරයේ දැක්වේ.

## 25. අධ්‍යක්ෂ මණ්ඩල උප කාරක සභා

ශ්‍රී ලංකා මහ බැංකුවේ සාංගමික පාලන නියමයන්ට අනුගතව අනුරූපී කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල උප කාරක සභා පහක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාම යෝජනා හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සහ අයකර ගැනීම්) ක්‍රියාත්මක වූ අතර, මෙම කාරක සභාවල වාර්තා වාර්ෂික වාර්තාවේ 131 සිට 136 දක්වා පිටුවල දක්වා ඇත.

## 26. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 16 පවත්වන ලද අතර, ඒවාට සහභාගීවීම පිළිබඳ උපලේඛනය පිටු 120 දැක්වේ. උප කාරක සභා රැස්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු 121 සිට 123 දක්වා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කොට ඇත.

## 27. මූල්‍ය වාර්තාකරණයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එහි කාර්යයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ ප්‍රතිරූපයක් ජනිත වන පරිදි කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මූල්‍ය වාර්තාකරණයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ ආංශික කොටසක් වන පිටු 137 දැක්වේ.

## 28. සම්බන්ධතා ලේඛනයේ සටහන්

HDFC බැංකුව සමාගම් පනතේ නියමයන් ප්‍රකාරව සම්බන්ධතා ලේඛනයක් පවත්වාගෙන යයි. අදාළ අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද ප්‍රකාශන සම්බන්ධතා ලේඛනයට ඇතුළත් කොට ඇත.

## 29. කොටස් හිමිකම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතා

*අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම් පහත දැක්වේ.*

| | 31/12/2012 | 01/01/2012 |
|---|---|---|
| එස්.එන්. වික්‍රමසිංහ මිය (සභාපති) | නැත | නැත |
| ඩබ්.ජේ.එල්.යූ. විජයවීර මයා | 3000 | 300 |
| සී. විජයවර්ධන මිය | නැත | නැත |
| එස්.ඒ.ජේ. සමරවීර මයා | නැත | නැත |
| ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මයා | නැත | නැත |
| ඒ.ජේ. ඇලෝසියස් මයා | නැත | නැත |
| එල්.ඊ. සුසන්ත සිල්වා මයා | 1000 | නැත |
| ජී.එල්.එස්. සේනාධීර මයා | නැත | නැත |

## 30. ගිවිසුම් හා යෝජිත ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතා

2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වසර තුළ අධ්‍යක්ෂවරුන් සෘජුව හෝ වක්‍රව HDFC බැංකුව සම්බන්ධ යම් ගිවිසුමකට හෝ යෝජිත ගිවිසුමකට ඇතුළත් වී නැත. වැඩිදුර විස්තර වාර්ෂික වාර්තාවේ 159 වන පිටුවේ දැක්වේ.

අධ්‍යක්ෂවරුන් යම සම්බන්ධතා වූයේ නම් ඒවා එළිදරව් කොට ඒ හා සම්බන්ධ ඡන්ද විමසීම්වලින් වැලකී සිටී.

## 31. ණයකරයන්හි අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතා

වසර ආරම්භයේ මෙන්ම වසර අවසනදී ද කිසිදු අධ්‍යක්ෂවරයෙකු නමින් ණයකරයක් ලියාපදිංචි වී නොතිබුණි.

## 32. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

සම්බන්ධිත පාර්ශව ගණුදෙනු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 159 සටහන් අංක 29 යටතේ දක්වා ඇත.

## 33. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකයන්

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකයන් මූල්‍ය ප්‍රකාශනයේ 131 පිටුවේ සටහන් අංක 29 යටතේ ඉදිරිපත් කොට ඇත.

## 34. සේවක කොටස් හිමිකම් සැලසුම

සමස්ත කොටස් 3,485,520 දැනටමත් භාරකාරයා වෙත උක්ත සැලැස්ම යටතේ නිකුත් කොට ඇති අතර, අදාළ ප්‍රතිලාභීන්ට යථා කාලයේ දී පවරා දෙනු ඇත. ඉහත සඳහන් කොටස් භාරය ඡන්ද හිමි සාමාන්‍ය කොටස්වලින් 5% අත්පත් කරගෙන බැංකුව විසින් ස්ථාපිත කරන ලදී.

## 35. පාරිසරික ආරක්ෂාව

පරිසරයට හානිකර කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නොමැති බවත්, පාරිසරික නියමයන්ට අනුගතව සෑම විට ක්‍රියා කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීම හා අවබෝධය අනුව සෑහීමකට පත් වේ.

## 36. අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන පද්ධතිය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කාරක සභාව බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ක්‍රමවත් පදනමක් යටතේ නිරතුරුව විමසුමට ලක් කරන අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාරක සභාව HDFC බැංකුවේ අවදානම් එළිදරව් වීම් හඳුනාගෙන, ඇගයුමට ලක් කොට කළමනාකරණය කරයි.

මෙම කාරක සභා දෙකම, බැංකුවේ මෙහෙයුම් සුමටව ඉදිරියට රැගෙන යෑම සඳහා විස්තීරණ අභ්‍යන්තර පාලන සහ අවදානම් පාලන රාමුවක් යටතේ බැංකුව ක්‍රියාත්මක වීම තහවුරු කරනු වස් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය නිර්දේශයන් සෘජුවම ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කාරක සභාව පිළිබඳ වැඩි විස්තර පිටු අංක 131 හි ද ඒකාබද්ධ අවදානම් කළමනාකරණය පිළිබඳ විස්තර 136 පිටුවේ ද දැක්වේ.

## 37. සාංගමික පාලනය

මෙම වාර්තාවේ පිටු 92 සිට 123 දක්වා වන සාංගමික පාලන අනුගතවීමේ ප්‍රකාශනය බලන්න.

## 38. අදාළ නීති හා රෙගුලාසිවලට අනුගතවීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීම අනුව සෘජු හෝ වක්‍ර යම් නීති රීති කඩකිරීමක් සම්බන්ධයෙන් බැංකුවට කරුණු එළිදරව් කිරීමට සිදු වූ කිසිදු අධිකරණමය නඩු කටයුත්තක් නොපැවති අතර, වැදගත් මූල්‍ය බලපෑමක් ඇති කරන සුළු සේවක කළමනාකරණයට අදාළව යම් අක්‍රමිකතාවයන් සිදුව නැත.

## 39. විගණකවරුන් පත් කිරීම

1997 අංක 07 දරණ (2003 අංක 15 සහ 2011 අංක 45 දරණ පනත්වලින් සංශෝධිත) HDFC පනතේ නියම කොට ඇති පරිදි විගණකාධිපතිවරයා බැංකුවේ විගණක ලෙස තව දුරටත් කටයුතු කරනු ඇත.

## 40. විගණක පාරිශ්‍රමික සහ බැංකුව සමඟ ගිවිසුම්මය සම්බන්ධතා

විගණක ගාස්තු වශයෙන් බැංකුව විසින් 2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වසර සඳහා රු. 460,000/= මුදලක් විගණකවරුන්ට ගෙවන ලදී. විගණකවරුන්ට බැංකුව සමඟ ඇති ගිවිසුම් සම්බන්ධයෙන් වෙනත් කවර හෝ උනන්දුවක් හෝ සබඳතාවයක් නොමැත.

### 41. විගණක කමිටුව

විගණක කමිටුවේ සංයුතිය සහ ඔවුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 131-132 පිටුවල දැක්වේ.

### 42. රැස්වීම් සම්බන්ධ දැන්වීම්

බැංකුවේ 28 වන වාර්ෂික මහා සභා රැස්වීම 2013 ජුනි මස 28 වන දින පෙ.ව. 10.00 ට කොළඹ 10, හෙජ්ස් කෝට් සී/ස බුකර් රික්රියේෂන් (පුද්ගලික) ආයතනයේ ගාඩිනියා ශාලාවේ දී පැවැත්වේ.

රැස්වීම පිළිබඳ දැන්වීම වාර්ෂික වාර්තාවේ පිටු 178 දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය අනුව අත්සන් තබන ලදී.



එස්.එන්. වික්‍රමසිංහ මිය,
සභාපති



කේ.ටී.ඩී.ඩී. ද සිල්වා මිය,
සමාගම් ලේකම්

# අධ්‍යක්ෂ මණ්ඩල උප කාරක සභා වාර්තාව

## විගණක කාරක සභා වාර්තාව

*විගණක කාරක සභාවේ සංයුතිය*

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කාරක සභාව රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ සහ 2007 අංක 11 දරණ බැංකු පනතේ නියමයන් ප්‍රකාරව ස්ථාපිත කොට ඇත. පහත සඳහන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් 2012 වසරේ දී කමිටුවේ සේවය කොට ඇත.

1. එල්.ජී. සුසන්ත සිල්වා මයා - සභාපති
2. චාන්දනී විජේවර්ධන මිය
3. ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මයා

සමාලෝචිත වසර තුළ වත්මන් සභාපතිට පෙර ඩී.එම්. චන්ද්‍රසාගර මහතා සහ ඩබ්.ඩී.කේ. ජයවර්ධන මහතා විගණක කමිටුවේ සභාපතිවරුන් ලෙස සේවය කරන ලදී. එම දෙපළ විසින් කමිටු සභාපතිවරුන් ලෙස ඉටු කළ සේවය අගයනු කැමැත්තෙමි.

*රැස්වීම්*

2012 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ කමිටු රැස්වීම් වාර 8 ක් පවත්වා ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක නිලධාරියා කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරන ලදී. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයින් සහ ශාඛා කළමනාකරුවන් ආරාධනා මත කමිටු රැස්වීම්වලට සහභාගී වී ඇත. රජයේ විගණක අධිකාරීවරයා නිරීක්ෂකයෙකු ලෙස මෙම රැස්වීම්වලට නිරතුරුව සහභාගී විය.

*කමිටුවේ කාර්යභාරය*

විගණක කාරක සභාවේ මූලික අරමුණ වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලය පාලන වගකීම් සම්පූර්ණ කර ගැනීම සඳහා සහාය වීම වේ. එනම්,

- මූල්‍ය ප්‍රකාශනවල නාවැරදිභාවය අධීක්ෂණය කිරීම සහ වැදගත් තීරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුගතදැයි විමසුමට ලක් කිරීම.
- බැංකුවේ අවදානම් කළමනාකරණ කටයුතුවල ඵලදායීතාවය විමසුමට ලක් කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතුවල කාර්යක්ෂමතාවය විමර්ශනය කිරීම.
- ලාභදායකත්වය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය යන ශීර්ෂය යටතේ බැංකුවේ සමස්ත කාර්ය සාධනය ස්වාධීන ඇගයුමකට ලක් කිරීම.

## වසරේ ක්‍රියාකාරකම්

*මූල්‍ය ප්‍රකාශන*

කොටස්කරුවන්ට ලබා දී ඇති තොරතුරුවල විශ්වසනීයත්වය තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ ඵලදායීතාවය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා එළිදරව් කිරීමේ නියමයන් කොතෙක් අනුගත වී ඇත්ද යන්න විමසුමට ලක් කෙරේ. ත්‍රෛමාසික හා වාර්ෂික වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ප්‍රථම විමසුමට ලක් කෙරේ. ගිණුම්කරණ පරිචයන්, අභ්‍යන්තර විගණන, අභ්‍යන්තර මූල්‍ය පාලනය, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය සහ සම්බන්ධිත කරුණු පිළිබඳ සැලකියුතු පැමිණිලි හෝ වාර්තා කිරීමක් නොවන බවට කමිටුව සහතිකවිය.

## නියාමන අනුගතවීම්

බැංකුව, සමාගම් පනත, බැංකු පනත, කොළඹ කොටස් වෙළෙඳපොළ නියමයන් සහ අනෙකුත් අදාළ ව්‍යවස්ථාවන්ට අනුගතව ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා බැංකුවේ ප්‍රතිපත්ති, ක්‍රියාදාම, අභ්‍යන්තර හා බාහිර විගණකවරුන්ගේ වාර්තා විමර්ශනයට ලක් කරයි.

*අවදානම් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය*

මූල්‍ය වාර්තාකරණ සහ අඛණ්ඩ පැවැත්ම ඇගයුමට ලක් කිරීමට අදාළව වංචා අවදානම සහ තොරතුරු තාක්ෂණ අවදානම ඇතුලු අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තා පිළිබඳව සලකා බලා විමසුමට ලක් කෙරින.

*බාහිර විගණකවරුන්*

ව්‍යවස්ථාපිත නීතියට අනුව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. බාහිර විගණකවරයාට සිය විගණන කාර්යය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ ලේඛන සපයා දෙන බවට කමිටුව තහවුරු විය.

- ගිණුම්කරණ වාර්තා ප්‍රමාණාත්මකව පවත්වාගෙන ගොස් ඇති බවට සහ මූල්‍ය ප්‍රකාශන මගින් ක්‍රියාකාරීත්වය හා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ පෙන්නුම් කරන බවට බාහිර විගණකවරුන්ගෙන් සහතිකයක් ලබා ගන්නාලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සාංග මික පාලනය පිළිබඳ නියමයන්ට අනුගත වී ඇති බවට සහතිකයක් ලබා ගන්නාලදී.
- මූල්‍ය වාර්තාකරණ පද්ධතියට අදාල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සඵලතාව සහ බාහිර අවශ්‍යතාවයන් සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුගත ද යන්න පිළිබඳ සහතිකයක් ලබා ගන්නාලදී.

*අභ්‍යන්තර විගණන*

සමාලෝචිත වසර තුළ කමිටුව විසින් විගණනයට බඳුන් කළ හැකි ක්ෂේත්‍රවල අවදානම් තක්සේරුව සඳහා පිළියල කරන ලද අවදානම් පාදක වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් ක්‍රමවේදය විමසුමට ලක් කොට අනුමත කළ අතර, කළමනාකරණ ප්‍රතිචාර සමඟ අභ්‍යන්තර විගණන අංශයෙන් ඉදිරිපත් කළ විගණන වාර්තා විමසුමට ලක් කරන ලදි. කමිටුව අඛණ්ඩව අභ්‍යන්තර විගණන කටයුතු සහ අභ්‍යන්තර පාලන අංශයේ කාර්ය සාධනය විමසුමට සහ අධීක්ෂණයට ලක් කරන ලදී.

මෙම කරුණු සියල්ල සැලකිල්ලට ගෙන කමිටුව එළඹි නිගමනය වූයේ වාර්තාකරන දිනට බැංකුවට සැලකියයුතු පාඩුවක් ගෙන දෙන අභ්‍යන්තර මූල්‍ය පාලන ඇතුලු අභ්‍යන්තර පාලනවල යම් වැදගත් බිඳවැටීමක් සිදුව නැති බවය.

*වාර්තා කිරීම*

කමිටුව රැස්වීම් වාර්තා මගින් සිය ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. කමිටුවේ විශය ක්ෂේත්‍රයන්හී සියළු වැදහත් අංශයන් ආවරණය කරන ලද බව කමිටුවේ මතයයි.

විගණක කාරක සභාව වෙනුවෙන්,



**එල්.ඊ. සුසන්ත සිල්වා,**
*සභාපති*
විගණක කාරක සභාව,
2013 ජනවාරි 25 වන දින.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ මානව සම්පත් සහ පාරිශ්‍රමික කාරක සභා වාර්තාව

සංවිධානයේ වඩාත් ම වැදගත් උපාය මාර්ගික වත්කම වනුයේ මානව සම්පත බව HDFC බැංකුවේ විශ්වාසය වන අතර, මානව සම්පත් හා පාරිශ්‍රමික අනු කමිටුව ඉහළම මානව සම්පත් පරිචයන් ක්‍රියාත්මක කරමින් ආයතනයේ සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. HDFC බැංකුවේ සංවිධාන ප්‍රතිපත්ති, සේවක ප්‍රතිලාභ, සේවක සබඳතා පාලන යාන්ත්‍රණය වටිනා සේවක සම්පතක් බැංකුව තුළ රඳවා ගැනීමට උපකාරී වී ඇත. විමර්ශනයට බඳුන් වූ කාල පරිච්ඡේදය තුළ කාරක සභා සාමාජිකයන් ලෙස කටයුතු කළේ - එස්.එන්. වික්‍රමසිංහ මිය (කමිටු සභාපති) (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) ඩබ්.ජේ.එල්.යු. විජයවීර මයා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) කේ.ඩබ්.පී. දයාරත්න මිය (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මයා
(විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

2012.10.31 දින කේ.ඩබ්.පී. දයාරත්න මහත්මියගේ ඉල්ලා අස්වීමත් සමඟ ජී.එල්.එස්. සේනාධීර මයා 2013 ජනවාරි මස පත් කර ගන්නා ලදී.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කාරක සභා රැස්වීම් 03 පවත්වන ලදී.

බැංකුවේ පහත සඳහන් අරමුණු සපුරා ගැනීම සඳහා කමිටුව ක්‍රියා කොට ඇත.

අ) ප්‍ර.වි.නි. සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

ආ) ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ඉලක්ක හඳුන්වා දීම.

ඇ) ප්‍ර.වි.නි. සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට ලබා දී ඇති ඉලක්කවලට සාපේක්ෂව කාර්ය සාධනය ඇගයුමට ලක් කොට පාරිශ්‍රමික ප්‍රතිලාභ සහ කාර්ය සාධන පාදක දිරි දීමනා තීරණය කිරීමේ පදනම ප්‍රතිශෝධනය කිරීම.

ඈ) වැටුප් ප්‍රතිශෝධන, පූර්ව අවශ්‍යතා, බඳවා ගැනීම්, කාර්ය මණ්ඩලය තීරණය කිරීම / තනතුරු වෙනස් කිරීම / නව තනතුරු ඇති කිරීම / සේවක මණ්ඩල හා සේවක මණ්ඩල වැය, පුහුණුවීම් සහ බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විදේශ සම්මන්ත්‍රණවලට සහභාගීවීම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි. ඔහු තනතුරට අදාළ කරුණක් සාකච්ඡාවට බඳුන් කරන අවස්ථාවක දී හැර ආරාධනාවක් ලැබුණු විට රැස්වීම්වලට සහභාගී වේ. කාරක සභාවට අවශ්‍ය වන විට දී සාංගමික කළමනාකාර කණ්ඩායමට කාරක සභා රැස්වීම්වලට සහභාගීවීමට ආරාධනා කරයි.



එස්.එන්. වික්‍රමසිංහ මිය,
සභාපති.



දර්ශනී ද සිල්වා,
සමාගම් ලේකම්.

### නාම යෝජනා කමිටුව

අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. සහ ඉහළ කළමනාකාරිත්වය පත් කිරීම හෝ අලුත් කිරීම පිළිබඳ විනිවිද ක්‍රියාවලියක් භාවිතා කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය තුළම නිසි තුලනයක් පවත්වාගෙන යෑමට නාම යෝජනා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. එස්.එන්. වික්‍රමසිංහ මිය (කාරක සභා සභාපති, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) ඩබ්.ජේ.එල්.යූ. විජේවීර මයා (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) කේ.ඩබ්.පී. දයාරත්න මිය (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ)

2012.10.31 දින කේ.ඩබ්.පී. දයාරත්න මියගේ ඉල්ලා අස්වීමත් සමඟ 2013 ජනවාරි මස සී. විජයවර්ධන මහත්මිය පත් කරන ලදී.

කාරක සභාව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර, කාරක සභාවට පත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරයි.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කාරක සභා රැස්වීම් 03 පවත්වා ඇත.

බැංකුවේ පහත අරමුණු ලඟා කර දීම සඳහා කාරක සභාව සෑම විට ම ක්‍රියා කරයි.

අ) HDFC පනතට අනුගාමීව නව අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි, සහ ඉහළ කළමනාකරණ පිරිස් තෝරා ගැනීම / පත් කිරීම.

ආ) සමස්ත අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය සලකා බලා අධ්‍යක්ෂවරුන් යළි පත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඇ) ප්‍ර.වි.නි. සහ ඉහළ කළමනාකාරිත්ව තනතුරු සඳහා පත් කිරීමට හෝ උසස් කිරීමට අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද වැනි කරුණු සම්බන්ධයෙන් වන නිර්ණායකයට අර්ථ දැක්වීම.

ඈ) අධ්‍යක්ෂ, ප්‍ර.වි.නි. ඉහළ කළමනාකරණ තනතුරුවලට පත්වන පුද්ගලයින් ශ්‍රී ලංකා මහ බැංකු නියමයන් හි සහ අදාළ ව්‍යවස්ථාවන් හි දැක්වෙන නියමයන් හි නිර්ණායකයේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහිත යෝග්‍ය පුද්ගලයින් බවට සහතික වීම.

ඉ) අවශ්‍ය අතිරේක / නව විශේෂඥතා දැනුම සහ විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ඉහළ කළමනාකාර පිරිස් වෙනුවෙන් අනුප්‍රාප්තික වැඩ පිළිවෙලවල් සම්බන්ධයෙන් කලින් කලට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.



**එස්.එන්. වික්‍රමසිංහ මිය,**
*සභාපති.*



**දර්ශනී ද සිල්වා මිය,**
*සමාගම් ලේකම්.*

## අය කර ගැනීම් පිළිබඳ උප කාරක සභාව

HDFC බැංකුවේ අත්පත් කර ගත් දේපළ අපහරණය සම්බන්ධයෙන් යෝග්‍ය තීරණ ගැනීමේ වගකීම කාරක සභාවට පැවරේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කාරක සභා සාමාජිකයින් ලෙස කටයුතු කරනු ලැබුවේ :-

එස්.එන්. වික්‍රමසිංහ මිය (කාරක සභා සභාපති, (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) කේ.ඩබ්.පී. දයාරත්න මිය (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) එස්.ඒ.ජේ. සමරවීර මයා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ) ඩබ්.ඩී.ආර්.ඩී. ගුණරත්න මයා (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

කේ.ඩබ්.පී. දයාරත්න මිය 2012.10.31 වන දින ඉල්ලා අස්වෙන ලදී.

කාරක සභාව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර, කාරක සභාවට පත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කෙරේ.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කාරක සභාවට රැස්වීම් වාර 05 පවත්වන ලදී. සාමාන්‍යාධිකාරී / ප්‍ර.වි.නි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) සහ සහකාර සාමාන්‍යාධිකාරී (අය කර ගැනීම්) ආරාධනාවන් මත මෙම රැස්වීම්වලට සහභාගී විය.



**එස්.එන්. වික්‍රමසිංහ මිය,**
සභාපති.



**දර්ශනී ද සිල්වා,**
සමාගම් ලේකම්.

## ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාරක සභාව

බැංකුවේ අවදානම් කළමනාකරණය උක්ත අධ්‍යක්ෂ මණ්ඩල උප කාරක සභාව හරහා ක්‍රමවත් පදනමකින් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් ක්‍රියාත්මක වන අතර, එය බලධාරී, අවදානම් නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අවදානම් දෙපාර්තමේන්තුව සහ අවදානම් අවදානම් කාරක සභාව හරහා බැංකුව ස්ථාපිත කොට ඇති අවදානම් කළමනාකරණ රාමුවට අමතර වශයෙන් ක්‍රියාත්මක වේ. සමාලෝචනයට භාජනය වූ වසර තුළ කාරක සභා සාමාජිකයින් ලෙස කටයුතු කළේ :- එස්.එන්. වික්‍රමසිංහ මිය - (කාරක සභා සභාපති, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) සී. විජයවර්ධන මිය - (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) එල්.ඊ. සුසන්ත සිල්වා - (විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ) කේ.ඩබ්.පී. දයාරත්න මිය - (විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ) එස්. දිසානායක මහතා - (වැ.බ. සාමාන්‍යාධිකාරී) ඩී.වී. පතිරණ මයා - (සහකාර සාමාන්‍යාධිකාරී) ඒ.ජේ. අතුකෝරාළ මහතා - (ප්‍රධාන අභ්‍යන්තර විගණක) ඩී.එම්.ඩී.එම්.කේ. දිසානායක මයා - (ප්‍රධාන කළමනාකරු, ණය) බාලසූරිය මයා - (ප්‍රධාන කළමනාකරු, භාණ්ඩාගාර) කේ.ආර්.එම්.කේ. බණ්ඩාර මහතා - (අනුගතවීම් නිලධාරී) අයි නිශාන්ත මහතා - (අවදානම් නිලධාරී)

උක්ත කාරක සභාව සඳහා පත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරන ලදී. 2012.10.31 වන දින කේ.ඩබ්.පී. දයාරත්න මිය ගේ ඉල්ලා අස්වීමත් සමඟ 2013 ජනවාරි මස පී.එල්.එස්. සේනාධීර මහතා පත් කරන ලදී.

සමාලෝචිත වසර තුළ කාරක සභා රැස්වීම් 04 පවත්වන ලදී.

බැංකුවේ පහත සඳහන් ප්‍රධාන අරමුණු සපුරාලීම සඳහා කාරක සභාව සැම විට ක්‍රියා කරයි.

අ) නිශ්චිත කාල පරාසයන් තුළ කාරක සභාවට ලැබෙන අදාළ අවදානම් පිළිබඳ දර්ශකයන් සහ කළමනාකරණ තොරතුරු ඔස්සේ, ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම පිළිබඳව සහය වේ.

ආ) සියලුම කළමනාකරණ මට්ටමේ කාරක සභාවල ප්‍රමාණාත්මකතාව සහ ඵලදායීතාවය විමර්ශනය කිරීම.

ඇ) කාරක සභාව විසින් තීරණය කර ඇති සැලකිලිමත් විය යුතු සීමාව ඉක්ම ගිය විශේෂිත අවදානම්වල බලපෑම අවම කර ගැනීමට නිසි නිවැරදි කිරීමේ පියවර ගැනීම.

ඈ) නිශ්චිත අවදානම හඳුනා ගැනීමට අසමත් වන ඒ සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව නිසි පියවර ගැනීම සහ කාරක සභාව විසින් නිර්දේශ කොට ඇති පරිදි සහ / හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නියම කොට ඇති නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීම.

ඉ) අනුගතවීමේ කාර්යය නිසි ලෙස ඉටු කරමින් නිශ්චිත කාල විරාමයන් තුළ කාරක සභාවට වාර්තා කිරීම සඳහා අනුගතවීමේ නිලධාරියකු පත් කිරීම මගින් සියලුම ව්‍යාපාරික මෙහෙයුම් ක්ෂේත්‍රවල බැංකුවේ අනුගතවීම සහතික වීම.

බැංකුවේ අවදානම් කළමනාකරණය පිළිබඳ යම් අඩුපාඩු පවතී ද යන්න සොයා බැලීම සඳහා නියාමන හෝ අධීක්ෂණ හෝ බැංකු අධීක්ෂණය විසින් පෙන්වා දී ඇති ශ්‍රී ලංකා මහ බැංකු නියමයන්ට අනුගතවීම සිදු වී නැති බව කාරක සභාව තහවුරු කොට දක්වා ඇති අතර, මුදල් මණ්ඩලය නියම කර ඇති පරිදි එය මහජනයාගේ දැන ගැනීම සඳහා එළිදරව් කොට එම අඩුපාඩු මඟ හරවා ගැනීමට ගනු ලැබූ පියවර ද ඉදිරිපත් කළ යුතු වේ.

**එස්.එන්. වික්‍රමසිංහ මිය,**
*සභාපති.*

**දර්ශනී ද සිල්වා,**
*සමාගම් ලේකම්.*

## මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

HDFC බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත සඳහන් ප්‍රකාශනයේ දැක්වෙන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් බාහිර විගණකවරුන්ගේ වගකීම වාර්ෂික වාර්තාවේ 138 සහ 139 පිටුවල දැක්වෙන විගණකවරුන්ගේ වාර්තාවේ දැක්වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් විසින් සෑම මුදල් වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට මහ සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු වේ. මූල්‍ය ප්‍රකාශනයන්ට 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, අවසන් වූ වසරේ මූල්‍ය ප්‍රවාහ සහ එහි සටහන් අන්තර්ගත වේ. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මගින් HDFC බැංකුවේ ක්‍රියාකාරකම් හා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ගෙන හැර පාන අතර, ශේෂ පත්‍ර දිනට අවසන් වූ මූල්‍ය වසරේ බැංකුවේ ලාභ සහ පාඩු පෙන්නුම් කරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අධ්‍යක්ෂවරුන් විසින් නිසි ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන යෝග්‍ය අයුරින් භාවිතා කරන බවටත්, යම් වැදගත් බැහැරවීම් වූයේ නම් ඒවා එළිදරව් කොට හේතු දක්වමින් තීරණ හා ඇස්තමේන්තු හේතු සහගතව හා විචක්ෂණශීලීව ගෙන ඇති බවටත්, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කොට ඇති බවත් සහතික විය යුතු වේ.

තවද මෙම මූල්‍ය ලේඛන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය සාධාරණීකරණය වන පරිදි බැංකුවේ මෙහෙයුම් අඛණ්ඩව ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික විය යුතු වේ. පිළියෙල කොට ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශන වැදගත් ගිණුම් පොත් හා සැසඳෙන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්, 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතීන් පිළිබඳ පනත, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන සහ කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත නීති වල දැක්වෙන නියමයන්ට අනුගත වේ.

අධ්‍යක්ෂවරුන් විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ ඵලදායී විස්තීරණ ක්‍රමයක් ද භාවිතා කොට ඇති අතර, එයට අභ්‍යන්තර පිරික්සුම, අභ්‍යන්තර විගණනය සහ බැංකුවේ ව්‍යාපාරික කටයුතු ක්‍රමවත්, වත්කම් ආරක්ෂා කරන, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා අනාවරණය කරන වාර්තාවල නිර්වද්‍යභාවය සහ විශ්වසනීයත්වය ප්‍රායෝගිකව උපරිම අයුරින් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පූර්ණ මූල්‍ය ක්‍රමයක් සහ අනෙකුත් පාලන ක්‍රමවලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බාහිර විගණකවරුන්ගේ ස්වාධීන විගණන මතය ප්‍රකාශ කිරීමට අවශ්‍ය හා අදාළ යැයි ඔවුන් සලකනු ලබන අභ්‍යන්තර පාලනය පිළිබඳ කවර හෝ නියැදි පිරික්සුම් සහ විමසුම් කටයුතු කරගෙන යෑමට අවශ්‍ය සෑම ඉඩකඩක් ම සලසා දෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට HDFC බැංකුවේ බාහිර විගණකවරුන්ට ඉදිරිපත් කළ යුතු වේ.

සියලුම නියාමන සහ ව්‍යවස්ථාපිත ආයතනවලට ශේෂ පත්‍ර දිනට අයවිය යුතු හා ගෙවිය යුතු සියලුම ගෙවීම් HDFC බැංකුව විසින් නිරවුල් කොට හෝ ඒ සඳහා මුදල් වෙන් කොට දී ඇති බවට අධ්‍යක්ෂවරුන් සිය දැනුම හා අවබෝධය අනුව සෑහීමකට පත් වේ.

මෙම ප්‍රකාශයේ දැක්වෙන වගකීම් අධ්‍යක්ෂවරු විසින් ඉටු කර ඇති බව ඔවුන් විශ්වාස කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



**එස්.එන්. වික්‍රමසිංහ මිය,**
*සභාපති.*

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No } එෆ්බී/එම්/එච්ඩීඑෆ්සී/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / No. }

දිනය / திகதி / Date } 2013 මැයි 09 දින

සභාපති,

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ 2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකු පනතේ 26 (2) වගන්තිය සහ 2003 අංක 15 දරන සංශෝධිත පනත සහ 2011 අංක 45 දරන සංශෝධිත පනත් ද සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 <u>මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி } 112887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 112887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පර්පාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පර්පාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පර්පාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යයන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2 <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>මතය</u>

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම</u>

1988 අංක 30 දරන බැංකු පනතට සහ එදිනට පසුකාලීන සංශෝධනයන් මගින් අවශ්‍ය කෙරෙන තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කරනු ලබයි.

2.3 <u>පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කෙරෙනු ඇත.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

# ආදායම් ප්‍රකාශනය

| සංඛ්‍යා ශ්‍රී.ල.රුපියල්වලින්<br>දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2012 | 2011 |
|---|---|---|---|
| ආදායම | | 2,691,396,936 | 2,385,602,199 |
| පොළී ආදායම | 1 | 2,634,758,527 | 2,260,965,957 |
| පොළී වියදම් | 2 | (1,805,319,955) | (1,354,293,472) |
| **ශුද්ධ පොළී ආදායම** | | 829,438,573 | 906,672,485 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 3 | 58,458,381 | 83,664,242 |
| ගාස්තු සහ කොමිස් වියදම | | - | - |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | | 58,458,381 | 83,664,242 |
| ශුද්ධ වෙළෙඳ ආදායම / (වියදම) | | - | - |
| මූල්‍ය ලේඛනවලින් ශුද්ධ ලැබීම්/(පාඩු) | | - | - |
| සාධාරණ අගයට ලාභලාභ ගිණුම හරහා පෙන්වූ | | - | - |
| මූල්‍ය ආයෝජන ශුද්ධ ලැබීම් / (පාඩු) | | - | - |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 4 | (1,819,973) | 40,972,000 |
| මුළු මෙහෙයුම් ආදායම | | 886,076,981 | 1,031,308,727 |
| ණය හා අනෙකුත් පාඩු සඳහා වූ හානිකරණය | 5 | 1,496,477 | 10,063,247 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | 884,580,504 | 1,021,245,480 |
| සේවක මණ්ඩල වියදම | 6 | 458,115,188 | 360,797,118 |
| අයෝජන වත්කම් ක්‍රමක්ෂය හා හානිකරණය | | - | - |
| වෙනත් වියදම් | 7 | 303,799,488 | 258,787,491 |
| **එකතු කළ අගය මත බද්දට පෙර මෙහෙයුම් ලාභ / (පාඩු)** | | 122,665,827 | 401,660,871 |
| අඩු කළා : මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද | 8 | 49,892,630 | 81,005,187 |
| **එකතු කළ අගය මත බද්දට පසු මෙහෙයුම් ලාභ / (පාඩු)** | | 72,773,197 | 320,655,684 |
| අනුබද්ධ සහ බද්ධ ව්‍යාපාරවල ලාභාංශ කොටස් | | - | - |
| බද්දට පෙර ලාභය / (පාඩු) | | 72,773,197 | 320,655,684 |
| මුළු වියදම | 9 | 70,321,030 | 104,636,709 |
| **වර්ෂයේ ලාභය / (පාඩු)** | | 2,452,167 | 216,018,975 |
| **ලාභ ප්‍රතිඵල :** | | | |
| කොටස්කරුවන් | | 2,452,167 | 216,018,975 |
| පාලනය කල නොහැකි ඇල්ම | | - | - |
| | | 2,452,167 | 216,018,975 |
| **ලාභයෙන් එක් කොටසක් සඳහා ඉපැයීම්** | | | |
| සාමාන්‍ය කොටස් ඉපැයීම් | | 0.04 | 3.34 |
| සාමාන්‍ය කොටසක් සඳහා හීන ඉපැයීම් | | - | - |

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2012 | 2011 |
|---|---|---|---|
| **වර්ෂයේ ලාභය** | | 2,452,167 | 216,018,975 |
| **වෙනත් විස්තීරන ආදායම් / (වියදම්)** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | | | |
| ප්‍රත්‍යාගණන සංචිතයේ දී වූ වෙනස්කම් (සාධාරණ වටිනාකම අදාළ ගන්නේ නම්) | | - | - |
| නියත ප්‍රතිලාභ සැලසුම් හා ඇතිවූ ආයුගණක ඉපයීම් හා අලාභ | | - | - |
| ලැබීම් සහ පාඩු (විදේශ මෙහෙයුමක මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීමෙන් පැන නඟින) | | | |
| අලෙවිය සඳහා ඇති දෑ යළි ගණන් බැලීම මත ලාභ සහ පාඩු | | | |
| මූල්‍ය වත්කම් | | - | - |
| මුදල් ප්‍රවාහ සුරැකුම් / වෙනත් මත ලාභ සහ පාඩු | | - | - |
| ආයෝජන දේපළ යළි තක්සේරු කිරීම මත ලැබීම් | | 53,081,000 | - |
| අඩුකළා: නෙකුත් විස්තීරණ ආදායම්වලට අදාළ බදු වියදම් / (ආදායම) | | - | - |
| **වර්ෂයේ අනෙකුත් විස්තීරන ආදායම, බද්දේ ශුද්ධ** | | 53,081,000 | - |
| **වර්ෂය තුළ මුළු විස්තීරන ආදායම** | | 55,533,167 | 216,018,975 |
| **ප්‍රතිඵලය :** | | | |
| කොටස්කරුවන් | | 55,533,167 | 216,018,975 |
| පාලනය කල නොහැකි ඇල්ම | | | |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| සංඛ්‍යා ශ්‍රී.ල.රු. දෙසැම්බර් 31 වන දිනට | සටහන | 2012 | 2011 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මහ බැංකුවේ ඇති මුදල් සහ ශේෂයන් | 11 | 107,856,602 | 91,605,426 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම් | 12 | 872,144,634 | 84,913,933 |
| බැංකුවේ ඇති ශේෂය | 13 | 411,219,276 | 436,471,254 |
| ණය සහ අනෙකුත් ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු | 14 | 15,965,668,211 | 14,887,525,122 |
| මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් රඳවා ගන්නා | 15 | 2,287,725,326 | 3,346,862,949 |
| දේපළ පිරියත සහ උපකරණ | 16 | 288,119,377 | 250,012,336 |
| ආයෝජන දේපළ | 17 | 738,677,165 | 692,547,709 |
| විලම්භිත බදු වත්කම් | 18 | 23,128,512 | 17,569,657 |
| අනෙකුත් වත්කම් | 19 | 106,067,546 | 119,665,294 |
| **මුළු වත්කම්** | | 20,800,606,649 | 19,927,173,679 |
| **වගකීම්** | | | |
| බැංකු හා අනෙකුත් ආයතනවලට ගෙවිය යුතු | 20 | 3,189,297,697 | 3,555,867,320 |
| වෙනත් ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 21 | 12,922,906,404 | 12,336,016,318 |
| වර්තන බදු බැරකම් | 22 | 61,881,876 | 45,573,143 |
| වෙනත් බැරකම් | 23 | 2,235,313,589 | 1,653,167,621 |
| **මුළු බැරකම්** | | 18,409,399,566 | 17,590,624,400 |
| **කොටස්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය / පැවරුම් ප්‍රාග්ධනය | 24 | 962,092,936 | 962,092,936 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 25 | 61,994,005 | 61,871,397 |
| රඳවාගත් ඉපැයීම් | 26 | 1,138,801,032 | 1,169,978,442 |
| අනෙකුත් සංචිත | 27 | 228,319,110 | 142,606,504 |
| මුළු කොටස්කරුවන් සතු කොටස් | | 2,391,207,083 | 2,336,549,279 |
| **පාලනය කල නොහැකි ඇල්ම** | | | |
| මුළු හිමිකම | | 2,391,207,083 | 2,336,549,279 |
| **මුළු කොටස් හා බැරකම්** | | 20,800,606,649 | 19,927,173,679 |
| අසම්භාව්‍ය බැරකම් හා බැඳීම් | | - | - |
| කොටසක් සඳහා පොත් වටිනාකම | | 36.95 | 36.11 |

පිටු අංක 143 සිට 157 දක්වා වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ආංශික කොටසක් බවට පත් වන අතර, මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුගතව පිළියෙල කොට ඇත.

**ඩී.වී. පතිරණ**
*ප්‍රධාන මූල්‍ය නිලධාරී*

**නිමල් ජේ.බී. මාමඩුව**
*ප්‍ර.වි.නි. / සාමාන්‍යාධිකාරී*

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට අත්සන් යොදා ඇත.

**එස්.එන්. වික්‍රමසිංහ මිය,**
*සභාපති.*

**සී. විජයවර්ධන මිය,**
*අධ්‍යක්ෂ*

2013 අප්‍රේල් 30 වන දින
කොළඹ දී.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| සංඛ්‍යා ශ්‍රී.ල. රුපියල් වලින් දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2012 | 2011 |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| පොළී ලැබීම් | | 2,512,109,154 | 2,254,935,569 |
| පොළී ගෙවීම් | | (1,286,202,145) | (1,054,218,343) |
| වෙනත් මෙහෙයුම්වලින් ලැබීම් | | 54,393,085 | 113,011,850 |
| සේවකයින්ට සහ සැපයුම්කරුවන්ට මුදලෙන් ගෙවීම් | | (513,865,159) | (423,404,161) |
| වෙනත් මෙහෙයුම් කටයුතු සඳහා ගෙවීම් | | (213,331,567) | (195,781,542) |
| මෙහෙයුම් වත්කම් වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | | 553,103,368 | 694,543,373 |
| **මෙහෙයුම් වත්කම්වල වැඩිවීම / (අඩුවීම):** | | | |
| ණුදෙනුකරුවන්ගෙන් අය කර ගත් මුදල් | | 2,705,212,439 | 2,676,093,783 |
| ණුදෙනුකරුවන්ට අත්තිකාරම් වශයෙන් ගෙවූ මුදල් | | (3,678,415,278) | (4,672,588,403) |
| අනෙකුත් වත්කම් | | 20,456,990 | (192,700,027) |
| | | (952,745,849) | (2,189,194,647) |
| **මෙහෙයුම් වගකීම්වල වැඩිවීම / (අඩුවීම)** | | | |
| ණුදෙනුකරුවන්ගේ තැන්පතු | | 586,890,086 | 3,809,682,607 |
| අනෙකුත් | | 31,642,908 | (42,941,518) |
| | | 618,532,994 | 3,766,741,089 |
| ආදායම් බද්දට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් | | 218,890,512 | 2,272,089,816 |
| ආදායම් බදු සහ ලාභාංශ මත බදු ගෙවීම් | | (42,323,040) | (84,535,283) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් උපයා ගත් ශුද්ධ මුදල් | | 176,567,472 | 2,187,554,533 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| ලැබූ ලාභාංශ | | 17,857 | 15,000 |
| ආයෝජන සුරැකුම් විකිණීම / (මිල දී ගැනීම) | | 1,060,429,214 | (1,060,429,214) |
| දේපළ, පිරිමිත සහ උපකරණ මිල දී ගැනීම | | (94,026,260) | (92,375,555) |
| දේපළ පිරිමිත සහ උපකරණ අපහරණය | | 3,102,830 | 50,535,077 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් | | 969,523,641 | (1,102,254,692) |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| කොටස් නිකුතුව / (නිදහස් කිරීම) | | - | - |
| කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය නිදහස් කිරීම | | - | - |
| ණය ආපසු ගෙවීම | | (1,973,151,227) | (1,479,553,229) |
| ණය ගැනීම්වලින් ලද මුදල | | 1,606,581,604 | 1,406,288,106 |
| ගෙවූ ලාභාංශ | | - | (32,320,460) |
| මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් | | (366,569,624) | (105,585,583) |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | | 779,521,489 | 979,714,258 |
| කාල පරිච්ඡේදය ආරම්භය වන විට මුදල් හා මුදල් සමාන දෑ | | 2,899,393,749 | 1,919,679,491 |
| කාල පරිච්ඡේදය අවසනට මුදල් හා මුදල් සමාන දෑ | | 3,678,915,238 | 2,899,393,749 |
| **මුදල් හා මුදල් සමාන දෑ වල සැසඳුම** | | | |
| මුදල් හා කෙටි කාලීන අරමුදල් | | 201,373,664 | 199,097,283 |
| ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් බැඳුම්කර / බැංකුවල තැන්පත් කිරීම් | | 3,477,541,573 | 2,700,296,466 |
| | | 3,678,915,238 | 2,899,393,749 |

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| සංඛ්‍යා ශ්‍රී.ල. රුපියල්වලින් "000" | ඡන්ද හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිතය | ව්‍යවස්ථාපිත සංචිතය අරමුදල | විශේෂ සංචිතය | ආයෝජන අරමුදල | රඳවා ගත් ඉපැයීම් | එකතුව | පාලනය කල නොහැකි ඇල්ම | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011.01.01 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 19,179 | 35,890 | 46,389 | 3,451 | | 781,661 | 1,848,663 | | 1,848,663 |
| 2011 ජනවාරි 1 දිනට ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. යොදා ගැනීමෙන් වූ බලපෑම් | | | | | | | | 305,098 | 305,098 | | 305,098 |
| **2011.01.01 දිනට ප්‍රති ප්‍රකාශිත ශේෂය** | | 962,093 | 19,179 | 35,890 | 46,389 | 3,451 | | 1,086,759 | 2,153,761 | | 2,153,761 |
| වසරේ මුළු ආදායම | | | | | | | | | | | |
| වසරේ ලාභය / (පාඩු) | | | | | | | | 216,019 | 216,019 | | 216,019 |
| අනෙකුත් විස්තීරණ ආදායම් (බද්දේ ශුද්ධ) | | | | | | | | | | | |
| **වසරේ විස්තීරණ ආදායම** | | | | | | | | 216,019 | 216,019 | | 216,019 |
| කොටස් හා සෘජුවම හඳුනා ගත් කොටස් හිමියන් සමඟ ගණුදෙනු | | | | | | | | | | | |
| කොටස් නිකුතුව / පැවරුම් ප්‍රාග්ධනයේ වැඩිවීම | | | | | | | | | | | |
| ප්‍රසාද කොටස් නිකුතුව | | | | | | | | | | | |
| හිමිකම් නිකුතුව | | | | | | | | | | | |
| කාල පරිච්ඡේදය තුළ සංචිතවලට මාරු කිරීම | | | 30,965 | | 15,483 | | 53,997 | -100,445 | | | |
| ගෙවූ ලාභාංශ | | | | | | | | -32,355 | -32,355 | | -32,355 |
| මූලස්ථානයට මාරු කළ ලාභය | | | | | | | | | | | |
| දේපළ පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම මත ලැබීම් / (පාඩු) (පිරිවැය ක්‍රමය භාවිතා කළේ නම්) | | | | -875 | | | | | -875 | | -875 |
| අනෙකුත් | | | | | | | | | | | |
| කොටස් හිමියන් සමඟ වූ මුළු ගණුදෙනු | | | 30,965 | -875 | 15,483 | | 53,997 | -132,800 | -33,230 | | -33,230 |
| **2011.12.31 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 50,144 | 35,014 | 61,871 | 3,451 | 53,997 | 1,169,978 | 2,336,549 | | 2,336,549 |

| සංඛ්‍යා ශ්‍රී.ල. රුපියල්වලින් "000" | ඡන්ද හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිතය | ව්‍යවස්ථාපිත සංචිතය අරමුදල | විශේෂ සංචිතය | ආයෝජන අරමුදල | රඳවා ගත් ඉපැයීම් | එකතුව | පාලනය කල නොහැකි ඇල්ම | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2012.01.01 ශේෂය | 64,710,520 | 962,093 | 50,144 | 35,014 | 61,871 | 3,451 | 53,997 | 1,169,978 | 2,336,549 | | 2,336,549 |
| වසරේ මුළු විස්තීරණ ආදායම | | | | | | | | | | | |
| වසරේ ලාභ / (පාඩු) | | | | | | | | 2,452 | 2,452 | | 2,452 |
| අනෙකුත් විස්තීරණ ආදායම් (බද්දේ ශුද්ධ) | | | | 53,081 | | | | | 53,081 | | 53,081 |
| **වසරේ මුළු විස්තීරණ ආදායම** | | 962,093 | 50,144 | 88,095 | 61,871 | 3,451 | 53,997 | 1,172,431 | 2,392,082 | | 2,392,082 |
| කොටස් හා සෘජුව හඳුනා ගත් කොටස් හිමියන් සමඟ ගණුදෙනු | | | | | | | | | | | |
| කොටස් නිකුතුව / පැවරුම් ප්‍රාග්ධනය වැඩිවීම | | | | | | | | | | | |
| ප්‍රසාද කොටස් නිකුතුව | | | | | | | | | | | |
| හිමිකම් නිකුතුව | | | | | | | | | | | |
| කාල පරිච්ඡේදය තුළ සංචිතවලට මාරු කිරීම් | | | 245 | | 123 | | 33,262 | -33,630 | | | |
| ගෙවූ ලාභාංශ | | | | | | | | | | | |
| මූලස්ථානයට මාරු කළ ලාභය | | | | | | | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ පත්‍යාගණනය කිරීම මත ලැබීම් / (පාඩු) (පිරිවැය ක්‍රමය භාවිතා කළේ නම්) | | | | -875 | | | | | -875 | | -875 |
| අනෙකුත් | | | | | | | | | | | |
| **කොටස් හිමියන් සමඟ වූ මුළු ගණුදෙනු** | | | 245 | -875 | 123 | | 33,262 | -33,630 | -875 | | -875 |
| **2012.12.31 දිනට ශේෂය** | 64,710,520 | 962,093 | 50,390 | 87,220 | 61,994 | 3,451 | 87,259 | 1,138,801 | 2,391,207 | | 2,391,207 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## සාංගමික තොරතුරු

### 1. වාර්තාකරණ අස්තිත්වය

1956 ජාතික නිවාස පනතේ 11 වගන්තිය යටතේ 1984 වර්ෂයේ දී HDFC බැංකුව ඉදි කිරීම් සංගමයක් ලෙස ස්ථාපිත කරන ලදී. ඉනික්බිතිව 1997 අංක 07 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ සංස්ථාවක් බවට පරිවර්තනය වී 2003 අංක 15 දරණ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනත හා 2011 අංක 45 දරණ සංශෝධිත පනත යටතේ විශේෂිත බැංකුවක නෛතික උරුමය හිමි කර ගන්නා ලදී. එමගින් 1980 අංක 30 දරණ බැංකු පනත හා පසුව එක් වූ සංශෝධන යටතේ IV උපලේඛනයේ දැක්වෙන සියලුම ක්‍රියාකාරකම්වල නිරතවීමට බැංකුවට බලය පැවරුණි. HDFC බැංකුවේ මූලස්ථාන කාර්යාලය ජා.නි.ස.අ. ලේකම් කාර්යාලය, කොළඹ 02, ශ්‍රී ලංකා යන ලිපිනයේ ස්ථානගතව ඇත.

### 2. මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වසර තුළ HDFC බැංකුවේ මූලික ව්‍යාපාරික ක්‍රියාකාරකම වූයේ නිවාස කාර්යයන්ට අදාළව ණය සහ අනෙකුත් ස්වභාවයේ මූල්‍ය සහය ලබාදීම වේ.

### 3. පිළියෙල කිරීමේ පදනම

#### 3.1 අනුගත වීමේ ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිරන්තරයෙන්ම ඓතිහාසික පිරිවැය පදනම සහ සාධාරණ වටිනාකම් ගිණුම් ක්‍රමය අවස්ථාවෝචිත පරිදි යොදා ගනිමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතන නියම කොට ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පිහිටා පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කොට ඇත්තේ ශ්‍රී.ල.රුපියල්වලිනි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් 2012 ජනවාරි මස සිට සියලුම විශේෂිත ව්‍යාපාරික ව්‍යවසායකත්වයන්ට අනිවාර්ය කොට පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) මෙම ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලදී. ඉහත ප්‍රමිතීන්ට අනුව තුලනාත්මක සංඛ්‍යා නැවත සඳහන් කොට ඇත.

#### ආසන්න පූර්ණ සංඛ්‍යාවට රැගෙන ඒම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අංක 01 යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවසර දී ඇති ලෙස දක්වා නැති විට හැර මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා ආසන්න රුපියල යටතේ සඳහන් කොට ඇත.

#### ගිණුම් ව්‍යුහය සහ පෙර වසරේ සංඛ්‍යා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දිෂ්ට ගිණුම්කරණ ව්‍යුහයට අනුගතව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන අතර, "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අංක 01" යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවසර දී ඇති පෙර මූල්‍ය වසර ගිණුම් සමඟ බැංකුව විසින් භාවිතා කළ ගිණුම් ප්‍රතිපත්ති අනුරූපී වේ. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය වූ විට සංසන්දනාත්මක සංඛ්‍යා වඩා යහපත් ඉදිරිපත් කිරීමක් සඳහා පවත්නා වසර සමඟ අනුගතවීමට යළි වර්ගීකරණය කරනු ලැබේ.

### 4. වත්කම් තක්සේරුව

#### 4.1 ගණුදෙනුකරුවන් සඳහා වන ණය සහ අත්තිකාරම්

ගණුදෙනුකරුවන් සඳහා වන ණය සහ අත්තිකාරම් ශේෂ පත්‍රයේ සිදුවීමට ඉඩ ඇති ණය පාඩු සඳහා ශුද්ධ හානිකරණය යටතේ දක්වා ඇත.

#### 4.2 හානිකරණය සඳහා ප්‍රතිපාදන

සිදුවිය හැකි හානිකරණය සඳහා "මූල්‍ය ලේඛන : හඳුනා ගැනීම හා ගණනය කිරීම" යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 ට අනුගතව සියලුම ගණුදෙනුකරුවන් සඳහා වන ණය සහ අත්තිකාරම් අඛණ්ඩව විමසුමට ලක් කිරීමේ පදනම මත පිළියෙල කොට බැංකුවේ ගිණුම් ප්‍රකාශනවලට ඇතුළත් කෙරේ. අවශ්‍ය ණයවල සාධාරණ වටිනාකම ගණනය කිරීම සඳහා පහත සඳහන් තක්සේරු ශිල්ප ක්‍රමය භාවිතා කරන ලදී.

1. සාමූහික හානිකරණය
2. කේවල හානිකරණය

##### *4.2.1 සමූහ හානිකරණය*

සිදුවිය හැකි ණය පාඩු සඳහා සමූහ හානිකරණය සම්පාදනය කරනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 "මූල්‍ය ලේඛන : හඳුනා ගැනීම හා ගණනය කිරීම" යටතේ නියමයන්ට අනුගතව වන අතර, එය බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කෙරේ. සැකසීමට බැංකුව පුරුදු වී සිටී.

##### *උකස් හා ඇපකර ණය*

පැහැර හැරීමේ පෙරලෙන අනුපාතය සැලකිය යුතු කාලයකට යොදා ගනු ලබන අතර, ශූන්‍ය පැහැර හරින්නන් සඳහා ප්‍රතිපාදන සම්පාදනය නොකරයි.

### මුදල් ආන්තික ණය

මුදල් තැන්පතු ශේෂ මත අනුමත කරනු ලබන ණය සඳහා විශේෂ ප්‍රතිපාදන සම්පාදනය නොකරනුයේ බැංකුවේ අභිමතය පරිදි ඕනෑම වේලාවක පැහැර හරින ලද මුදල් පාදක ණය ආපසු අය කර ගත හැකි බැවිනි.

### සේ.අ.අ.ණය

සමූහ හානි ක්‍රමය සේ.අ.අ. පාදක ණය සඳහා යොදා ගන්නා අතර, ශූන්‍ය පැහැර හරින්නන් සඳහා ප්‍රතිපාදන සලසාදීමක් සිදු නොකරයි. මාස 18 දක්වා හිඟ මුදල් සම්බන්ධයෙන් බැංකුව 0 - 3 පරාසයට අදාළ පෙරලෙන අනුපාතය යොදා ගනී. පැහැර හැරීම් කාණ්ඩය මාස 18 ට වැඩි නම් නියමිත කාණ්ඩයට අදාළ පෙරලෙන අනුපාතය යොදා ගනී.

### විකිණීම සඳහා ඇති අත්පත් කර ගත් දේපළ

HDFC බැංකුවට උකස් කළ දේපළ ගණුදෙනුකරු සැලකිය යුතු කාලයක් පුරාවට ගෙවීම් පැහැර හැරිය විට වෙන්දේසියේ අලෙවි කෙරේ. එවැනි වෙන්දේසිවල දී අපහරණය නොවූ දේපළ අත්පත් කර ගත් දේපළ ලෙස නම් කොට ණය හා අත්තිකාරම් යටතේ ඉදිරිපත් කරයි.

එවැනි දේපළ තක්සේරු කිරීම පහත පරිදි වේ.

- මුදල් ප්‍රවාහය සාධාරණ සහතිකයකින් ඉදිරිය පිළිබඳව පල කරන්නේ නම් කේවල හානි ගණනය කරනු ලබයි.
- මුදල් ප්‍රවාහය පිළිබඳ සාධාරණ සහතිකයක් නොමැති විට දේපළ අත්පත් කර ගැනීම මත වන ණය සඳහා 100% හානි ගණනය කරයි.

### ව්‍යාපෘති ණය

ශූන්‍ය පැහැර හරින්නන් සහ ගණ පුද්ගල ණය සඳහා හානි ප්‍රතිපාදන සලසා දෙනු නොලබයි. මුදල් ආපසු අය කර ගැනීම සඳහා සාධාරණ සහතිකයක් සහිත පැහැර හැර ඇති ණය වෙනුවෙන් හානි ප්‍රතිපාදන කරයි.

### *4.2.3 භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර*

භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජනයන් ලැබිය යුතු පිරිවැය සහ පොළිය යටතේ සටහන් කොට ඇත.

### *4.2 දේපළ, පිරිමිත, උපකරණ*

වත්කම් ඒවායේ ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා හෝ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 දැක්වෙන පරිදි වසර 3 වඩා පැරණි නොවන අලුත්ම තක්සේරු වාර්තාව භාවිතා කරමින් සාධාරණ වටිනාකම ගණනය කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් වියදම් හා පිරිවැය යටතේ මේවා මුල දී වාර්තා කරයි.

### *4.3.1 හඳුනාගැනීමේ පදනම*

දේපළ, පිරිමිත හා උපකරණ මගින් බැංකුවට ඉදිරියේ දී ආර්ථික වාසි ලැබීමට ඉඩකඩ ඇති වීම සහ වත්කම්වල පිරිවැය සාධාරණ ලෙස ගණනය කළ හැකි විට ඒවා පිළිගනී.

### *4.3.2 ගණනය කිරීමේ පදනම*

ස්ථාවර තැන්පතු වාර්තා කරනුයේ පිරිවැය හෝ වත්කම් ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට වැය වන මුදල ඇතුළු තක්සේරුව මතය. පහත (ආ) හි නිශ්චිතව දක්වා ඇති පදනම මත දේපළ සහ උපකරණ, ඒකරාශී ක්ෂය අඩු කළ පිරිවැය යටතේ සටහන් කරයි. සමාලෝචනයට භාජනය වූ වසර තුළ කිසිදු අලුත් තක්සේරුවක් කැඳවා නැත.

විවිධ වර්ගවල වත්කම් හි ඇස්තමේන්තුගත ජීව කාලය පුරාවට සරල රේඛීය පදනම මත පහත සඳහන් අනුපාත යටතේ ක්ෂයවීම් සලකා බලයි.

| වත්කම් වර්ගය | වසරකට % |
|---|---|
| ගොඩනැගිලි | 62/3 |
| කාර්යාල උපකරණ | 12.50 |
| ගෘහ භාණ්ඩ හා සවිකුරු | 10.00 |
| මෝටර් රථ හා යතුරු පැදි | 20.00 |
| පිරිමිත හා යන්ත්‍රෝපකරණ | 25.00 |
| උපකරණ හා මෙවලම් | 12.50 |
| පරිගණක උපකරණ හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | 12.50 |
| පරිගණක මෘදුකාංග - විදේශ | 25.00 |
| පරිගණක මෘදුකාංග - දේශීය | 25.00 |

වසර තුළ දී මිල දී ගෙන වසරේ දී භාවිතා කළ වත්කම් සඳහා ක්ෂයවීම සිදුකර ඇති අතර සහ වර්ෂය තුල විකුණූ වත්කම් සඳහා සඳහා ක්ෂයවීම් සලසා නැත. ඉඩම් සඳහා වැඩිදුර ක්ෂයවීම් සලසා නැත.

## 05. ආයෝජන දේපළ

ආයෝජන දේපළ සටහන් කොට ඇත්තේ පවත්නා වෙළෙඳපොළ වටිනාකම මත වන අතර, ඉදිරියට ගෙන යන වටිනාකම සහ වෙළෙඳපොළ වටිනාකම අතර වෙනස අනෙකුත් විස්තීරණ ආදායම යටතේ ඉදිරිපත් කරයි.

## 06. වගකීම් හා ප්‍රතිපාදන

### 6.1 අනෙකුත් ගණුදෙනුකරුවන්ට අයවිය යුතු

පොළී දරන තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, කාල තැන්පතු, ඉල්ලූ විට ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු සහතික මෙයට ඇතුළත් වේ. ඒවා ගෙවිය යුතු මුදල් යටතේ ශේෂ පත්‍රයේ සටහන් කරයි. මෙම තැන්පතු මත ගෙවන ලද / ගෙවිය යුතු පොළිය ආදායම් ප්‍රකාශනයේ සටහන් කොට අනෙකුත් වගකීම් යටතේ ඉදිරිපත් කරයි.

### 6.2 ණය ගැනීම්
ණය ගැනීම් යටතට ප්‍රති මූල්‍ය ණය ගැනීම්, ඇරයුම් ණය ගැනීම් හා මූල්‍ය ආයතනවලින් ණය ගැනීම් ඇතුළත් වන අතර, ඒවා හිඟ ශේෂයේ දළ වටිනාකම යටතේ පෙන්නුම් කරයි. තවද ඒවා ගෙවිය යුතු මුදල් යටතේ ශේෂ පත්‍රයේ ද සටහන් කරයි. මෙම ණය ගැනීම් මත ගෙවන ලද / ගෙවිය යුතු පොළිය වාරික ගෙවීමේ පිරිවැය ක්‍රමය භාවිතා කරමින් ආදායම් ප්‍රකාශනයේ වාර්තා කරන අතර, අනෙකුත් වගකීම් යටතේ ඉදිරිපත් කෙරේ.

### 6.3 පාරිතෝෂිත
සේවකයකු බැංකුවට පත්වීම් ලද දින සිට 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂිත සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා ඇත. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනෙකුත් වගකීම් යටතේ වර්ග කොට දක්වයි. HDFC බැංකුවේ කාර්ය මණ්ඩලයේ වසර 15 කට අධික කාලයක් සේවය කොට ඇති විශේෂ සේවකයින් සඳහා ලංකා බැංකු සේවක සංගමය හා ඇති කර ගත් සාමූහික ගිවිසුම යටතේ විශේෂ පාරිතෝෂිත ප්‍රතිපාදන තත්ව පදනම මත සපයා දී ඇත.

### 6.4 සේවක අර්ථ සාධක අරමුදල
සේවක භාර අරමුදල් මණ්ඩලය කළමනාකරණය කරනු ලබන සේවක භාර අරමුදල සඳහා එක් එක් සේවකයාගේ වැටුපෙන් සියයට 3 ක ප්‍රතිශතයක් බැංකුව විසින් දායක කර දෙනු ලැබේ.

### 6.6 අනෙකුත් වගකීම්
අනෙකුත් වගකීම් යටතට වැටෙනුයේ පොළී, ගාස්තු, වියදම් පාරිතෝෂිත / විශ්‍රාම සඳහා ගෙවිය යුතු මුදල් සහ අනෙකුත් ප්‍රතිපාදන වේ. මෙම වගකීම් සටහන් කරනුයේ මූල්‍ය තත්ත්ව දිනට ගෙවිය යුතු මුදල යටතේය.

## 7. හඳුනාගත් ආදායම
### 7.1 ණය හා අත්තිකාරම් මත පොළී ආදායම
පොළී ආදායම හඳුනා ගනුයේ ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් සියලුම ණය සඳහා වන උපචිත පදනම මත ය.

### 7.2 හිඟව පවතින පොළී ආදායම
ණය වාරික ගෙවීම මත හිඟව පවතින පොළිය සේ.අ.අ.ණය හැර සෙසු ණය සඳහා මුදල් පදනම මත හඳුනා ගනී.

### 7.3 රජයේ සුරැකුම්පත් හා ආයෝජන මත ආදායම
ඵලදායී පොළී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ආයෝජන කාලය තුළ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම් / වාරික ගෙවීම සිදු වේ.

### 7.4 අනෙකුත් ආදායම්
කොමිස් ආදායම උපචිත පදනම මත හඳුනා ගන්නා අතර, අනෙකුත් ආදායම් මුදල් පදනම මත හඳුනා ගනී.

## 8. වියදම්
### 8.1 තැන්පතු, ණය ගැනීම් මත පොළිය
"මූල්‍ය ලේඛන : හඳුනා ගැනීම හා ගණනය" යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 දැක්වෙන විධිවිධාන ප්‍රකාරව තැන්පතු සහ ණය ගැනීම් මත පොළිය, ඵලදායී පොළී අනුපාත ක්‍රමය යටතේ හඳුනා ගන්නා අතර, ආදායම් ප්‍රකාශනයේ වාර්තා කරයි.

### 8.2 වෙනත් වියදම්
මෙහෙයුම්වලින් සහ දේපළ, පිරිමිත හා උපකරණ ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා දරණ සියලුම වියදම් වර්ෂය ලාභ හා පාඩු යටතේ සලකා බලා උපචිත පදනම යටතේ හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරයි.

## 9. බදුකරණය
ආදායම් බදු වියදම වර්ෂයේ බද්දේ ශුද්ධයෙන් සහ විලම්භිත බද්දෙන් සමන්විත වේ. සෘජුවම හිමිකම ලෙස හඳුනාගත් අයිතම හා බැඳී පවතින විට හැර ආදායම් බද්ද, ආදායම් ප්‍රකාශනයේ වාර්තා කරන අතර, සෙසු අවස්ථාවල දී එය කොටස් යටතේ හඳුනා ගනී.

### 9.1 පවත්නා බදු
අය කර ගැනීමට නියමිත මුදල් හෝ පවත්නා වර්ෂය මෙන්ම පූර්ව වර්ෂය සඳහා බදු අධිකාරියට ගෙවන ලද මුදල්වලින් වත්මන් බදු වත්කම හා වගකීම සමන්විත වේ. බදු ගණනය සඳහා යොදා ගත් බදු අනුපාත සහ බදු නීතිය වනුයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට ව්‍යවස්ථාපිත නීතියයි. 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ ඉනික්බිති සංශෝධනවල විධිවිධාන ප්‍රකාරව බදු කාර්යය සඳහා ගලපන ලද වසරේ ලාභය පදනම් කරගෙන බදු ප්‍රතිපාදන සම්පාදනය කරන ලද අතර, බදු වියදම්වල වැදගත් අන්තර්ගතයන් සඵල බදු අනුපාතය සහ "ආදායම් බදු" ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 දැක්වෙන නියමයන් පරිදි බදු වියදම හා බද්දට පෙර ලාභය සැසඳීම සටහන්වල ඇතුළත් වේ.

### 9.2 විලම්භිත බදු
විලම්භිත බදු සලසා ඇත්තේ වගකීම් ක්‍රමය යටතේ ය.
මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අවස්ථාවක දී හැර වෙනත් අවස්ථාවකදී ආදායම් බදු කාර්යය සඳහා අයිතමයන්ට ඉඩ දී ඇති විට සිදුවන කාල වෙනස මත බදු බලපෑම, පවත්නා බදු අනුපාත යටතේ විලම්භිත බදු ප්‍රතිපාදනයට ඇතුළත් කෙරේ.

### 9.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද

මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ගණනය කිරීමේ දී පාදක කර ගනුයේ, සේවකයින්ට පාරිශ්‍රමිකයන් ගෙවීමට පෙර ගිණුම්ගත ලාභය සහ නිර්දිෂ්ට අනුපාත යටතේ ගණනය කළ ක්ෂයවීම් සඳහා ගැලපූ ආදායම් බද්ද වේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී තිබූ එ.අ.බ. මුදල මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කොට ඇත.

### 10. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන ලද්දේ "මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන" ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 දැක්වෙන නියමයන්ට අනුගතව "සෘජු ක්‍රමය" අනුගමනය කරමින්ය. එමගින් දළ මුදල් ලැබීම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්, ආයෝජන ක්‍රියාකාරකම් හා මූල්‍ය ක්‍රියාකාරකම් මත දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත. මුදල් හා මුදල් සමාන දෑ, කෙටිකාලීන, පිළිගත් මුදල්වලට ඉක්මනින් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීමේ නොවැදගත් අවදානම සහිත ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් ආයෝජන සමන්විත වේ.

### 11. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

ශ්‍රී ලංකා මහ බැංකු නියමය ප්‍රකාරව සියලුම බෙදා දීම් වලට ප්‍රථම බද්දට පසු ශුද්ධ ලාභයෙන් 5% ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කළ යුතු වේ.

#### පොදු සංචිත අරමුදල

HDFC පනතේ විධිවිධාන ප්‍රකාරව සියලුම බෙදාදීම්වලට ප්‍රථම බද්දට පසු ශුද්ධ ලාභයෙන් 10% පොදු සංචිතයට මාරු කළ යුතු වේ.

### 12. සාමාන්‍ය කොටස් මත ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ වගකීමක් ලෙස හඳුනා ගන්නා අතර, වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමත වීමෙන් පසුව හිමිකමෙන් අඩු කෙරේ. වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස්කරුවන් විසින් අනුමත කරනු ලැබීම සඳහා ශේෂ පත්‍ර දිනට පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද වර්ෂයේ සාමාන්‍ය කොටස් මත ලාභාංශ මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව එළිදරව් කොට ඇත.

### 13. කොටසක් සඳහා ඉපැයීම්

කාල පරිච්ඡේදය තුළ හිඟව පැවති සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ බර තබන ලද සාමාන්‍ය මගින් සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ ලාභය හෝ පාඩුව බෙදීම මගින් මූලික කොටසක් සඳහා ඉපැයීම ගණනය කරයි. වටිනාකම අඩු වූ කොටසක් සඳහා ඉපැයීම වටිනාකම අඩු වූ ඉදිරි සාමාන්‍ය කොටස්වල වන බලපෑම ගැලපීම වෙනුවෙන් හිඟ සාමාන්‍ය කොටස්වල සංඛ්‍යාවේ බර තබන ලද සාමාන්‍ය මගින් සාමාන්‍ය කොටස්කරුවකුට අදාළ ලාභය හෝ පාඩුව බෙදීමෙන් ගණනය කරනු ලබයි.

### 14. තොග තක්සේරුව

ඉක්මනින් ක්ෂය වන තොග පිරිවැය යටතේ සටහන් කොට ඇති අතර, ඉන්වෙන්ටරි අයිතම නිකුත් කිරීමේ දී ප්‍රථමයාට ප්‍රථමයෙන් (FLFO) ක්‍රමය භාවිතා කෙරේ.

# මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධ සටහන්

| ශ්‍රී.ල.රු. | 2012 | 2011 |
|---|---|---|
| **01 පොළී ආදායම** | | |
| පොලී ආදායම | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 13,190,178 | 71,535,632 |
| බැංකුව සතු ශේෂය | - | - |
| ඉපැයීම් | - | - |
| අලෙවිය සඳහා රඳවා ගෙන ඇති මූල්‍ය වත්කම් | - | - |
| සාධාරණ වටිනාකම හරහා නම් කොට ඇති මූල්‍ය වත්කම් | - | - |
| ලාභ සහ පාඩු | - | - |
| ණය සහ බැංකුවට ලැබීම් | - | - |
| ණය සහ අනෙකුත් ගණුදෙනුකරුවන් සඳහා ලැබීම් | 2,277,680,253 | 2,055,390,073 |
| කල් පිරීම දක්වා රඳවාගෙන ඇති මූල්‍ය ආයෝජන | 343,888,096 | 134,040,252 |
| අලෙවිය සඳහා ඇති මූල්‍ය ආයෝජන | - | - |
| අනෙකුත් | - | - |
| මුළු පොළී ආදායම | 2,634,758,527 | 2,260,965,957 |

| ශ්‍රී.ල.රු. | 2012 | 2011 |
|---|---|---|
| **02. පොළී වියදම** | | |
| බැංකුවට අයවිය යුතු | 124,159,138 | 30,568,901 |
| ඉපැයීම් | - | - |
| ලාභය හෝ පාඩු හරහා සාධාරණ වටිනාකම යටතේ වන මූල්‍ය වගකීම් | - | - |
| අනෙකුත් ගණුදෙනුකරුවන්ට අයවිය යුතු | 1,561,107,148 | 1,085,351,720 |
| නිකුත් කළ ණය සුරැකුම් | - | - |
| වෙනත් ණය ගැනීම් | 120,053,669 | 238,372,851 |
| මුළු පොළී වියදම් | 1,805,319,955 | 1,354,293,472 |
| | | |
| ශුද්ධ පොළී ආදායම | 829,438,573 | 906,672,485 |

| | | බැංකුව |
|---|---|---|
| ශ්‍රී.ල.රු. | 2012 | 2011 |
| **03. ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | | |
| ගාස්තු සහ කොමිස් ආදායම | 58,458,381 | 83,664,242 |
| ගාස්තු සහ කොමිස් වියදම | - | - |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 58,458,381 | 83,664,242 |
| ණයවලින් සැදුම්ලත් | 48,341,506 | 66,197,736 |
| වෙළෙඳ හා ප්‍රේෂණයන් | - | - |
| ආයෝජන බැංකුකරණය | - | - |
